

# කච්චායන නාමික රූපමාලා

## ආඛ්‍යාත රූපමාලා



සොධිතපටිසංඛතා

# කච්චායන නාමික රූපමාලා

පුබ්බඞ්ගමා

# ආඛ්‍යාත රූපමාලා

---

විජ්ජාලඞ්කාර පරිවෙණාධිපතිනා තිපිටකවාගීස්සරාචරිය
උපජ්ඣායධුරන්ධරෙන

## ධම්මකිත්තිස්සිරි ධම්මාරාමාභිධානෙන

ලඞ්කායං
පච්ඡිමදිසානුදිසාසු පධානසඞ්ඝනායකත්ථෙරවරෙන
විරචිතානි
තාසං වණ්ණනාහි සහිතා.

---

වතුත්වාරෙ විජ්ජාලඞ්කාරයන්තගෙහෙ
මුද්දාපිතා.

---

සිරිසුගතවස්සෙ නයනද්වාරසින්ධුලොචනෙහි

2492

# විඤ්ඤත්ති.

සන්තිපදපරමත්ථං තන්තිභාසාපාසාදවරමාරොහනත්ථං පඨමක
නිස්සෙණීපදරූපා නාමිකරූපමාලා චෙව දුතියකනිස්සෙණීපද
රූපා ආඛ්‍යාතරූපමාලා ච යෙභුය්‍යෙන බාලාවතාරගන්ථවරානු
සාරිනියො සද්දනුසාසකෙහි සාදරමජ්ඣාපීයන්ති සකලෙහෙව
තම්බපණ්ණියෙහි. අබ්භතීතා කිර ගරුනො ඉතො'තිවිජිණ්ණා
මහාරූපසිද්ධිපදසාධනගන්ථානුගා රූපමාලායො විජ්ජපිගණ
මජ්ඣාපයිංසු. අපරභාගෙ පන ගන්ථධාරණසුඛමපෙක්ඛන්තෙහි
එතායෙව අච්චන්තං පාඨොපයොගිනියො සම්භාවීයන්ති.
ඉමිස්සාච නාමිකරූපමාලායං සද්දමාලාරචනාදයො යෙභුය්‍යෙන
තායෙව චිරන්තනාහි රූපමාලාහි සමුද්ධටාති විඤ්ඤායතෙ.
චිරසම්භාවිතාපි චෙතා කාලන්තරියගම්පපමාදසංකුලා පුනප්පුනං
මුද්දාපයන්තෙහි ච න සුවිසොධිතා දූසනපපාඨාව දිස්සන්තෙති
මඤ්ඤන්තානං කෙසඤ්චි සිස්සානමජ්ඣෙසනං පටිච්ච විජ්ජා
ලඞ්කාරපරිවෙණාධිපතිනා ගණාචරියෙන සිරිධම්මාරාමයතිස්ස
රෙන ලඞ්කායං පච්ඡිමදිසානුදිසාසු සඞ්ඝනායකධුරන්ධරෙන යථා
විධි පටිසංඛතා චෙව සුවිසොධිතා ච අහෙසුං. තාසඤ්ච ඛො පන
හත්ථලිඛිතානං දුල්ලභත්තමපෙක්ඛිය මුද්දාපයිතුමිච්ඡන්තො ආර්. ජ්.
පෙරෙරාභිධානස්ස සොගතස්සජ්ඣෙසනං පටිච්ච විවිධවිචිත්ත
සද්දසත්ථනයසමුජ්ජලමාඛ්‍යාතරූපමාලාවිවරණඤ්ච තෙනෙව
යතිස්සරෙන සීහලාය නිරුත්තියා විරචිතං. ආසිට්ඨං ඛො
පනෙතමභිනවසංවණ්ණනාසනාථා උභොයෙවෙතා නාමාඛ්‍යාත
රූපමාලායො සාසනාවචරානම්පරෙසඤ්චාධුනිකානං සද්දත්ථ
රසිකානං විඤ්ඤූනඤ්ච සද්දනුසාසනනයප්පවීණානං මනො
පීණයන්තූති.

නමො තස්ස භගවතො අරහතො
සම්මාසම්බුද්ධස්ස

| (ඒකවචන) | (බහුවචන) | විභත්ති - අර්ථ |
|---|---|---|
| බුද්ධො | බුද්ධා | (පඨමා - ලිඞ්ගත්ථ) |
| (භො) බුද්ධ, බුද්ධා (භවන්තො) | බුද්ධා | ( ,, - ආලපන) |
| බුද්ධං | බුද්ධෙ | (දුතියා - කම්ම) |
| බුද්ධෙන | බුද්ධෙහි, බුද්ධෙභි | (තතියා - කත්තු) |
| බුද්ධෙන | බුද්ධෙහි, බුද්ධෙභි | ( ,, - කරණ) |
| බුද්ධාය, බුද්ධස්ස | බුද්ධානං | (චතුත්ථී - සම්පදාන) |
| බුද්ධා, බුද්ධම්හා, බුද්ධස්මා | බුද්ධෙහි, බුද්ධෙභි | (පඤ්චමී - අපාදාන) |
| බුද්ධස්ස | බුද්ධානං | (ඡට්ඨී - සාමි) |
| බුද්ධෙ, බුද්ධම්හි, බුද්ධස්මිං | බුද්ධෙසු | (සත්තමී - ආධාර) |

බුද්ධශබ්දයෙන් සර්වඥයන් කියත් —

සට, පට ශබ්දයෙන් ද මෙසේ වරනැඟියයුතු.

"එවං සුරාසුරනරොරගනාගයක්ඛ
ගන්ධබ්බකින්නරමනුස්සපිසාචපෙතා
මාතඞ්ගජඞ්ගමතුරඞ්ගවරාහසීහ
ව්‍යග්ඝච්ඡකච්ඡපතරච්ඡමිගස්සසොණා —

ආලොකලොකතිලයාතිලචාගයොග
වායාමගාමනිගමාසමධම්මකාමා
සඞ්ඛාසඛිස්සාසපරිසාසවකොධලොභ
සාරම්භථම්භමදමානපමාදමක්ඛා —

පුන්නාගපූගපනසාසනචම්පකම්බ
හින්තාලතාලබකුලජ්ජුනකිංසුකා ච
මඤ්ජූරකුන්දපුචිමන්දකරඤ්ජරුක්ඛා
සෙය්‍යා මයූරසකුණණ්ඩජකොඤ්චහංසා" * —

ඉච්චාදයො බුද්ධසද්දෙව.

---

*සුර, දෙවි ය; අසුර, අසුර ය; නර, මනුෂ්‍ය ය; උරග, සර්ප ය; නාග, ඇත්තු ය; යක්ඛ, යක්ෂ ය; ගන්ධබ්බ, දිව්‍යගන්ධර්ව ය; කින්නර, ලියකිඳුරු ය; මනුස්ස, මිනිස; පිසාච, පාංශුපිශාච ය; පෙතා, ප්‍රෙත ය; මාතඞ්ග, ඇත්තු ය; ජඞ්ගම, (සාර්වාහාදි) ජඞ්ගමසත්ව ය; තුරඞ්ග, අශ්ව ය; වරාහ, ඌරු ය; සීහ, සිංහ ය; ව්‍යග්ඝ, දිවි ය;

| | |
|---|---|
| අත්තා | අත්තානො |
| (භො) අත්ත, අත්තා (භවන්තො) | අත්තානො |
| අත්තානං, අත්තං | අත්තානො |
| අත්තෙන, අත්තනා | අත්තනෙහි, අත්තනෙභි |
| අත්තෙන, අත්තනා | අත්තනෙහි, අත්තනෙභි |
| අත්තනො | අත්තා[illegible] |
| අත්තනා, අත්තනම්හා, අත්තනස්මා | අත්තනෙ[illegible], අ[illegible]නෙභි |
| අත්තනො | අත්තා[illegible] |
| අත්තනි | අත්තනෙසු |

අත්තශබ්දයෙන් ආත්මය කියත් —

---

| | |
|---|---|
| රාජා | රාජානො |
| (භො) රාජ, රාජා (භවන්තො) | රාජානො |
| රාජානං, රාජං | රාජානො |
| රඤ්ඤා, රාජෙන | රාජූහි, රාජූභි, රාජෙහි, රාජෙභි |
| රඤ්ඤා, රාජෙන | රජූහි, රාජූභි රාජෙහි, රාජෙභි |
| රඤ්ඤො, රාජිනො | රඤ්ඤං, රාජූනං, රාජානං |
| රඤ්ඤා, රාජම්හා, රාජස්මා | රාජූහි, රාජූභි, රාජෙහි, රාජෙභි |
| රඤ්ඤො, [illegible] | රඤ්ඤං, රාජූනං, රාජානං |
| රඤ්ඤෙ, රාජිනි, රාජම්හි, රාජස්මිං | රාජූසු, රාජෙසු |

රාජශබ්දයෙන් රජදරුවන් කියත් —

---

අච්ඡ, වලස; කච්ඡප, ඉදිබ; තරච්ඡ, කරබාතා වලස; මිග, මුව ය; අස්ස, අශ්ව ය; සොණ, සුනඛ ය; ආලොක, (සූර්යාදීන්ගේ) ආලෝක ය; ලොක, (කාමලෝකාදි) ලෝක ය; නිලය, ගෘහ ය, අනිල, සුළඟ ය; චාග, ත්‍යාග ය; යොග, යෙදීම ය; වායාම, ව්‍යායාම ය; ගාම, කුඩාගම; නිගම, මහත් ගම්; ආගම, පිටකත්‍රය ය; ධම්ම, පර්යාප්තිධර්මී ය; කාම, පඤ්චග්‍රාම ය; සඞ්ඝ, සමූහ ය; ඔඝ, වතුර ය; ඝොස, ශබ්ද ය; පටිඝ, ද්වෙෂ ය; ආසව, (කාමාදි) ආශ්‍රව ය; කොධ, ක්‍රොධ ය; ලොභ, ආලය ය; සාරම්භ, කරණොත්තරකරණ ය; ථම්භ, (ගෘහස්තම්භයක් සේ චිත්තයාගේ) දැඩිබව ය; මද (පුරුෂමදාදි) මද ය; මාන, මාන ය; පමාද, ප්‍රමාද ය; මක්ඛ, ගුණමකු කෙලෙස්මකු ය; පුන්නාග, දෙඹ ය; පූග, පුවක්; පනස, කොස; අසන පියාගස; චම්පක, සපු ය; අම්බ, අඹ ය; හින්තාල, ජේතල කිතුල; තාල, තල්ගස; වකුල, මූණමල; අජ්ජුන, කුඹුක;

| | |
|---|---|
| ගුණවා | ගුණවන්තො, ගුණවන්තා |
| (හෙ) ගුණවං, ගුණව, ගුණවා | (භවන්තො) ගුණවන්තො, ගුණවන්තා |
| ගුණවන්තං | ගුණවන්තෙ |
| ගුණවතා, ගුණවන්තෙන | ගුණවන්තෙහි, ගුණවන්තෙභි |
| ගුණවතා, ගුණවන්තෙන | ගුණවන්තෙහි, ගුණවන්තෙභි |
| ගුණවතො, ගුණවන්තස්ස | ගුණවතං, ගුණවන්තානං |
| ගුණවතා, ගුණවන්තම්හා, ගුණවන්තස්මා | ගුණවන්තෙහි, ගුණවන්තෙභි |
| ගුණවතො, ගුණවන්තස්ස | ගුණවතං, ගුණවන්තානං |
| ගුණවති, ගුණවන්තෙ, ගුණවන්තම්හි, ගුණවන්තස්මිං | ගුණවන්තෙසු |

ගුණවන්තු ශබ්දයෙන් ගුණවතුන් කියත් —

එවං මඝවා කුලවා ඵලවා යසවා ධනවා සුතවා භගවා හිමවා බලවා සීලවා පඤ්ඤවා සතිමා ධිතිමා ගතිමා මුතිමා මතිමා ජුතිමා සිරිමා හිරිමා ථුතිමා රතිමා යතිමා සුචිමා කලිමා බලිමා කසිමා රුචිමා බුද්ධිමා චක්ඛුමා බන්ධුමා හෙතුමා සෙතුමා කෙතුමා රාහුමා භානුමා ඛාණුමා විජ්ජුමා ඉච්චාදයො ගුණවන්තුසද්දසමා.*

---

කිංසුක, කැල ය; මයූර, පරසතුමඳුරා ය; කුන්ද, වැකොඳ ය; පුචිමන්ද, කොසඹ ය; කරඤ්ජ, කරඳ ය; රුක්ඛ, රුක ය; මයූර, මොනර ය; සකුණ, විහඟ ය; අණ්ඩජ, පක්ෂි ය; කොඤ්ච, කොස්ලිහිණි ය; හංස, හංස ය; (යන මේ ආදි ශබ්දයෝ;) එවං, මෙසේ (බුද්ධශබ්දයා මෙන්); ඤෙය්‍යා, දතයුත්තාහු ය.

* මඝවා, ශක්‍රයා යි; කුලවා, කුල ඇත්තේ යි; ඵලවා, ඵල ඇත්තේ යි; යසවා, පිරිවර ඇත්තේ යි; ධනවා, වස්තු ඇත්තේ යි; සුතවා, ඇසූතැන් ඇත්තේ යි; භගවා, භාග්‍ය ඇත්තේ යි; හිමවා, (පිනි) හිම ඇත්තේ යි; බලවා, ශක්ති ඇත්තේ යි; සීලවා, සිල් ඇත්තේ යි, පඤ්ඤවා, නුවණ ඇත්තේ යි; සතිමා, සිහි ඇත්තේ යි; ධිතිමා, ධෛර්‍ය්‍ය; ගතිමා, ගමන්; මුතිමා, සමෘති; මතිමා, නුවණ; ජුතිමා, ශොභා; සිරිමා, ශ්‍රී; හිරිමා, ලජ්ජා; ථුතිමා, ස්තුති; රතිමා, ඇලුම්; යතිමා, තපස්වීන්; සුචිමා, ශුද්ධි; කලිමා, කිලුටු; බලිමා, බිලි; කසිමා, සී; රුචිමා, රුචි; බුද්ධිමා, ප්‍රඥා; චක්ඛුමා, ඇස්; බන්ධුමා, නෑයන්; හෙතුමා, කාරණ; සෙතුමා, හේදඬු; කෙතුමා, ධජ; රාහුමා, රාහු; භානුමා, රශ්මි; ඛාණුමා, කණු; විජ්ජුමා, විදුලි ඇත්තේ යි.

| | |
|---|---|
| ගච්ඡං, ගච්ඡන්තො | ගච්ඡන්තො, ගච්ඡන්තා |
| (හෙ) ගච්ඡං, ගච්ඡ, ගච්ඡා | (භවන්තො) ගච්ඡන්තො, ගච්ඡන්තා |
| ගච්ඡන්තං | ගච්ඡන්තෙ |
| ගච්ඡතා, ගච්ඡන්තෙන | ගච්ඡන්තෙහි, ගච්ඡන්තෙභි |
| ගච්ඡතා, ගච්ඡන්තෙන | ගච්ඡන්තෙහි, ගච්ඡන්තෙභි |
| ගච්ඡතො, ගච්ඡන්තස්ස | ගච්ඡතං, ගච්ඡන්තානං |
| ගච්ඡතා, ගච්ඡන්තම්හා, ගච්ඡන්තස්මා | ගච්ඡන්තෙහි, ගච්ඡන්තෙභි |
| ගච්ඡතො, ගච්ඡන්තස්ස | ගච්ඡතං, ගච්ඡන්තානං |
| ගච්ඡති, ගච්ඡන්තෙ ගච්ඡන්තම්හි, ගච්ඡන්තස්මිං | ගච්ඡන්තෙසු |

ගච්ඡන්තශබ්දයෙන් යන්නන් කියත් —

"එවං මහං චරං තිට්ඨං දදං භුඤ්ජං සුණං පචං —
ජයං ජීරං චවං මීයං සරං කුබ්බං ජපං වජං" * —

ඉච්චාදයො ගච්ඡන්තසද්දසමා — අකාරන්තං —
ආකාරන්තා ඉහප්පසිද්ධා —

---

| | |
|---|---|
| අග්ගි | අග්ගී, අග්ගයො |
| (හෙ) අග්ගි (භවන්තො) | අග්ගී, අග්ගයො |
| අග්ගිං | අග්ගී, අග්ගයො |
| අග්ගිනා | අග්ගීහි, අග්ගිභි |
| අග්ගිනා | අග්ගීභි, අග්ගිභි |
| අග්ගිනො, අග්ගිස්ස | අග්ගීනං |
| අග්ගිනා, අග්ගිම්හා, අග්ගිස්මා | අග්ගීහි, අග්ගීභි |
| අග්ගිනො, අග්ගිස්ස | අග්ගීනං |
| අග්ගිම්හි, අග්ගිස්මිං | අග්ගීසු |

අග්ගිශබ්දයෝන් ගිනි කියත් —

---

* මහං, පුදන්නේ; චරං, ඇවිදිනේ; තිට්ඨං, සිටිනේ; දදං, දෙන්නේ; භුඤ්ජං, අනුභව කරන්නේ; සුණං, අසන්නේ; පචං, පිසන්නේ; ජයං, දිනන්නේ; ජීරං, දිරන්නේ; චවං, චුතවන්නේ; (චවං, කියන්නේ; සී සභෙදභවිසාතනීපාඨ සි.) මීයං, මියන්නේ; සරං, සිහි කරන්නේ; කුබ්බං, කරන්නේ; ජපං, සඳ[illegible]; වජං, යන්නේ.

"ජෝති පාණී ගණ්ඨි මුට්ඨි, කුච්ඡි වත්ථි සාලි වීහි
ව්‍යාධි ඔධි බොධි සන්ධි, රාසි කෙසි සාති දීපි —
ඉසි මුනි මණි ධනි ගිරි රවි කවි කපි
අසි මසි නිධි විධි අහි කිමි පති හරි
අරි තිමි කලි බලි ජලධි ච ගහපති
උරුධිති වරමති නිරුපධි අධිපති"

අඤ්ජලි සාරථි අතිථි සමාධි උදධිප්පභුතයො අග්ගිසද්දෙව. * —

---

| | |
|---|---|
| ආදි | ආදී, ආදයො |
| (හෙ) ආදි (භවන්තො) | ආදී, ආදයො |
| ආදිං | ආදී, ආදයො |
| ආදිනා | ආදීහි, ආදීභි |
| ආදිනා | ආදීහි, ආදීභි |
| ආදිනො, ආදිස්ස | ආදීනං |
| ආදිනා, ආදිම්හා, ආදිස්මා | ආදීහි, ආදීභි |
| ආදිනො, ආදිස්ස | ආදීනං |
| ආදිං, ආද්‍යෙ, ආදිම්හි, ආදිස්මිං | ආදිසු, ආදීසු |

ආදිශබ්දයෙන් මර්‍යාදා ය, ප්‍රකාර ය, සමීප ය, අවයව ය යන
අර්ථසතරක් කියත් — ඉකාරන්තං —

---

| | |
|---|---|
| දණ්ඩි | දණ්ඩී, දණ්ඩිනො |
| (හෙ) දණ්ඩි (භවන්තො) | දණ්ඩී, දණ්ඩිනො |
| දණ්ඩිනං, දණ්ඩිං | දණ්ඩී, දණ්ඩිනො |
| දණ්ඩිනා | දණ්ඩීහි, දණ්ඩීභි |
| දණ්ඩිනා | දණ්ඩීහි, දණ්ඩීභි |
| දණ්ඩිනො, දණ්ඩිස්ස | දණ්ඩීනං |
| දණ්ඩිනා, දණ්ඩිම්හා, දණ්ඩිස්මා | දණ්ඩීහි, දණ්ඩීභි |
| දණ්ඩිනො, දණ්ඩිස්ස | දණ්ඩීනං |
| දණ්ඩිනි, දණ්ඩිම්හි, දණ්ඩිස්මිං | දණ්ඩිසු, දණ්ඩීසු |

දණ්ඩිශබ්දයෙන් දඬුගත්තවුන් කියත් —

---

* ජොති, ගිනි; පාණී, අත්ල; ගණ්ඨි, ගැට; මුට්ඨි, මිට; කුච්ඡි, කුස; වත්ථි, වස්තිය (මූත්‍රාශය); සාලි, හැල්; වීහි, (සෙසු) වී; ව්‍යාධි, රොගය; ඔධි, අවධිය; බොධි, බෝගස; සන්ධි, පදසන්ධ්‍යාදිය; රාසි, රැස; කෙසි, එනම් අශ්වාචාර්‍යයා ය; සාති, එනම් පුරුෂ ය; දීපි, දිවි ය; ඉසි, ඍෂි ය; මුනි, (අෂ්ටවිධ) මුනිහු; මණි, මාණික්‍ය; ධනි, ශබ්ද; ගිරි, පර්වත; රවි, හිරු; කවි, කාව්‍යකාර ය; කපි වඳුරු;

"ධම්මී සඞ්ඝී ඤාණී හත්ථී, චක්කී පක්ඛී දාඨී රට්ඨී
ඡත්තී මාලී වම්මී යෝගී, භාගී භෝගී කාමී සාමී –
ධජී ගණී සසී කුට්ඨී, ජටී යානී සුඛී සිඛී
දන්තී මන්තී කරී චාගී, කුසලී මුසලී බලී
පාපකාරී සත්තුඝාතී, මාලාකාරී දීඝජීවී
ධම්මවාදී සීහනාදී, භූමිසායී සීඝයායී" * –

ඉච්චාදයො දණ්ඩිසද්දසමා — ඊකාරන්තං –

| | |
|---|---|
| භික්ඛු | භික්ඛවෝ, භික්ඛූ |
| (හෙ) භික්ඛු (භවන්තො) | භික්ඛවෙ, භික්ඛවෝ, භික්ඛූ |
| භික්ඛුං | භික්ඛවෝ, භික්ඛූ |
| භික්ඛුනා | භික්ඛූහි, භික්ඛූභි |
| භික්ඛුනා | භික්ඛූහි, භික්ඛූභි |
| භික්ඛුනො, භික්ඛුස්ස | භික්ඛූනං |
| භික්ඛුනා, භික්ඛුම්හා, භික්ඛුස්මා | භික්ඛූහි, භික්ඛූභි |
| භික්ඛුනො, භික්ඛුස්ස | භික්ඛූනං |
| භික්ඛුම්හි, භික්ඛුස්මිං | භික්ඛූසු, භික්ඛූසු. |

භික්ඛුශබ්දයෙන් භික්ෂූන් කියත් –

එවං සෙතු කෙතු රාහු භානු සංකු උච්ඡු වෙළු මච්චු සින්ධු බන්ධු නෙරු මෙරු සත්තු කාරු හෙතු ජන්තු රුරු පටු ඉච්චාදයො භික්ඛුසද්දසමා* — ජන්තුනො අයං විසෙසො.

---

අසි, කඩුව; මසි, දූලි; නිධි, නිධාන; විධි, විධාන; අහි, සර්ප; කිමි, පණු; පති, ස්වාමි; හරි, සිංහ; අරි, සතුරු; තිමි, එනම් මත්ස්‍ය; කලි, දෝෂ; බලි, බලිකර්ම; ජලධි, සාගරය; ගහපති, ගොවි; උරුධිති, මහාවීර්‍ය්‍ය ඇත්තේ; වරමති, උතුම් නුවණ ඇත්තේ; නිරුපධි, ස්කන්ධක්ලේශාදි විරහිත වූයේ (නිවන); අධිපති, ස්වාමි; අඤ්ජලි, ඇඳිලි; සාරථි, රියැසැරි; අතිථි, අමුත්තා; සමාධි, චිත්තෛකාග්‍රතාව; උදධි, සමුද්‍රය.

* ධම්මී, ධර්ම ඇත්තේ; සඞ්ඝී, සමූහ ඇත්තේ; ඤාණී, නුවණැත්තේ; හත්ථී, හස්ති; චක්කී, සක් ඇත්තේ; (චක්කී, වල්කල ඇත්තේ යි ද කියත්;) පක්ඛී, පක්ෂ ඇත්තේ; දාඨී, දළ ඇත්තේ (ව්‍යාලමෘග යි); රට්ඨී, රට ඇත්තේ; ඡත්තී, ඡත්‍ර ඇත්තේ; මාලී, මාලා (පඬසාහි) ඇත්තේ; වම්මී, සන්නාහ ඇත්තේ; යෝගී, (භාවනා) යෝග ඇත්තේ; භාගී, පිනැත්තේ; භෝගී, වස්තු ඇත්තේ; කාමී, (බහුල) කාමරාග ඇත්තේ; සාමී, ඉසුරු ඇත්තේ; ධජී, ධ්වජ ඇත්තේ; ගණී, සමූහ ඇත්තේ; සසී, ශශලප ඇත්තේ (චන්ද්‍ර යි); කුට්ඨී,

| | |
|---|---|
| ජන්තු | ජන්තූ, ජන්තවො, ජන්තුනො, ජන්තුයො |
| (හෙ) ජන්තු (භවන්තො) | ජන්තූ, ජන්තවො, ජන්තුනො, ජන්තුයො |
| ජන්තුං | ජන්තූ, ජන්තවො, ජන්තුනො, ජන්තුයො |
| ජන්තුනා | ජන්තූහි, ජන්තූභි |
| ජන්තුනා | ජන්තූහි, ජන්තූභි |
| ජන්තුනො, ජන්තුස්ස | ජන්තූනං |
| ජන්තුනා, ජන්තුම්හා, ජන්තුස්මා | ජන්තූහි, ජන්තූභි |
| ජන්තුනො, ජන්තුස්ස | ජන්තූනං |
| ජන්තුම්හි, ජන්තුස්මිං | ජන්තූසු, ජන්තුසු |

ජන්තුශබ්දයෙන් සත්වයන් කියත් —

---

| | |
|---|---|
| සත්ථා | සත්ථාරො |
| (හෙ) සත්ථ, සත්ථා (භවන්තා) | සත්ථාරො |
| සත්ථාරං | සත්ථාරෙ, සත්ථාරො |
| සත්ථාරා | සත්ථාරෙහි, සත්ථාරෙභි |
| සත්ථාරා | සත්ථාරෙභි, සත්ථාරෙහි |
| සත්ථු, සත්ථුනො, සත්ථුස්ස | සත්ථාරානං, සත්ථානං |
| සත්ථාරා | සත්ථාරෙහි, සත්ථාරෙභි |
| සත්ථු, සත්ථුනො, සත්ථුස්ස | සත්ථාරානං, සත්ථානං |
| සත්ථරි | සත්ථාරෙසු |

සත්ථුශබ්දයෙන් ශාස්තෲන් කියත් —

---

කුණ්ඩී ඇත්තේ; ජටී, ජටා ඇත්තේ; යානී, යාන ඇත්තේ; සුඛී, සුව ඇත්තේ; සිඛී, චූඩා ඇත්තේ; (මොනර ය.) දන්තී, දන්ත ඇත්තේ; (හස්ති ය.) මන්තී, මන්ත්‍ර හඳුරනසුලු ය; සාරී, සොඬ ඇත්තේ; (කුඤ්ජර යි.) චාගී, පරිත්‍යාග ඇත්තේ; කුසලී, පිනැත්තේ; මුසලී, මුෂලායුධ ඇත්තේ; බලී, ශක්ති හෝ සේනා ඇත්තේ; පාපකාරී, පව් කරනසුලු ය; සත්තුඝාතී, සතුරන් මඩනේ ය; මාල්‍යකාරී, මාලාකාර ය; දීඝජීවී, චිරජීවී ය; ධම්මවාදී, දහම් කියනසුලු ය; සීහනාදී, නිර්භීයනාද ඇත්තේ; භූමිසායී, බිම හොත්තාසුලු ය; සීඝයායී, වහා යනසුලු ය.

† සෙතු, හෙ ය; කෙතු, ධ්වජ ය; රාහු, අසුරේන්ද්‍ර ය; භානු, හිරු ය; සඞ්කු, හුල්; උච්ඡු, උක්; වෙළු, හුණ; මච්චු, මාර ය; [illegible] සමුද්‍ර ය; බන්ධු, නෑ ය; නෙරු, එනම් සුවර්ණපර්වත ය; මෙරු, මහමෙර ය; සත්තු, සතුරා හෝ ගන්සුනු ය; කාරු, ශිල්පි ය; හේතු, කාරණ ය; ජන්තු, සත්ව ය; රුරු, එනම් මුවවිශේෂ ය; පටු, ව්‍යක්ත ය.

| | |
|---|---|
| නත්තා | නත්තාරෝ |
| (හෙ) නත්ත, නත්තා | (භවන්තො) නත්තාරෝ |
| නත්තාරං | නත්තාරෙ, නත්තාරෝ |
| නත්තාරා | නත්තාරෙභි, නත්තාරෙහි |
| නත්තාරා | නත්තාරෙභි, නත්තාරෙහි |
| නත්තු, නත්තුනො, නත්තුස්ස | නත්තාරානං, නත්තානං |
| නත්තාරා | නත්තාරෙභි, නත්තාරෙහි |
| නත්තු, නත්තුනො, නත්තුස්ස | නත්තාරානං, නත්තානං |
| නත්තරි | නත්තාරෙසු, නත්තුසු |

නත්තුශබ්දයෙන් මුනුබුරන් කියත් —

එවං භත්තු වත්තු නෙතු සොතු ඤාතු ජෙතු ජෙත්තු හෙත්තු දාතු ධාතු කත්තු බොද්ධු විඤ්ඤාපෙතු සකමන්ධාතු මහාමන්ධාතු ආදයො.*

---

| | |
|---|---|
| පිතා | පිතරෝ |
| (හෙ) පිත, පිතා | (භවන්තො) පිතරෝ |
| පිතරං | පිතරෙ, පිතරෝ |
| පිතරා | පිතරෙභි, පිතරෙහි, පිතූභි, පිතූහි |
| පිතරා | පිතරෙභි, පිතරෙහි, පිතූභි, පිතූහි |
| පිතු, පිතුනො, පිතුස්ස | පිතරානං, පිතානං, පිතූනං |
| පිතරා | පිතරෙභි, පිතරෙහි, පිතූභි, පිතූහි |
| පිතු, පිතුනො, පිතුස්ස | පිතරානං, පිතානං, පිතූනං |
| පිතරි | පිතරෙසු, පිතූසු |

පිතුශබ්දයෙන් පිතෘන් කියත් —

---

| | |
|---|---|
| භාතා | භාතරෝ |
| (හෙ) භාත, භාතා | (භවන්තො) භාතරෝ |
| භාතරං | භාතරෙ, භාතරෝ |
| භාතරා | භාතරෙභි, භාතරෙහි, භාතූභි, භාතූහි |
| භාතරා | භාතරෙභි, භාතරෙහි, භාතූභි, භාතූහි |
| භාතු, භාතුනො, භාතුස්ස | භාතරානං, භාතානං, භාතූනං |
| භාතරා | භාතරෙභි, භාතරෙහි, භාතූභි, භාතූහි |
| භාතු, භාතුනො, භාතුස්ස | භාතරානං, භාතානං, භාතූනං |
| භාතරි | භාතරෙසු, භාතූසු |

භාතුශබ්දයෙන් සහෝදරයන් කියත් —

---

* භත්තු, රක්‍ෂා කරන්නේ; (ස්වාමී යි.) වත්තු, කියන්නේ; (වාග්මී යි.) නෙතු, පමුණුවන්නේ; සොතු, අසන්නේ; ඤාතු, දන්නේ; ජෙතු, දිනන්නේ; ජෙත්තු, කපන්නේ; හෙත්තු, පළන්නේ; දාතු, දෙන්නේ; ධාතු, ධරන්නේ; කත්තු, කරන්නේ; බොද්ධු, දන්නේ; විඤ්ඤාපෙතු, හඟවන්නේ; සකමන්ධාතු, එනම් රජ; මහාමන්ධාතු, එනම් රජ.

| | |
|---|---|
| අභිභූ | අභිභුවො, අභිභූ |
| (භො) අභිභු (භවන්තො) | අභිභුවො, අභිභූ |
| අභිභුං | අභිභුවො, අභිභූ |
| අභිභුනා | අභිභූහි, අභිභූභි |
| අභිභුනා | අභිභූහි, අභිභූභි |
| අභිභුනො, අභිභුස්ස | අභිභූනං |
| අභිභුනා, අභිභුම්හා, අභිභුස්මා | අභිභූහි, අභිභූභි |
| අභිභුනො, අභිභුස්ස | අභිභූනං |
| අභිභුම්හි, අභිභුස්මිං | අභිභූසු |

අභිභූශබ්දයෙන් මැඩපවත්වන්නවුන් කියත්.
එවං සයම්භූ වෙස්සභූ පරාභිභූ සහභූ * ආදයො † —

---

| | |
|---|---|
| සබ්බඤ්ඤූ | සබ්බඤ්ඤුනො, සබ්බඤ්ඤූ |
| (භො) සබ්බඤ්ඤූ (භවන්තො) | සබ්බඤ්ඤුනො, සබ්බඤ්ඤූ |
| සබ්බඤ්ඤුං | සබ්බඤ්ඤුනො, සබ්බඤ්ඤූ |
| සබ්බඤ්ඤුනා | සබ්බඤ්ඤූහි, සබ්බඤ්ඤූභි |
| සබ්බඤ්ඤුනා | සබ්බඤ්ඤූහි, සබ්බඤ්ඤූභි |
| සබ්බඤ්ඤුනො, සබ්බඤ්ඤුස්ස | සබ්බඤ්ඤූනං |
| සබ්බඤ්ඤුනා, සබ්බඤ්ඤුම්හා, සබ්බඤ්ඤුස්මා | සබ්බඤ්ඤූහි, සබ්බඤ්ඤූභි |
| සබ්බඤ්ඤුනො, සබ්බඤ්ඤුස්ස | සබ්බඤ්ඤූනං |
| සබ්බඤ්ඤුම්හි, සබ්බඤ්ඤුස්මිං | සබ්බඤ්ඤූසු |

සබ්බඤ්ඤූ ශබ්දයෙන් සර්වඥයන් කියත් —

එවං මග්ගඤ්ඤූ ධම්මඤ්ඤූ අත්ථඤ්ඤූ කාලඤ්ඤූ රත්තඤ්ඤූ මත්තඤ්ඤූ කතඤ්ඤූ තථඤ්ඤූ විඤ්ඤූ විදූ වෙදගූ පාරගූ ඉච්චාදයො ‡ —

ඌකාරන්තං —

---

* සහභූශබ්දය අභිභූශබ්දය හා සම වුවත් ප්‍රථමා ආලපන ද්විතීයා බහුවචනයන්හි "සහභුවො" යන රූපය ද ලබයි. මෙසේ ම යටකී භික්ඛුශබ්දය හා හෙතුශබ්දය සම වුවත් ප්‍රථමා ආලපන ද්විතීයා බහුවචනයන්හි "හෙතුයො" යන රූපය ද ලබයි.

† සයම්භූ, තමා විසින් දත්තෝ- (බුද්ධප්‍රත්‍යෙකබුද්ධ යි;) වෙස්සභූ, සියල්ල දත්තෝ- (එනම් සම්‍යක්සම්බුද්ධ යි;) පරාභිභූ, මෙරමා මැඩපවත්නෝ; සහභූ, එක් ව උපදනෝ.

‡ මග්ගඤ්ඤූ, මාර්ගය දන්නෝ; ධම්මඤ්ඤූ, ධර්මය දන්නෝ; අත්ථඤ්ඤූ, අර්ථය දන්නෝ; කාලඤ්ඤූ, (සුදුසු) කල් දන්නෝ;

| | |
|---|---|
| ගො | ගාවො |
| (හෙ) ගො (හවන්තො) | ගාවො |
| ගාවුං, ගාවං ගවං | ගාවො |
| ගාවෙන, ගවෙන | ගොභි, ගොහි |
| ගාවෙන, ගවෙන | ගොභි, ගොහි |
| ගාවස්ස, ගවස්ස | ගවං, ගුන්නං, ගොනං |
| ගාවා, ගවා, ගාවම්හා, ගවම්හා, ගාවස්මා, ගවස්මා | ගොභි, ගොහි |
| ගාවස්ස, ගවස්ස | ගවං, ගුන්නං, ගොනං |
| ගාවෙ, ගවෙ, ගාවම්හි, ගවම්හි, ගාවස්මිං, ගවස්මිං | ගාවෙසු, ගවෙසු, ගොසු |

**ගො ශබ්දයෙන් ගෙරින් කියත්.**

ඔකාරන්තං —

---

බුද්ධන්තා රාජගුණවා ගවජන්තගාදිදණ්ඩී ච
භික්ඛු ච ජන්තුසත්ථා ච තන්තා ච පිතුභාතු ච
අභිභූසබ්බඤ්ඤූ ගොතී එවං පුල්ලිඞ්ගසඞ්ගහො.

## පුල්ලිඞ්ගා

---

| | |
|---|---|
| කඤ්ඤා | කඤ්ඤා, කඤ්ඤායො |
| (හෙ) කඤ්ඤෙ (හොතී) | කඤ්ඤා, කඤ්ඤායො |
| කඤ්ඤං | කඤ්ඤා, කඤ්ඤායො |
| කඤ්ඤාය | කඤ්ඤාභි, කඤ්ඤාහි |
| කඤ්ඤාය | කඤ්ඤාභි, කඤ්ඤාහි |
| කඤ්ඤාය | කඤ්ඤානං |
| කඤ්ඤාය | කඤ්ඤාභි, කඤ්ඤාහි |
| කඤ්ඤාය | කඤ්ඤානං |
| කඤ්ඤායං, කඤ්ඤාය | කඤ්ඤාසු |

**කඤ්ඤා ශබ්දයෙන් දසහැවිරිදි ස්ත්‍රීන් කියත් —**

---

රත්තඤ්ඤූ, චිරකාලය දන්නෝ - (දීර්ඝායුෂ්ක යි;) මත්තඤ්ඤූ (ප්‍රතිග්‍රහණාදියෙහි) පමණ දන්නෝ; කතඤ්ඤූ, කළ (උපකාර) දන්නෝ; තථඤ්ඤූ, අවිපරීතස්වභාව දන්නෝ; විඤ්ඤූ, වෙසෙස සින් දන්නෝ - (ප්‍රාඥ යි;) විද්ධූ, දන්නෝ; වෙදගූ, ප්‍රතිවිද්ධඥාන ඇත්තේ - නොහොත් ඥානය හේතුකොට පවත්නේ; පාරගූ, පරතෙරට යනසුළු වූයේ.

"සද්ධා මෙධා පඤ්ඤා විජ්ජා, චින්තා මන්තා තණ්හා වීණා
ඉච්ඡා මුච්ඡා එජා මායා, මෙත්තා මත්තා සික්ඛා භික්ඛා * ෴

ජංඝා ගීවා ජිව්හා වාචා, ඡායා ආසා ගඞ්ගා නාවා
ගාථා සෙනා ලෙඛා සාලා, මාලා වෙලා පූජා ඛිඩ්ඩා † ෴

පිපාසා වෙදනා සඤ්ඤා, චෙතනා තසිණා පජා
දෙවතා වට්ටකා ගොධා, බලාකා පරිසා සභා ‡ ෴

ඌකා සෙඵාලිකා ලඞ්කා, සලාකා වාලුකා සිඛා
විසාඛා විසිඛා සාඛා, වචා වඤ්ඣා ජටා ඝටා § ෴

---

* **සද්ධා**, හැදහිලි ය; මෙධා, උපායපරිග්‍රාහක ප්‍රඥ ය; පඤ්ඤා, (ශ්‍රැතමයාදි) ප්‍රඥ ය; විජ්ජා, (අභිඥාදි) ඥාන ය; චින්තා, සිතිවිලි ය; මන්තා, (ගවෙෂණ) ප්‍රඥ ය; තණ්හා, (කාමාදි) තෘෂ්ණා ය; වීණා, වෙණ ය; ඉච්ඡා, ආශා ය; මුච්ඡා, මූර්ඡා ය; එජා, තෘෂ්ණා ය; මායා, (කෘතපාපප්‍රතිච්ඡාදක) මායාව හෝ ඉන්ද්‍රජාල ය; මෙත්තා, මෛත්‍රී ය; මත්තා, ප්‍රමාණ ය; සික්ඛා, (පඤ්චශීලාදි) ශික්ෂා ය; භික්ඛා, (සිඟියයුතු) ආහාර ය.

† ජංඝා, සිත්කකුල ය; ගීවා, උගුර ය; ජිව්හා, දිව ය; වාචා, තෙපල ය; ඡායා, සෙවණ ය; ආසා, විෂයප්‍රාර්ථනා ය; ගඞ්ගා, එනම් මහනදිය; නාවා, නැව ය; ගාථා, ත්‍රිපාදයෙන් හෝ ෂට්පාදයෙන් උපලක්ෂිතපද්‍යවිශෙෂය; (සිවුපෙදින් යුත් සොලෝ ද කියත්.) සෙනා, (සිවුරඟ) සෙන් ය; ලෙඛා, රෙඛා ය; සාලා, (චතුරශ්‍රාදි) ගෙය; මාලා, මල්දම ය; වෙලා, පරිච්ඡින්නකාලවිශෙෂය හෝ වෙරළ ය; පූජා, පිදීම ය; ඛිඩ්ඩා, ක්‍රීඩා ය.

‡ පිපාසා, පැන්පවස ය; වෙදනා, ආලම්බනරසානුභව ය. සඤ්ඤා, සංඥ ය – (නිමිත්තග්‍රහණලක්ෂණ වූ චෛතසික යි;) චෙතනා, සිතිවිලි ය; තසිණා, තෘෂ්ණා ය; පජා, සත්ත්වනිකාය ය; දෙවතා, දෙවි හෝ දෙව්දූ ය; වට්ටකා, වටු ය; ගොධා, ගොයි ය; බලාකා, කොකිනී ය; පරිසා, පිරිස ය; සභා, රැස්වන ශාලා ය – **"තිං සභාපරිසාය"** (2. 106) යන මූගලන්සුතුරෙන් සප්තම්‍යන්ත වචනයෙහි "සභතිං – පරිසතිං" යන විශෙෂරූප ද සිද්ධ යි.

§ ඌකා, උකුණු ය; සෙඵාලිකා, එනම් ගස ය; ලඞ්කා, ලක්දිව ය; සලාකා, හිරටු ය; වාලුකා, වැලි ය; සිඛා, සිළු ය; විසාඛා, විසා නකත ය; විසිඛා, වීථි ය; සාඛා, (වෘක්ෂාදීන්ගේ) ශාඛා ය; වචා, වද ය; වඤ්ඣා, වඳනැහැත්තී ය; ජටා, අවුල් වූ කෙශකලාප ය; ඝටා, සමූහ ය.

ජෙට්ඨා සොණ්ඩා විතණ්ඩා ච, කරුණා වනිතා ලතා
කථා නිද්දා සුධා රාධා, වාසනා සිංසපා පපා * ‍
පභා සීමා ඛමා ජායා, ඛත්තියා සක්ඛරා සුරා
දොලා තුලා සිලා ලීලා, ලාලෙලා මෙඛලා කලා †
වළවාලම්බුසා මූසා, මඤ්ජූසා සුලසා දිසා
නාසා ජුණ්හා ගුහා ඊහා, ලසිකා වසුධාදයො" ‡

කඤ්ඤාසද්දසමා — ආකාරන්තං

---

| | |
|---|---|
| රත්ති | රත්තී, රත්තියො, රත්‍යො |
| (හෙ) රත්ති | (හොතී) රත්තී, රත්තියො, රත්‍යො |
| රත්තිං | රත්තී, රත්තියො, රත්‍යො |
| රත්‍යා, රත්තියා | රත්තීහි, රත්තීභි |
| රත්‍යා, රත්තියා | රත්තීහි, රත්තීභි |
| රත්‍යා, රත්තියා | රත්තීනං |
| රත්‍යා, රත්තියා | රත්තීහි, රත්තීභි |
| රත්‍යා, රත්තියා | රත්තීනං |
| රත්‍යං, රත්තියං, රත්‍යා, රත්තිං, රත්තො, රත්තියා | රත්තීසු |

රත්ති ශබ්දයෙන් රාත්‍රිය කියත්

---

* ජෙට්ඨා, දෙට නකත ය; සොණ්ඩා, ඇත්සොඬ ය; විතණ්ඩා, එනම් වාද ය - (ස්වපක්ෂස්ථාපනරහිත වැ පරපක්ෂදූෂණය කරන වාදීන්ගේ කථා යි;) කරුණා, දයා ය; වනිතා, ස්ත්‍රී ය; ලතා, ලිය ය; කථා, (ආනුපූර්ව්‍යාදි) කථා ය; නිද්දා, නින්ද ය; සුධා, දිව්‍යභොජන ය; රාධා, එනම් දෙව්දු හෝ විසා නකත ය; වාසනා, කෙලෙශ වාසනා ය - (කෙලෙශනිහිතසාමර්ථ්‍යවිශෙෂයෙකි;) සිංසපා, හින්සලු හෝ ඇට්ටර ය; පපා, පැන්හල ය.

† පභා, ශොභා ය; සීමා, අවධි ය; ඛමා, ක්ෂාන්ති ය; ජායා, භාර්‍ය්‍යා ය; ඛත්තියා, රජදූ ය; සක්ඛරා, ශර්කරා ය; සුරා, රහ ය; දොලා, හෝවිලි ය; තුලා, පිලිම්දණ්ඩ (තරාදි) ය; සිලා, ගල ය; ලීලා, විලාස ය; ලාලා, කෙළ ය; එලා, එල්සාල් ය; මෙඛලා, මෙවුල් දම ය; කලා, කලාශිල්ප හෝ කොටස් ය.

‡ වළවා, වෙළඹ ය; අලම්බුසා, එනම් දෙව්දූ ය; මූසා, කෝව ය; මඤ්ජූසා, කරඬු හෝ පෙට්ටි ය; සුලසා, තලා ය; දිසා, (පූර්වාදි) දිශා ය; නාසා, නාසිකා ය; ජුණ්හා, සඳරැස ය; ගුහා, ලෙන ය; ඊහා, උත්සාහ ය; ලසිකා, සඳමිදුලු ය; වසුධා, පොළොව ය.

"පත්ති යුත්ති වුත්ති කිත්ති මුත්ති තිත්ති ඛන්ති කන්ති
සන්ති තන්ති සිද්ධි සුද්ධි, ඉද්ධි වුද්ධි බුද්ධි බොධි * ෴

භූමි ජාති පීති සූති, නන්දි සන්ධි සාණි කොටි
දිට්ඨි වුට්ඨි තුට්ඨි යට්ඨි, පාළි ආලි නාළි කෙළි † ෴

සති මති ගති චුති ධිති යුවති විකති රති රුචි
රස්මි අසනි වසනි ඔසධි අඞ්ගුලි ධූලි

දුන්දුභි දොණි අටවි ඡවි ආදීනි ඉකාරන්තනාමානි" ‡ ෴

රත්තිව — ඉකාරන්තං ෴

| | |
|---|---|
| නදී | නදී, නජ්ජො, නදියො |
| (හෙ) නදි | (භොතී) නදී, නජ්ජො, නදියො |
| නදියං, නදිං | නදී, නජ්ජො, නදියො |
| නජ්ජා, නදියා | නදීහි, නදීභි |
| නජ්ජා, නදියා | නදීහි, නදීභි |
| නජ්ජා, නදියා | නදීනං |
| නජ්ජා, නදියා | නදීහි, නදීභි |
| නජ්ජා, නදියා | නදීනං |
| නජ්ජං, නදියං, නදියා | නදීසු |

නදී ශබ්දයෙන් ගං හෝ කියත් ෴

* පත්ති, පාබලසෙනාග ය; යුත්ති, (අන්වයව්‍යතිරෙකලක්ෂණ වූ) න්‍යාය ය; වුත්ති, ජීවිකාවෘත්තිය හෝ සූත්‍රවිවරණ ය; කිත්ති, කීර්ති ය – (ගුණඝොෂාව යි;) මුත්ති, මිදීම ය; තිත්ති, තෘප්ති ය; ඛන්ති, ක්ෂාන්ති ය; කන්ති, ශොභා ය; සන්ති, නිවන ය; තන්ති, පාළි හෝ ප්‍රවේණි ය; සිද්ධි, නිෂ්පත්ති ය; සුද්ධි, විශුද්ධි ය; ඉද්ධි, සමෘද්ධි ය; වුද්ධි, වෘද්ධි ය; බුද්ධි, ප්‍රඥ ය; බොධි, මාර්ගඥාන ය.

† භූමි, පොළොව ය; ජාති, ඉපදීම ය; පීති, ප්‍රීති ය; සූති, ප්‍රසූති ය; නන්දි, සන්තොෂ ය; සන්ධි, ප්‍රතිසන්ධි ය; සාණි, තිර ය; කොටි, කෙළවර ය; දිට්ඨි, ලබ්ධි ය; වුට්ඨි, වැසි ය; තුට්ඨි, සතුට ය; යට්ඨි, යට ය; පාළි, පෙළදහම හෝ පඞ්ක්ති ය; ආලි, යෙහෙළි ය; නාළි, නැළි ය; කෙළි, ක්‍රීඩා ය.

‡ සති, සිහි ය; මති, නුවණ ය; ගති, ගමන ය; චුති, ගිළිහීම හෝ මරණ ය; ධිති, ධෛර්‍ය ය; යුවති, තරුණී ය; විකති; විකාර ය; රති, ඇල්ම ය; රුචි, ආලය; රස්මි, රැස් ය; අසනි, සෙණ ය; වසනි, වස්ත්‍ර ය; ඔසධි, එනම් තාරකාව ය; (දවහත්තරු යි.) අඞ්ගුලි, ඇඟිලි ය; ධූලි, රජස් ය; දුන්දුභි, බෙරවෙසෙස ය; (භෙරි සාමාන්‍යයෙහි පුල්ලිඞ්ග යි.). දොණි, දෙණ ය; අටවි, අරණ්‍ය ය; ඡවි, ශරීරච්ඡවි ය.

"මහී වේතරණී වාපී පාටලී කදලී ඝටී
නාරී කුමාරී තරුණී වාරුණී බ්‍රාහ්මණී සඛී* ෴
ගන්ධබ්බී කින්නරී නාගී දේවී යක්ඛී අජී මිගී
වානරී සූකරී සීහී හංසී කාකී ච කුක්කුටී" † ෴

ඉච්චාදයො නදීව — ඊකාරන්තං ෴

---

| | |
|---|---|
| යාගු | යාගූ, යාගුයො |
| (හෙ) යාගු | (භොතී) යාගූ, යාගුයො |
| යාගුං | යාගූ, යාගුයො |
| යාගුයා | යාගූහි, යාගූභි |
| යාගුයා | යාගූහි, යාගූභි |
| යාගුයා | යාගූනං |
| යාගුයා | යාගූහි, යාගූභි |
| යාගුයා | යාගූනං |
| යාගුයං, යාගුයා | යාගූසු |

යාගු ශබ්දයෙන් හුළුකැන් කියත්.

එවං ධාතු ධෙනු කාසු දද්දු කණ්ඩු කච්ඡු රජ්ජු කණෙරු පියඞ්ගු සස්සු ආදීනි යාගුසද්දෙව ‡ ෴

---

| | |
|---|---|
| මාතා | මාතරො |
| (හෙ) මාත, මාතා | (භොතී) මාතරො |
| මාතරං | මාතරෙ, මාතරො |
| මාතුයා, මාතරා | මාතරෙහි, මාතරෙභි, මාතූහි, මාතූභි |
| මාතුයා, මාතරා | මාතරෙහි, මාතරෙභි, මාතූහි, මාතූභි |
| මාතු, මාතුයා | මාතරානං, මාතානං, මාතූනං |
| මාතුයා, මාතරා | මාතරෙහි, මාතරෙභි, මාතූහි, මාතූභි |
| මාතු, මාතුයා | මාතරානං, මාතානං, මාතූනං |
| මාතුයා, මාතරි | මාතරෙසු, මාතූසු |

මාතු ශබ්දයෙන් මෑණියන් කියත් ෴

---

* මහී, පොළොව හෝ එනම් මහානදිය; වේතරණී, (ඔසුපත් නිරයෙහි) ලොහො නදිය; වාපී, වැව ය; පාටලී, පළොල් ය; කදලී, කෙසෙල් ය; ඝටී, කළ ය; නාරී, මනුෂ්‍යස්ත්‍රී ය; කුමාරී, බාලස්ත්‍රී ය; තරුණී, තරුණස්ත්‍රී ය; වාරුණී, වරුණභාර්‍ය්‍යා ය; බ්‍රාහ්මණී, බැමිණි ය; සඛී, යෙහෙළි ය.

† ගන්ධබ්බී, ගදෙව්දූ ය; කින්නරී, කිඳුරඟන ය; නාගී, නාමෙණෙවි ය; දෙවී, දෙව්දූ ය; යක්ඛී, යකිනී ය; අජී, එළි ය; මිගී, මුවදෙන ය; වානරී, වැඳිරි ය, සූකරී, ඌරි ය; සීහී, සිංහදෙනු ය; හංසී, හංසදෙනු ය; කාකී, කැවිඩි ය; කුක්කුටී, කිකිළි ය.

‡ ධාතු, (පෘථිව්‍යාදි) ධාතු ය; ධෙනු, අලුතවැදූ දෙන ය; කාසු, වළ ය; දද්දු, දද ය; කණ්ඩු, කණ්ඩූති ය; කච්ඡු, කස ය; රජ්ජු රැහැණ ය; කණෙරු, ඇතිනි ය; පියඞ්ගු, හීතණ ය; සස්සු, නැදි ය.

ධීතා, ධීතරෝ, දුහිතා, දුහිතරෝ ඉච්චාදි මාතුසද්දෙව.
ධීතු ශබ්දයෙන් ද දුහිතු ශබ්දයෙන් ද දුහිතෘන් කියත් —

උකාරන්තං —

| | |
|---|---|
| ජම්බූ | ජම්බූ, ජම්බුයො |
| (භෙ) ජම්බු | (භොතී) ජම්බූ, ජම්බුයො |
| ජම්බුං | ජම්බූ, ජම්බුයො |
| ජම්බුයා | ජම්බූහි, ජම්බූභි |
| ජම්බුයා | ජම්බූහි, ජම්බූභි |
| ජම්බුයා | ජම්බූනං |
| ජම්බුයා | ජම්බූහි, ජම්බූභි |
| ජම්බුයා | ජම්බූනං |
| ජම්බුයං, ජම්බුයා | ජම්බූසු |

ජම්බු ශබ්දයෙන් දඹ කියත් —

"එවං වධූ ච සරභූ සරබූ සුතනූ චමූ
වාමූරූ නාගනාසූරූ සමානි බලූ ජම්බුයා"

ඌකාරන්තං —

සාසුස්සු රත්ති නදී යාගු, මාතු ධීතු දුහිතාපි
ජම්බූ අජාදි නාගරාදි, මාතුලානී සඛාදි ච.

හොති මාණවිකාදි, ගුණවතී මහතීත්ථියං
ගහපතානී මේධාවිනී ධම්මචාරිණී සඞ්ගහො —

ඉත්ථිලිඞ්ගං.

| | |
|---|---|
| චිත්තං | චිත්තා, චිත්තානි |
| (භෙ) චිත්ත, චිත්තා (භවන්තානි) | චිත්තානි |
| චිත්තං | චිත්තෙ, චිත්තානි |
| චිත්තෙන | චිත්තෙහි, චිත්තෙභි |
| චිත්තෙන | චිත්තෙහි, චිත්තෙභි |
| චිත්තාය, චිත්තස්ස | චිත්තානං |
| චිත්තා, චිත්තම්හා, චිත්තස්මා | චිත්තෙහි, චිත්තෙභි |
| චිත්තස්ස | චිත්තානං |
| චිත්තෙ, චිත්තම්හි, චිත්තස්මිං | චිත්තෙසු |

චිත්ත ශබ්දයේන් සිත කියත් —

* වධූ, පතිකුලයට ගිය ස්ත්‍රී ය; සරභූ, එනම් මහානදි ය; සරබූ, සිකනල් ය; සුතනූ, සුන්දරාඞ්ග ඇත්ති ය; චමූ, සෙනා ය; වාමූරූ, මනා වූ වටොර ඇත්තී ය; නාගනාසූරූ, ඇත්සොඬට බඳු වටොර ඇත්තී ය; (යන මේ ශබ්දයෝ); එවං, මෙසේ; ජම්බුයා, ජම්බු ශබ්දය හා; සමානි බලූ, (රූපනය හෙයින්) සමානයෝ මැ යි.

"පුඤ්ඤපාපඵලරූපසාධනං, සොතසානසුඛදුක්ඛකාරණං
දානසීලධනඣානලොචනං, මූලකූලබලජාලමඞ්ගලං * ෴

නලිනලිඞ්ගමුඛඞ්ගජලම්බුජං, පුලිනධඤ්ඤහිරඤ්ඤපදාමතං
පදුමපණ්ණසුසානවනායුධං, හදයචීවරවත්ථකුලින්ද්‍රියං † ෴

නයනවදනයානොදානසොපානපානං
භවනභුවනලොහාලාතතුණ්ඩණ්ඩපීඨං
කරණමරණඤාණාරම්මණාරඤ්ඤතාණං
තගරනගරතීරච්ඡත්තච්ඡිද්දොදකානි" ‡ ෴

ඉච්චාදීනි චිත්තසද්දසමානි.

---

* පුඤ්ඤ, කුශල ය; පාප, අකුශල ය; ඵල, විපාක හෝ වෘක්ෂාදීන්ගේ ඵල ය; රූප, පෘථිව්‍යාදිරූප හෝ වර්ණායතන ය; සාධන, කර්මාදි කාරක හෝ සිද්ධකිරීම ය; සොත, කන ය; සාන, නාස ය; සුඛ, සුව ය; දුක්ඛ, දුක ය; කාරණ, හෙතු ය; දාන, පරිත්‍යාග ය; සීල, පඤ්චශීලාදි ය; ධන, මුක්තාමාණික්‍යාදි වස්තු ය; ඣාන, ප්‍රථමධ්‍යානාදි ය; ලොචන, ඇස ය; මූල, මුල් ය; කූල, ඉවුර ය; බල, ශක්ති ය; ජාල, දැල ය; මඞ්ගල, අභිවෘද්ධිකාරණ ය.

† නලින, පද්ම ය; ලිඞ්ග, නිමිත්ත හෝ ප්‍රාතිපදික ය; මුඛ, මුහුණ ය; අඞ්ග, අවයව ය; ජල, දිය ය; අම්බුජ, පියුම ය; පුලින, වැලි ය; ධඤ්ඤ, ශාල්‍යාදිධාන්‍ය ය; හිරඤ්ඤ, මසුරන් ය; පද, නාමපදාදිය හෝ පිහිට ය; අමත; නිර්වාණ ය හෝ දිව්‍යභොජන ය; පදුම, පියුම් ය; පණ්ණ, පත්‍ර ය; සුසාන, සොහොන ය; වන, අරණ්‍යය හෝ ජල ය; ආයුධ, ඛඩ්ගාදිආයුධ ය; හදය, හෘදයවස්තුව හෝ චිත්ත ය; චීවර, සිවුර ය; වත්ථ, වස්ත්‍ර ය; කුල, ක්ෂත්‍රියාදිකුල හෝ සවජාතිකාසමූහ ය; ඉන්ද්‍රිය, චක්ෂුරාදි ඉන්ද්‍රිය ය.

‡ නයන, ඇස යː වදන, මුහුණ ය; යාන, (ගැල් ආදි,) වාහන ය; උදාන, සෞමනස්‍යමයවචන ය; සොපාන, හිණ ය; පාන, (ආම්‍රාදි) පාන ය; භවන, රාජභවනාදිගෘහ යː භුවන, ලොක ය; ලොහ (තාම්‍රාදි) ලොහ යː අලාත, පෙනහෙලි ය; තුණ්ඩ, මුවතුඩ ය; අණ්ඩ, බීජ ය; පීඨ, පුටු ය; කරණ, සාධකතම ය; මරණ, කාල ක්‍රියා ය; ඤාණ, නුවණ ය; ආරම්මණ, රූපාදිඅරමුණු ය; අරඤ්ඤ, වන ය; තාණං, රක්ෂා ය; තගර, තුවරලා ය; නගර, රාජධානි ය; තීර, (ගංගෝආදීන්ගේ) තෙර ය; ඡත්ත, ආතපත්‍ර ය; ඡිද්ද, සිදුරු ය; උදක, ජල ය.

| | |
|---|---|
| මනං | මනා, මනානි |
| (හෙ) මන, මනා, (භවන්තානි) | මනානි |
| මනං | මනෙ, මනානි |
| මනසා, මනෙන | මනෙහි, මනෙභි |
| මනසා, මනෙන | මනෙහි, මනෙභි |
| මනසො, මනස්ස | මනානං |
| මනසා, මනා, මනම්හා, මනස්මා | මනෙහි, මනෙභි |
| මනසො, මනස්ස | මනානං |
| මනසි, මනෙ, මනම්හි, මනස්මිං | මනෙසු |

මන ශබ්දයෙන් මනස කියත් —

"මනං සිරං උරං තෙජං රජං ඔජං වයං පයං
යසං තපං වචං චෙතං එවමාදි මනොගණො." *

"මනො තමො තපො තෙජො වචො ඔජො උරො සිරො
රජො යසො පයො චෙතො සරො වාසො වයො අයො." †

"ජලාසයෙ සරො හොති අයො ලොහෙ යදක්ඛයෙ
වයො ඤෙය්‍යා පටෙ වාසො මනෙ චෙතො මනාදිසු." ‡

ඉච්චාදයො මනසදිසා.

---

* මනං, සිත ය; සිරං, හිස ය; උරං, ළය ය; තෙජං, තෙජස ය; රජං, රජස ය; ඔජං, ඔජස ය; වයං, වයස ය; පයං, ජලය හෝ කිරි ය; යසං, කීර්තිය හෝ පරිවාරාදිය; තපං, තපසය; වචං, තෙපුල ය; චෙතං, සිත ය යන; එවමාදි, මේ ආදි (ශබ්දගණය) තෙම; මනොගණො, මනොගණ නමි.

† තමො, අඳුරු ය; සරො, විල ය; වාසො, වස්ත්‍ර ය; අයො යකඩ ය; (සෙස්ස පෙර කී අර්ථ මැයි.)

‡ යදි, ඉදින්; සරො, සරශබ්දය තෙම; ජලාසයෙ හොති, විලෙහි වේ ද; අයො, අයශබ්දය තෙම; ලොහෙ, කාලලොහයෙහි (යකඩෙහි වේ ද); වයො, වයශබ්දය තෙම; අක්ඛයෙ, ක්ෂයාව යෙන් පිටත්හි (ශරීරාවස්ථායෙහි වේ ද); වාසො, වාසශබ්දය තෙම; පටෙ, වස්ත්‍රයෙහි (වේ ද); චෙතො, චෙතශබ්දය තෙම; මනෙ, සිතෙහි (වේ ද); මනාදිසු ඤෙය්‍යා, (එකල්හි) මනාදි ශබ්දයන් කෙරෙහි ලා දතයුත්තෝ ය. මේ නියමයෙන් බාණාදි වාචී සරශබ්දය ද සුඛවාචී අයශබ්දය ද ක්ෂයවාචී වයශබ්දය ද

| | |
|---|---|
| ගුණවං | ගුණවන්තා, ගුණවන්තානි |
| (හෙ) ගුණවං, ගුණව, ගුණවා | (භවන්තානි) ගුණවන්තා, ගුණවන්තානි |
| ගුණවන්තං | ගුණවන්තෙ, ගුණවන්තානි |
| ගුණවතා, ගුණවන්තෙන | ගුණවන්තෙහි, ගුණවන්තෙභි |
| ගුණවතා, ගුණවන්තෙන | ගුණවන්තෙහි, ගුණවන්තෙභි |
| ගුණවතො, ගුණවන්තස්ස | ගුණවතං, ගුණවන්තානං |
| ගුණවතා, ගුණවන්තම්හා, ගුණවන්තස්මා | ගුණවන්තෙහි, ගුණවන්තෙභි |
| ගුණවතො, ගුණවන්තස්ස | ගුණවතං, ගුණවන්තානං |
| ගුණවති, ගුණවන්තෙ, ගුණවන්තම්හි, ගුණවන්තස්මිං | ගුණවන්තෙසු |

**ගුණවන්තු ශබ්දයෙන් ගුණවත් නපුංසකවාච්‍යයන් කියත්.**

---

| | |
|---|---|
| ගච්ඡං | ගච්ඡන්තා, ගච්ඡන්තානි |
| (හෙ) ගච්ඡං, ගච්ඡ, ගච්ඡා | (භවන්තානි) ගච්ඡන්තා, ගච්ඡන්තානි |
| ගච්ඡන්තං | ගච්ඡන්තෙ, ගච්ඡන්තානි |
| ගච්ඡතා, ගච්ඡන්තෙන | ගච්ඡන්තෙහි, ගච්ඡන්තෙභි |
| ගච්ඡතා, ගච්ඡන්තෙන | ගච්ඡන්තෙහි, ගච්ඡන්තෙභි |
| ගච්ඡතො, ගච්ඡන්තස්ස | ගච්ඡතං, ගච්ඡන්තානං |
| ගච්ඡතා, ගච්ඡන්තම්හා, ගච්ඡන්තස්මා | ගච්ඡන්තෙහි, ගච්ඡන්තෙභි |
| ගච්ඡතො, ගච්ඡන්තස්ස | ගච්ඡතං, ගච්ඡන්තානං |
| ගච්ඡති, ගච්ඡන්තෙ, ගච්ඡන්තම්හි, ගච්ඡන්තස්මිං | ගච්ඡන්තෙසු |

**ගච්ඡන්ත ශබ්දයෙන් යන්තා වූ නපුංසකවාච්‍යයන් කියත් —**
අකාරාන්තං.

---

නිවාසවාචී වාසශබ්දය ද රාජවිශෙෂවාචී චෙතශබ්දය ද මතාදීන් කෙරෙහි ලා නො හදරනු ලැබෙති යි දක්වූහ.

මුගලන්වියරණෙහි **"සරවණ්ණාසවාසචෙතා ජලාසයාකාබ්ජලොහපටමණෙසු"** යන ගණසූත්‍රයෙන් මේ ව්‍යවච්ඡේදය සඞ්ගෘහිත යි.

| | | |
|---|---|---|
| අට්ඨි | | අට්ඨීනි, අට්ඨී |
| (හෙ) අට්ඨි | (භවන්තානි) | අට්ඨීනි, අට්ඨී |
| අට්ඨිං | | අට්ඨීනි, අට්ඨී |
| අට්ඨිනා | | අට්ඨීහි, අට්ඨීභි |
| අට්ඨිනා | | අට්ඨීහි, අට්ඨීභි |
| අට්ඨිනො, අට්ඨිස්ස | | අට්ඨීනං |
| අට්ඨිනා, අට්ඨිම්හා, අට්ඨිස්මා | | අට්ඨීහි, අට්ඨීභි |
| අට්ඨිනො, අට්ඨිස්ස | | අට්ඨීනං |
| අට්ඨිනි, අට්ඨිම්හි, අට්ඨිස්මිං | | අට්ඨීසු |

අට්ඨි ශබ්දයෙන් ඇට කියත් ——

එවං සප්පි දධි වාරි අක්ඛි අච්ඡි අච්චි ඉච්චාදයො අට්ඨිසද්දසමා. *

ඉකාරන්තං.

---

| | | |
|---|---|---|
| දණ්ඩි | | දණ්ඩීනි, දණ්ඩී |
| (හෙ) දණ්ඩි | (භවන්තානි) | දණ්ඩීනි, දණ්ඩී |
| දණ්ඩිං | | දණ්ඩීනි, දණ්ඩී |
| දණ්ඩිනා | | දණ්ඩීහි, දණ්ඩීභි |
| දණ්ඩිනා | | දණ්ඩීහි, දණ්ඩීභි |
| දණ්ඩිනො, දණ්ඩිස්ස | | දණ්ඩීනං |
| දණ්ඩිනා, දණ්ඩිම්හා, දණ්ඩිස්මා | | දණ්ඩීහි, දණ්ඩීභි |
| දණ්ඩිනො, දණ්ඩිස්ස | | දණ්ඩීනං |
| දණ්ඩිනි, දණ්ඩිම්හි, දණ්ඩිස්මිං | | දණ්ඩීසු |

දණ්ඩි ශබ්දයෙන් දඬුගත් නපුංසකවාච්‍යයන් කියත් ——

ඊකාරන්තං.

---

| | | |
|---|---|---|
| ආයු | | ආයූනි, ආයූ |
| (හෙ) ආයු | (භවන්තානි) | ආයූනි, ආයූ |
| ආයුං | | ආයූනි, ආයූ |
| ආයුනා | | ආයූහි, ආයූභි |
| ආයුනා | | ආයූහි, ආයූභි |
| ආයුනො, ආයුස්ස | | ආයූනං |
| ආයුනා, ආයුම්හා, ආයුස්මා | | ආයූහි ආයූභි |
| ආයුනො, ආයුස්ස | | ආයූනං |
| ආයුම්හි, ආයුස්මිං | | ආයුසු, ආයූසු |

ආයු ශබ්දයෙන් ආයුෂය කියත් ——

---

* සප්පි, කාලව ය; දධි, දිහි ය; වාරි, ජල ය; අක්ඛි, ඇස ය; අච්ඡි, ඇස ය; අච්චි, ගිනිසිළු ය.

එවං චකඛු වසු ධනු දරු තිපු මධු සිඞගු හිඞගු වතථු මතථු ජතු අමබු අසසු ආදයො ආයුසදදසමා * — උකාරනතා.

---

චිතතං මිතාදි ගුණවං ගවජං අටඨි ච දණඩි ච
ආයු ඉචෙචව සංඛෙපා සදදා තතථ නපුංසකෙ.

නපුංසකලිඞගා.

---

අථ සබබනාමානි වුචචනෙත.

"සබබ කතර කතම උභය ඉතර අඤඤ අඤඤතර අඤඤතම පුබබ පර අපර දකඛිණ උතතර එක ය ත එත ඉම අමු කිං තුමහ අමහ" ඉති සබබනාමානි.

පුමෙ

| | |
|---|---|
| සබෙබා | සබෙබ |
| (හෙ) සබබ, සබබා (භවනෙතා) | සබෙබ |
| සබබං | සබෙබ |
| සබෙබන | සබෙබහි, සබෙබභි |
| සබෙබන | සබෙබහි, සබෙබභි |
| සබබසස | සබෙබසං, සබෙබසානං |
| සබබමහා, සබබසමා | සබෙබහි, සබෙබභි |
| සබබසස | සබෙබසං, සබෙබසානං |
| සබබමහි, සබබසමිං | සබෙබසු |

ඉතථියං

| | |
|---|---|
| සබබා | සබබා, සබබායො |
| (හෙ) සබෙබ (භොථ) | සබබා, සබබායො |
| සබබං | සබබා, සබබායො |
| සබබාය | සබබාහි, සබබාභි |
| සබබාය | සබබාහි, සබබාභි |
| සබබසසා, සබබාය | සබබාසං, සබබාසානං |
| සබබාය | සබබාහි, සබබාභි |
| සබබසසා, සබබාය | සබබාසං, සබබාසානං |
| සබබසසං, සබබායං | සබබාසු |

---

* චකඛු, ඇස ය; වසු, ධන ය; ධනු, දුනු ය; දරු, දව ය; තිපු, තුඹ ය (ඊයම්); මධු, මී ය; සිඞගු, සුඟු ය; හිඞගු, ඉඟුරු හෝ පෙරුංකායම් ය; වතථු, පුණ්‍යක්‍රියාවසතු ආදී ය; මතථු, දීපෙරලිදිය; ජතු, ලා ය; අමබු, දිය; අසසු, කඳුළු ය.

### නපුංසකෙ

| | |
|---|---|
| සබ්බං | සබ්බානි |
| (හෙ) සබ්බ, සබ්බා (භවන්තානි) | සබ්බානි |
| සබ්බං | සබ්බානි |
| සබ්බෙන | සබ්බෙභි, සබ්බෙහි |
| සබ්බෙන | සබ්බෙභි, සබ්බෙහි |
| සබ්බස්ස | සබ්බෙසං, සබ්බෙසානං |
| සබ්බම්හා, සබ්බස්මා | සබ්බෙභි, සබ්බෙහි |
| සබ්බස්ස | සබ්බෙසං, සබ්බෙසානං |
| සබ්බම්හි, සබ්බස්මිං | සබ්බෙසු |

සබ්බ ශබ්දයෙන් සියල්ල කියත්

එවං කතර කතම උභය ඉතර අඤ්ඤ අඤ්ඤතර අඤ්ඤතම සඥා.

---

### පුමෙ

| | |
|---|---|
| පුබ්බො | පුබ්බෙ |
| (හෙ) පුබ්බ, පුබ්බා (භවන්තො) | පුබ්බෙ |
| පුබ්බං | පුබ්බෙ |
| පුබ්බෙන | පුබ්බෙභි, පුබ්බෙහි |
| පුබ්බෙන | පුබ්බෙභි, පුබ්බෙහි |
| පුබ්බස්ස | පුබ්බෙසං, පුබ්බෙසානං |
| පුබ්බා, පුබ්බම්හා, පුබ්බස්මා | පුබ්බෙභි, පුබ්බෙහි |
| පුබ්බස්ස | පුබ්බෙසං, පුබ්බෙසානං |
| පුබ්බෙ, පුබ්බම්හි, පුබ්බස්මිං | පුබ්බෙසු |

### ඉත්ථියං

| | |
|---|---|
| පුබ්බා | පුබ්බා, පුබ්බායො |
| (හෙ) පුබ්බා (භොතී) | පුබ්බා, පුබ්බායො |
| පුබ්බං | පුබ්බා, පුබ්බායො |
| පුබ්බාය | පුබ්බාභි, පුබ්බාහි |
| පුබ්බාය | පුබ්බාභි, පුබ්බාහි |
| පුබ්බස්සා, පුබ්බාය | පුබ්බාසං, පුබ්බාසානං |
| පුබ්බාය | පුබ්බාභි, පුබ්බාහි, |
| පුබ්බස්සා, පුබ්බාය | පුබ්බාසං, පුබ්බාසානං |
| පුබ්බස්සං, පුබ්බායං | පුබ්බාසු |

නපුංසකෙ

පුබ්බං | පුබ්බානි
(හෙ) පුබ්බ, පුබ්බා (භවන්තානි) | පුබ්බානි
පුබ්බං | පුබ්බානි
පුබ්බෙන | පුබ්බෙහි, පුබ්බෙභි
පුබ්බෙන | පුබ්බෙහි, පුබ්බෙභි
පුබ්බස්ස | පුබ්බෙසං, පුබ්බෙසානං
පුබ්බා, පුබ්බම්හා, පුබ්බස්මා | පුබ්බෙහි, පුබ්බෙභි
පුබ්බස්ස | පුබ්බෙසං, පුබ්බෙසානං
පුබ්බෙ, පුබ්බම්හි, පුබ්බස්මිං | පුබ්බෙසු

පුබ්බ ශබ්දයෙන් පූර්වය කියත්

එවං පරාපරදක්ඛිණුත්තරසද්දා

---

පුමෙ

එකො | එකෙ
එකං | එකෙ
එකෙන | එකෙහි, එකෙභි
එකෙන | එකෙහි, එකෙභි
එකස්ස | එකෙසං, එකෙසානං
එකම්හා, එකස්මා | එකෙහි, එකෙභි
එකස්ස | එකෙසං, එකෙසානං
එකම්හි, එකස්මිං | එකෙසු

ඉත්ථියං

එකා | එකා, එකායො
එකං | එකා, එකායො
එකාය | එකාහි, එකාභි
එකාය | එකාහි, එකාභි
එකස්සා, එකාය | එකාසං, එකාසානං
එකාය | එකාහි, එකාභි
එකස්සා, එකාය | එකාසං, එකාසානං
එකස්සං, එකායං | එකාසු

නපුංසකෙ

එකං | එකෙ, එකානි
එකං | එකෙ, එකානි
එකෙන | එකෙහි, එකෙභි
එකෙන | එකෙහි, එකෙභි
එකස්ස | එකෙසං, එකෙසානං
එකම්හා, එකස්මා | එකෙහි, එකෙභි
එකස්ස | එකෙසං, එකෙසානං
එකම්හි, එකස්මිං | එකෙසු

එක ශබ්දයෙන් සංඛ්‍යා ය අතුල්‍ය ය අන්‍ය ය අසහාය ය යන අර්ථ සතරක් කියත්.

### පුමෙ

| | |
|---|---|
| යො | යෙ |
| යං | යෙ |
| යෙන | යෙහි, යෙභි |
| යෙන | යෙහි, යෙභි |
| යස්ස | යෙසං, යෙසානං |
| යම්හා, යස්මා | යෙහි, යෙභි |
| යස්ස | යෙසං, යෙසානං |
| යම්හි, යස්මිං | යෙසු |

### ඉත්ථියං

| | |
|---|---|
| යා | යා, යායො |
| යං | යා, යායො |
| යාය | යාහි, යාභි |
| යාය | යාහි, යාභි |
| යස්සා, යාය | යාසං, යාසානං |
| යාය | යාහි, යාභි |
| යස්සා, යාය | යාසං, යාසානං |
| යස්සං, යායං | යාසු |

### නපුංසකෙ

| | |
|---|---|
| යං | යෙ, යානි |
| යං | යෙ, යානි |
| යෙන | යෙහි, යෙභි |
| යෙන | යෙහි, යෙභි |
| යස්ස | යෙසං, යෙසානං |
| යම්හා, යස්මා | යෙහි, යෙභි |
| යස්ස | යෙසං, යෙසානං |
| යම්හි, යස්මිං | යෙසු |

ය ශබ්දයෙන් යමෙක යන අර්ථ කියත් –

---

### පුමෙ

| | |
|---|---|
| සො | තෙ, නෙ |
| තං, නං | තෙ, නෙ |
| තෙන, නෙන | තෙහි, නෙහි, තෙභි, නෙභි |
| තෙන, නෙන | තෙහි, නෙහි, තෙභි, නෙභි |
| තස්ස, නස්ස | තෙසං, තෙසානං, නෙසං, නෙසානං |
| තම්හා, නම්හා, තස්මා, නස්මා | තෙහි, නෙහි, තෙභි, නෙභි |
| තස්ස නස්ස | තෙසං, තෙසානං, නෙසං, නෙසානං |
| තම්හි, නම්හි, තස්මිං, නස්මිං | තෙසු, නෙසු |

ඉත්ථියං

| | |
|---|---|
| සා | තා, තායො, නා, නායො |
| තං, නං | තා, තායො, නා, නායො |
| තාය, නාය | තාභි, නාභි, තාහි, නාහි |
| තාය, නාය | තාභි, නාභි, තාහි, නාහි |
| තිස්සාය, තිස්සා, තස්සා, තාය | තාසං, තාසානං |
| තාය, නාය | තාභි, නාභි, තාහි, නාහි |
| තිස්සාය, තිස්සා, තස්සා, තාය | තාසං, තාසානං |
| තිස්සං, තස්සං, තායං | තාසු |

නපුංසකෙ

| | |
|---|---|
| තං, නං | තෙ, තානි, නෙ, නානි |
| තං, නං | තෙ, තානි, නෙ, නානි |
| තෙන, නෙන | තෙභි, නෙභි, තෙහි, නෙහි |
| තෙන, නෙන | තෙභි, නෙභි, තෙහි, නෙහි |
| තස්ස, නස්ස | තෙසං, තෙසානං, නෙසං, නෙසානං |
| තම්හා, නම්හා, තස්මා, නස්මා | තෙභි, නෙභි, තෙහි, නෙහි |
| තස්ස, නස්ස | තෙසං, තෙසානං, නෙසං, නෙසානං |
| තම්හි, නම්හි, තස්මිං, නස්මිං | තෙසු, නෙසු |

ත ශබ්දයෙන් හේ ය යන අර්ථ කියත් —

---

පුමෙ

| | |
|---|---|
| එසො | එතෙ |
| එතං | එතෙ |
| එතෙන | එතෙභි, එතෙහි |
| එතෙන | එතෙභි, එතෙහි |
| එතස්ස | එතෙසං, එතෙසානං |
| එතම්හා, එතස්මා | එතෙභි, එතෙහි |
| එතස්ස | එතෙසං, එතෙසානං |
| එතම්හි, එතස්මිං | එතෙසු |

ඉත්ථියං

| | |
|---|---|
| එසා | එතා, එතායො |
| එතං | එතා, එතායො |
| එතාය | එතාභි, එතාහි |
| එතාය | එතාභි, එතාහි |
| එතිස්සාය, එතිස්සා, එතාය | එතාසං, එතාසානං |
| එතාය | එතාභි, එතාහි |
| එතිස්සාය, එතිස්සා, එතාය | එතාසං, එතාසානං |
| එතිස්සං, එතස්සං, එතායං | එතාසු |

### නපුංසකෙ

| | |
|---|---|
| එතං | එතෙ, එතානි |
| එතං | එතෙ, එතානි |
| එතෙන | එතෙහි, එතෙභි |
| එතෙන | එතෙහි, එතෙභි |
| එතස්ස | එතෙසං, එතෙසානං |
| එතම්හා, එතස්මා | එතෙහි, එතෙභි |
| එතස්ස | එතෙසං, එතෙසානං |
| එතම්හි, එතස්මිං | එතෙසු |

**එත ශබ්දයෙන් මේ ය * යන අර්ථ කියත්**

---

### පුමෙ

| | |
|---|---|
| අයං | ඉමෙ |
| ඉමං | ඉමෙ |
| අනෙන, ඉමිනා | එහි, එභි, ඉමෙහි, ඉමෙභි |
| අනෙන, ඉමිනා | එහි, එභි, ඉමෙහි, ඉමෙභි |
| අස්ස, ඉමස්ස | එසං, එසානං, ඉමෙසං, ඉමෙසානං |
| අස්මා, ඉමම්හා, ඉමස්මා | එහි, එභි, ඉමෙහි, ඉමෙභි |
| අස්ස, ඉමස්ස, | එසං, එසානං, ඉමෙසං, ඉමෙසානං |
| අස්මිං, ඉමම්හි, ඉමස්මිං | එසු, ඉමෙසු |

### ඉත්ථියං

| | |
|---|---|
| අයං | ඉමා, ඉමායො |
| ඉමං | ඉමා, ඉමායො |
| ඉමාය | ඉමාහි, ඉමාභි |
| ඉමාය | ඉමාහි, ඉමාභි |
| අස්සාය, අස්සා, ඉමිස්සාය, ඉමිස්සා, ඉමාය | ඉමාසං, ඉමාසානං |
| ඉමාය | ඉමාහි, ඉමාභි |
| අස්සාය, අස්සා, ඉමිස්සාය, ඉමිස්සා, ඉමාය | ඉමාසං, ඉමාසානං |
| අස්සං, ඉමිස්සං, ඉමායං | ඉමාසු |

---

* එත ශබ්දය සමීපවාචී ය.

### නපුංසකෙ

| | |
|---|---|
| ඉදං, ඉමං | ඉමෙ, ඉමානි |
| ඉදං, ඉමං | ඉමෙ, ඉමානි |
| අනෙන, ඉමිනා | එහි, එභි, ඉමෙහි, ඉමෙභි |
| අනෙන, ඉමිනා | එහි, එභි, ඉමෙහි, ඉමෙභි |
| අස්ස, ඉමස්ස | එසං, එසානං, ඉමෙසං, ඉමෙසානං |
| අස්මා, ඉමම්හා, ඉමස්මා | එහි, එභි, ඉමෙහි, ඉමෙභි |
| අස්ස, ඉමස්ස | එසං, එසානං, ඉමෙසං, ඉමෙසානං |
| අස්මිං, ඉමම්හි, ඉමස්මිං | එසු, ඉමෙසු |

ඉම ශබ්දයෙන් මේ ය* යන අර්ථ කියත්.

---

### පුමෙ

| | |
|---|---|
| අසු, අමුකො, අමු | අමූ, අමුයො |
| අමුං | අමූ, අමුයො |
| අමුනා | අමූහි, අමූභි |
| අමුනා | අමූහි, අමූභි |
| අමුනො, අමුස්ස | අමූසං, අමූසානං |
| අමුනා, අමුම්හා, අමුස්මා | අමූහි, අමූභි |
| අමුනො, අමුස්ස | අමූසං, අමූසානං |
| අමුම්හි, අමුස්මිං | අමූසු |

### ඉත්ථියං

| | |
|---|---|
| අසු | අමූ, අමුයො |
| අමුං | අමූ, අමුයො |
| අමුයා | අමූහි, අමූභි |
| අමුයා | අමූහි, අමූභි |
| අමුස්සා, අමුයා | අමූසං, අමූසානං |
| අමුයා | අමූහි, අමූභි |
| අමුස්සා, අමුයා | අමූසං, අමූසානං |
| අමුස්සං, අමුයං | අමූසු |

---

* ඉම ශබ්දය අත්‍යන්තසමීපවාචී ය.

### නපුංසකෙ

| | |
|---|---|
| අදුං | අමූ, අමූනි |
| අදුං | අමූ, අමූනි |
| අමුනා | අමූහි, අමූභි |
| අමුනා | අමූහි, අමූභි |
| අමුනො, අමුස්ස | අමූසං, අමූසානං |
| අමුම්හා, අමුස්මා | අමූහි, අමූභි |
| අමුනො, අමුස්ස | අමූසං, අමූසානං |
| අමුම්හි, අමුස්මිං | අමූසු |

අමු ශබ්දයෙන් මේ ය* යන අර්ථ කියත්

---

### පුමෙ

| | |
|---|---|
| කො | කෙ |
| කං | කෙ |
| කෙන | කෙහි, කෙභි |
| කෙන | කෙහි, කෙභි |
| කස්ස | කෙසං, කෙසානං |
| කම්හා, කස්මා | කෙහි, කෙභි |
| කස්ස | කෙසං, කෙසානං |
| කම්හි, කස්මිං | කෙසු |

### ඉත්ථියං

| | |
|---|---|
| කා | කා, කායො |
| කං | කා, කායො |
| කාය | කාහි, කාභි |
| කාය | කාහි, කාභි |
| කස්සා, කාය | කාසං, කාසානං |
| කාය | කාහි, කාභි |
| කස්සා, කාය | කාසං, කාසානං |
| කස්සං, කායං | කාසු |

---

* අමු ශබ්දය දූරවාචී ය.

## නපුංසක

| | |
|---|---|
| කිං | කෙ, කානි |
| කිං | කෙ, කානි |
| කෙන | කෙහි, කෙභි |
| කෙන | කෙහි, කෙභි |
| කස්ස | කෙසං, කෙසානං |
| කම්හා, කස්මා | කෙහි, කෙභි |
| කස්ස | කෙසං, කෙසානං |
| කම්හි, කස්මිං | කෙසු |

කිං ශබ්දයෙන් කිමෙක යන අර්ථ කියත්

---

| | |
|---|---|
| ත්වං, තුවං, අහං | තුම්හෙ, මයං, අම්හෙ |
| තං, තවං, තුවං, ත්වං, මං, මමං, | තුම්හාකං, තුම්හෙ, අම්හාකං, අම්හෙ |
| ත්වයා, තයා, මයා, | තුම්හෙහි, තුම්හෙභි, අම්හෙහි, අම්හෙභි |
| ත්වයා, තයා, මයා, | තුම්හෙහි, තුම්හෙභි, අම්හෙහි, අම්හෙභි |
| තව, තුය්හං, තුම්හං, මම, මය්හං, අම්හං, මමං | තුම්හාකං, තුම්හෙ, අම්හාකං, අම්හෙ |
| ත්වයා, තයා, මයා, | තුම්හෙහි, තුම්හෙභි, අම්හෙහි, අම්හෙභි |
| තව, තුය්හං, තුම්හං, මම, මය්හං, අම්හං, මමං | තුම්හාකං, තුම්හෙ, අම්හාකං, අම්හෙ |
| ත්වයි, තයි, මයි | තුම්හෙසු, අම්හෙසු |

තුම්හ ශබ්දයෙන් තෝ ය යන අර්ථ හා අම්හ ශබ්දයෙන් මම ය යන අර්ථ කියත්

---

"වො නො තෙ මෙති රූපානි පදනි පදතො යතො
තතො නාමිකපන්තීසු න තු වුත්තානි තානි මෙ *

---

* යතො, යම්හෙයකින්; වො නො තෙ මෙ ඉති වො නො තෙ මෙ යන; පදනි රූපානි; පදරූපයෝ; පදතො, පදයා කෙරෙන් (පරව වෙද්ද); තතො, එහෙයින්; මෙ, මා විසින්; තානි තු, ඒ රූපයෝ වනාහි; නාමිකපන්තීසු, (තුම්හ අම්හ) ශබ්ද යන්ගේ රූපපඞ්ක්තියෙහි; න වුත්තානි, නො කියනලද්දහ.

පච්චත්තෙ උපයොගෙ ච කරණෙ සම්පදානියෙ
සාමිස්ස වචනෙ චෙව වො නො සද්දා පවත්තන්ති * —

කරණෙ සම්පදානෙ ච සාමිඅත්ථෙ ච ආගතො
තෙ මෙ සද්දාති විඤ්ඤෙය්‍යො විඤ්ඤූනා නයදස්සිනා † —

සබ්බො පුබ්බො ච එකො ච ය ත එත ඉමං අමු
කිං තුම්හ අම්හාති ඉමෙ සබ්බනාමා තිලිඞ්ගිකා" —

---

### අථ සංඛ්‍යාසද්දා වුච්චන්තෙ.

එකසද්දො සබ්බාදිසු වුත්තොව, ද්වාදයො අට්ඨාරසන්තා බහුවචනන්තා, ද්විසද්දස්ස පඤ්චාදීනමට්ඨාරසන්තානඤ්ච තිලිඞ්ගෙපි සමානං රූපං —

දුවෙ, ද්වෙ. දුවෙ, ද්වෙ. ද්වීභි, ද්වීහි. කරණෙ:- ද්වීහි, ද්වීභි. දුවින්නං, ද්වින්නං. ද්වීහි, ද්වීභි. දුවින්නං, ද්වින්නං. ද්වීසු —

ද්වි ශබ්දයෙන් දෙදෙන යන අර්ථ කියත්.

පුමෙ:- තයො, තයො. තීහි, තීභි. කරණෙ:- තීහි, තීභි. තිණ්ණං, තිණ්ණන්නං. තීහි, තීභි. තිණ්ණං, තිණ්ණන්නං. තීසු —

ඉත්ථියං:- තිස්සො, තිස්සො. තීහි තීභි:- කරණෙ:- තීහි, තීභි. තිස්සන්නං. තීහි, තීභි. තිස්සන්නං. තීසු —

නපුංසකෙ:- තීණි. තීණි. තීහි, තීභි. කරණෙ:- තීහි, තීභි. තිණ්ණං, තිණ්ණන්නං. තීහි, තීභි. තිණ්ණං, තිණ්ණන්නං. තීසු —

ති ශබ්දයෙන් තුන්දෙන යන අර්ථ කියත්

---

* පච්චත්තෙ, ප්‍රථමායෙහි ද; උපයොගෙ ච, ද්විතීයායෙහි ද; කරණෙ, තෘතීයායෙහි ද; සම්පදානියෙ, චතුර්ථියෙහි ද; සාමිස්ස වචනෙ චෙව, ෂෂ්ඨියෙහි ද (බහුවචනයෙහි); වො නො සද්දා, වො යන රූපය හා නො යන රූපය තෙම; පවත්තන්ති, වැටේ.

† කරණෙ, තෘතීයායෙහි ද; සම්පදානෙ ච, චතුර්ථියෙහි ද; සාමිඅත්ථෙ ච, ෂෂ්ඨියෙහි ද (එකවචනයෙහි); තෙ මෙ සද්දා, තෙ යන රූපය හා මෙ යන රූපය තෙම; ආගතො ඉති, ආයේ යයි; නයදස්සිනා (පදරූපයන්ගේ) නය දක්නා වූ; විඤ්ඤූනා, ප්‍රාඥයා විසින්; විඤ්ඤෙය්‍යො, දතයුත්තේ ය.

පුමෙ:- චතුරො, චත්තාරො. චතුරො, චත්තාරො. චතුභි, චතුහි. කරණෙ:- චතුභි, චතුහි. චතුන්නං. චතුභි, චතුහි. චතුන්නං. චතූසු ––

ඉත්ථියං:- චතස්සො. චතස්සො. චතුභි, චතුහි. කරණෙ:- චතුභි, චතුහි. චතස්සන්නං. චතුභි, චතුහි. චතස්සන්නං. චතූසු ––

නපුංසකෙ:- චත්තාරි. චත්තාරි. චතුභි, චතුහි. කරණෙ:- චතුභි, චතුහි. චතුන්නං. චතුභි, චතුහි. චතුන්නං. චතූසු ––

**චතු ශබ්දයෙන් සතරදෙන යන අර්ථ කියත්.**

පඤ්ච. පඤ්ච. පඤ්චභි, පඤ්චහි. කරණෙ:- පඤ්චභි, පඤ්චහි. පඤ්චන්නං. පඤ්චභි, පඤ්චහි. පඤ්චන්නං. පඤ්චසු ––

**පඤ්ච ශබ්දයෙන් පස්දෙනෙක යන අර්ථ කියත්.**

එවං ඡ 6. සත්ත 7. අට්ඨ 8. නව 9. දස 10. එකාදස 11. ද්වාදස, බාරස 12. තෙරස, තෙළස 13. චුද්දස, චොද්දස, චතුද්දස 14. පන්නරස, පඤ්චදස 15. සොළස, සොරස 16. සත්තරස, සත්තදස 17. අට්ඨාරස, අට්ඨාදස 18 ––

එකූනවීසත්‍යාදයො ආ නවුතියා ඉත්ථිලිඞ්ගෙකවචනන්තා –– එකූනවීසති (19) රත්තීව.

එකූනවීසති. (භො) එකූනවීසති. එකූනවීසතිං. එකූනවීසතියා. කරණෙ. එකූනවීසතියා. එකූනවීසතියා. එකූනවීසතියා. එකූනවීසතියා. එකූනවීසතියං, එකූනවීසතියා ––

**එකූනවීසති ශබ්දයෙන් එකක් අඩු විස්සක් කියත්.**

එවං වීසති 20. එකවීසති 21. ද්වෙවීසති, ද්වාවීසති, බාවීසති 22. තෙවීසති 23. චතුවීසති 24. පඤ්ඤුවීසති, පඤ්චවීසති 25. ඡබ්බීසති 26. සත්තවීසති 27. අට්ඨවීසති 28. එකූනතිංසති 29 ––

එකූනතිංසා. (භො) එකූනතිංසෙ. එකූනතිංසං. එකූනතිංසාය. කරණෙ:- එකූනතිංසාය. එකූනතිංසාය. එකූනතිංසාය. එකූනතිංසාය. එකූනතිංසායං, එකූනතිංසාය ––

**එකූනතිංසා ශබ්දයෙන් එකක් අඩු තිසක් කියත්.**

තිංසති, තිංසා 30. එකතිංසති, එකතිංසා 31. ද්වත්තිංසති, ද්වත්තිංසා, බත්තිංසති, බත්තිංසා 32. තෙත්තිංසති, තෙත්තිංසා 33, චතුත්තිංසති, චතුත්තිංසා 34. පඤ්චතිංසති, පඤ්චතිංසා 35.

ඡත්තිංසති, ඡත්තිංසා 36. සත්තතිංසති, සත්තතිංසා 37. අට්ඨතිංසති. අට්ඨතිංසා 38. එකූනචත්තාලීසති, එකූනචත්තාලීසා, එකූනචත්තාරීසති, එකූනචත්තාරීසා 39. රත්තිකඤ්ඤසමා ~

චත්තාලීසති, චත්තාලීසා, චත්තාරීසති, චත්තාරීසා 40. එකචත්තාලීසති, එකචත්තාලීසා, එකචත්තාරීසති, එකචත්තාරීසා 41. ද්වෙචත්තාලීසති, ද්වෙචත්තාලීසා, ද්වෙචත්තාරීසති, ද්වෙචත්තාරීසා, ද්විචත්තාලීසති, ද්විචත්තාලීසා, ද්විචත්තාරීසති, ද්විචත්තාරීසා 42. තෙචත්තාලීසති, තෙචත්තාලීසා, තෙචත්තාරීසති, තෙචත්තාරීසා, තිචත්තාලීසති, තිචත්තාලීසා, තිචත්තාරීසති, තිචත්තාරීසා 43. චතුචත්තාලීසති, චතුචත්තලීසා, චතුචත්තාරීසති, චතුචත්තාරීසා 44. පඤ්චචත්තාලීසති, පඤ්චචත්තාලීසා, පඤ්චචත්තාරීසති, පඤ්චචත්තාරීසා 45. ඡචත්තාලීසති, ඡචත්තාලීසා, ඡචත්තාරීසති, ඡචත්තාරීසා 46. සත්තචත්තාලීසති, සත්තචත්තාලීසා, සත්තචත්තාරීසති, සත්තචත්තාරීසා 47. අට්ඨචත්තාලීසති, අට්ඨචත්තාලීසා, අට්ඨචත්තාරීසති, අට්ඨචත්තාරීසා 48. එකූනපඤ්ඤාසති, එකූනපඤ්ඤාසා 49. රත්තිකඤ්ඤසමා ~ පඤ්ඤාසා 50. (හො) පඤ්ඤාසෙ. පඤ්ඤාසං. ඉච්චාදි පුබ්බෙව ~ එවං එකපඤ්ඤාසා, එකපණ්ණාසා 51. ද්වෙපඤ්ඤාසා, ද්වෙපණ්ණාසා, ද්විපඤ්ඤාසා, ද්විපණ්ණාසා 52. තෙපඤ්ඤාසා, තෙපණ්ණාසා, තිපඤ්ඤාසා, තිපණ්ණාසා 53. චතුපඤ්ඤාසා, චතුපණ්ණාසා 54. පඤ්චපඤ්ඤාසා, පඤ්චපණ්ණාසා 55. ඡපඤ්ඤාසා, ඡපණ්ණාසා 56. සත්තපඤ්ඤාසා, සත්තපණ්ණාසා 57. අට්ඨපඤ්ඤාසා, අට්ඨපණ්ණාසා 58.

එකූනසට්ඨි 59. (හො) එකූනසිට්ඨි ඉච්චාදි රත්තිසඤ්ඤසමා ~

එවං සට්ඨි 60. එකසට්ඨි 61. ද්වාසට්ඨි, ද්විසට්ඨි 62. තෙසට්ඨි තිසට්ඨි 63. චතුසට්ඨි 64. පඤ්චසට්ඨි 65. ඡසට්ඨි 66. සත්තසට්ඨි 67. අට්ඨසට්ඨි 68. එකූනසත්තති, එකූනසත්තරි 69. සත්තති, සත්තරි 70. එකසත්තති, එකසත්තරි 71. ද්වෙසත්තති, ද්වාසත්තති, ද්විසත්තති, ද්වෙසත්තරි, ද්වාසත්තරි, ද්විසත්තරි 72. තෙසත්තති, තිසත්තති, තෙසත්තරි, තිසත්තරි 73. චතුසත්තති, චතුසත්තරි 74. පඤ්චසත්තති, පඤ්චසත්තරි 75. ඡසත්තති, ඡසත්තරි 76. සත්තසත්තති, සත්තසත්තරි 77. අට්ඨසත්තති, අට්ඨසත්තරි 78. එකූනාසීති 79. අසීති 80. එකාසීති 81. ද්වෙඅසීති, ද්වාසීති, ද්වියාසීති 82. තෙඅසීති, තියාසීති 83. චතුරාසීති 84. පඤ්චාසීති 85. ඡාසීති 86. සත්තාසීති 87. අට්ඨාසීති 88. එකූනනවුති 89. නවුති 90.

එකනවුති 91. ද්වෙනවුති, ද්වානවුති, ද්වීනවුති 92. තෙනවුති, තිනවුති 93. චතුනවුති 94. පඤ්චනවුති 95. ඡන්නවුති 96. සත්තනවුති 97. අට්ඨනවුති 98.

එකූනසතං 99. (හෝ) එකූනසත. එකූනසතං. එකූනසතෙන. කරණෙ:- එකූනසතෙන. එකූනසතස්ස. එකූනසතා, එකූනසතම්හා, එකූනසතස්මා. එකූනසතස්ස. එකූනසතෙ, එකූනසතම්හි, එකූනසතස්මිං ...

එවං සතතොප්පභුති යාව සතසහස්සං ... කොටි, පකොටි, කොටිප්පකොටි, අක්ඛොභිණියො ඉත්ථිලිඞ්ගෙකවචනන්තා ...

දසදසකං සතං නාම. දසසතං සහස්සං. දසසහස්සං නහුතං* දසනහුතං ලක්ඛං, සතසහස්සන්තිපි වුච්චති. ලක්ඛසතං කොටි. කොටිලක්ඛසතං පකොටි. පකොටිලක්ඛසතං කොටිප්පකොටි ...

එවං නහුතං, නින්නහුතං, අක්ඛොභිණී, බින්දු, අබ්බුදං, නිරබ්බුදං, අහහං, අබබං, අටටං, සොගන්ධිකං, උප්පලං, කුමුදං, පුණ්ඩරීකං, පදුමං, කථානං, මහාකථානං, අසංඛෙය්‍යන්ති යථාක්කමං සතලක්ඛගුණං වෙදිතබ්බං ...

කච්චායන නාමික රූපමාලා සමත්තා.

---

* "නවුතං" යි ත් පාඨ යි.

# ආඛ්‍යාත රූපමාලා

---

**නමො තස්ස භගවතො අරහතො**
**සම්මාසම්බුද්ධස්ස**

---

නාමෙන සහ සංයුත්තො පඨමො පුරිසො මතො
මජ්ඣිමො තුම්හසද්දෙන අම්හසද්දෙන උත්තමො ෴
සො තෙ ගච්ඡති ගච්ඡන්ති ත්වං වො ගච්ඡසි ගච්ඡථ
අහං ගච්ඡාමි ගච්ඡාම මයන්ත්‍යාදිනයෙ නයෙ ෴
ආරද්ධානිට්ඨිතං කිච්චං වත්තමානන්ති වුච්චති
වත්තමානසමීපඤ්ච වත්තමානමහි වුච්චති ෴

## වත්තමානා පච්චුප්පන්නෙ

**වත්තමානා - ති, අන්ති, සි, ථ, මි, ම — තෙ, අන්තෙ, සෙ, ව්හෙ, ඒ, මහෙ ෴**

| කත්තරි පරස්සපදෙ | | | | අත්තනොපදෙ | | | |
|---|---|---|---|---|---|---|---|
| (කත්තු) | (කම්ම) | (ක්‍රියා) | (පුරිස) | (කත්තු) | (කම්ම) | (ක්‍රියා) | (පුරිස) |
| සො | ඔදනං | පචති | පඨම | සො | ඔදනං | පචතෙ | පඨම |
| තෙ | ,, | පචන්ති | | තෙ | ,, | පචන්තෙ | |
| ත්වං | ,, | පචසි | මජ්ඣිම | ත්වං | ,, | පචසෙ | මජ්ඣිම |
| තුම්හෙ | ,, | පචථ | | තුම්හෙ | ,, | පචව්හෙ | |
| අහං | ,, | පචාමි | උත්තම | අහං | ,, | පචෙ | උත්තම |
| මයං | ,, | පචාම | | මයං | ,, | පචාමහෙ | |

### කම්මෙ

| (කත්තු) | (කම්ම) | (ක්‍රියා) | (පුරිස) |
|---|---|---|---|
| තෙන තයා මයා (වා) | සො (ඔදනො) | පචීයතෙ, පච්චතෙ | පඨම |
| ,, | තෙ | පචීයරෙ, පචීයන්තෙ, පච්චරෙ, පච්චන්තෙ | |
| ,, | ත්වං | පචීයසෙ, පච්චසෙ | මජ්ඣිම |
| ,, | තුම්හෙ | පචීයව්හෙ, පච්චව්හෙ | |
| ,, | අහං | පචීයෙ, පච්චෙ | උත්තම |
| ,, | මයං | පචීයාමහෙ, පච්චාමහෙ | |

පරස්සපදදෙසෙ

| | | | | |
|---|---|---|---|---|
| තෙන තයා මයා (වා) | සො (ඔදනො) | පචියති, පච්චති | } | පඨම |
| " | තෙ | පචියන්ති, පච්චන්ති | } | |
| " | ත්වං | පචියසි, පච්චසි | } | මජ්ඣිම |
| " | තුම්හෙ | පචියථ, පච්චථ | } | |
| " | අහං | පචියාමි, පච්චාමි | } | උත්තම |
| " | මයං | පචියාම, පච්චාම | } | |

භාවෙ – තෙන තයා මයා (වා) භූයති, භූයතෙ.

වත්තමානා විභත්ති

---

ආණත්‍යාසිට්ඨෙ'නුත්තකාලෙ පඤ්චමී

පඤ්චමී – තු, අන්තු, හි, ථ, මි, ම – තං, අන්තං, ස්සු, විහො, එ, ආමසෙ —

| කත්තරි පරස්සපදෙ | | | අත්තනොපදෙ | | |
|---|---|---|---|---|---|
| සො | ඔදනං | පචතු | සො | ඔදනං | පචතං |
| තෙ | " | පචන්තු | තෙ | " | පචන්තං |
| ත්වං | " | පච, පචාහි | ත්වං | " | පචස්සු |
| තුම්හෙ | " | පචථ | තුම්හෙ | " | පචවෙහො |
| අහං | " | පචාමි | අහං | " | පචෙ |
| මයං | " | පචාම | මයං | " | පචාමසෙ |

කම්මෙ

| | | |
|---|---|---|
| තෙන තයා මයා (වා) | සො (ඔදනො) | පචියතං, පච්චතං |
| " | තෙ | පචියන්තං, පච්චන්තං |
| " | ත්වං | පචියස්සු, පච්චස්සු |
| " | තුම්හෙ | පචියවෙහො පච්චවෙහො |
| " | අහං | පචියෙ, පච්චෙ |
| " | මයං | පචියාමසෙ, පච්චාමසෙ |

පරස්සපදදෙසෙ

| | | |
|---|---|---|
| තෙන තයා මයා (වා) | සො (ඔදනො) | පචියතු, පච්චතු |
| " | තෙ | පචියන්තු පච්චන්තු |
| " | ත්වං | පචිය, පච්ච, පචියාහි පච්චාහි |
| " | තුම්හෙ | පචියථ, පච්චථ |
| " | අහං | පචියාමි, පච්චාමි |
| " | මයං | පචියාම, පච්චාම |

භාවෙ – තෙන තයා මයා (වා) භූයතු, භූයතං —.

පඤ්චමී විභත්ති

## අනුමතිපරිකප්පත්ථෙසු සත්තමී

සත්තමී - එය්‍ය, එය්‍යුං, එය්‍යාසි, එය්‍යාථ, එය්‍යාමි, එය්‍යාම - එථ, එරං, එථො, එය්‍යව්හො, එය්‍යං, එය්‍යාම්හෙ —

| කත්තරි පරස්සපදෙ | | | අත්තනොපදෙ | | |
|---|---|---|---|---|---|
| සො | ඔදනං | පචෙ, පචෙය්‍ය | සො | ඔදනං | පචෙථ |
| තෙ | " | පචුං, පචෙය්‍යුං | තෙ | " | පචෙරං |
| ත්වං | " | පචෙ, පචෙය්‍යාසි | ත්වං | " | පචෙථො |
| තුම්හෙ | " | { පචෙය්‍යාථො, පචෙය්‍යාථ | තුම්හෙ | " | පචෙය්‍යව්හො |
| අහං | " | පචෙ, පචෙය්‍යාමි | අහං | " | පචෙය්‍යං |
| මයං | | { පචෙමු, පචෙය්‍යාමු පචෙම, පචෙය්‍යාම | මයං | " | පචෙය්‍යාම්හෙ |

### කම්මෙ

තෙන තයා මයා (වා) සො (ඔදනො) පචීයෙථ, පච්චෙථ
" තෙ පචීයෙරං, පච්චෙරං
" ත්වං පචීයෙථො, පච්චෙථො
" තුම්හෙ පචීයෙය්‍යව්හො, පච්චෙය්‍යව්හො
" අහං පචීයෙය්‍යං, පච්චෙය්‍යං
" මයං පචීයෙය්‍යාම්හෙ, පච්චෙය්‍යාම්හෙ

### පරස්සපදෙසෙ

තෙන තයා මයා (වා) සො (ඔදනො) පචීයෙ, පචීයෙය්‍ය,
- පච්චෙ, පච්චෙය්‍ය
" තෙ පචීයෙය්‍යුං, පච්චුං, පච්චෙය්‍යුං
" ත්වං පචීයෙය්‍යාසි, පච්චෙය්‍යාසි
" තුම්හෙ { පචීයෙය්‍යාථො, පචීයෙය්‍යාථ / පච්චෙය්‍යාථො, පච්චෙය්‍යාථ
" අහං පචීයෙය්‍යාමි, පච්චෙය්‍යාමි
" මයං පචීයෙය්‍යාම, පච්චෙය්‍යාම

භාවෙ - තෙන තයා මයා (වා) භූයෙ, භූයෙය්‍ය, භූයෙථ —

### සත්තමී විභත්ති

## අපච්චක්ඛ පරොක්ඛාතීතෙ

**පරොක්ඛා-අ. උ, එ, ත්ථ, අ, ම්හ-ත්ථ, රෙ, ත්ථො, ව්හො ඉ, ම්හෙ**

| කත්තරි පරස්සපදෙ | | | අත්තනොපදෙ | | |
|---|---|---|---|---|---|
| සො | ඔදනං | පපච | සො | ඔදනං | පපචිත්ථ, පපචත්ථ |
| තෙ | " | පපචු | තෙ | " | පපචිරෙ |
| ත්වං | " | පපචෙ | ත්වං | " | පපචිත්ථො |
| තුම්හෙ | " | පපචිත්ථ | තුම්හෙ | " | පපචිව්හො |
| අහං | " | පපච | අහං | " | පපචි |
| මයං | " | පපචිම්හ | මයං | " | පපචිම්හෙ |

කම්මෙ

| | | |
|---|---|---|
| තෙන තයා මයා (වා) | සො (ඔදනො) | පපච්චිත්ථ, පපච්චත්ථ |
| " | තෙ | පපච්චිරෙ |
| " | ත්වං | පපච්චිත්ථො, පපච්චත්ථො |
| " | තුම්හෙ | පපච්චිව්හො, පපච්චව්හො |
| " | අහං | පපච්චි |
| " | මයං | පපච්චිම්හෙ |

පරස්සපදදෙසෙ

| | | |
|---|---|---|
| තෙන තයා මයා (වා) | සො (ඔදනො) | පපච්ච |
| " | තෙ | පපච්චු |
| " | ත්වං | පපච්චෙ |
| " | තුම්හෙ | පපච්චිත්ථ |
| " | අහං | පපච්ච |
| " | මයං | පපච්චිම්හ |

භාවෙ – තෙන තයා මයා (වා) භූය, භූයිත්ථ, බභූය, බභූයිත්ථ

**පරොක්ඛා විභත්ති**

---

## හීයොප්පභුති පච්චක්ඛ හීයත්තනී

**හීයත්තනී-ආ, ඌ, ඔ, ත්ථ, අ, ම්හ - ත්ථ, ත්ථුං, සෙ, ව්හං, ඉං, ම්හසෙ**

| කත්තරි පරස්සපදෙ | | | අත්තනොපදෙ | | |
|---|---|---|---|---|---|
| සො | ඔදනං | අපච, පච, අපචා, පචා | සො | ඔදනං | අපචත්ථ, පචත්ථ |
| තෙ | " | අපචු, පචු, අපචූ, පචූ | තෙ | " | අපචත්ථුං, පචත්ථුං |
| ත්වං | " | අපචො, පචො | ත්වං | " | අපචසෙ, පචසෙ |
| තුම්හෙ | " | අපචත්ථ, පචත්ථ, අපචුත්ථ, පචුත්ථ | තුම්හෙ | " | අපචව්හං, පචව්හං |
| අහං | " | අපචං, පචං, අපච, පච | අහං | " | අපචිං, පචිං |
| මයං | " | අපචම්හ, පචම්හ, අපචම්හා, පචම්හා | මයං | " | අපචාම්හසෙ, පචාම්හසෙ |

### කම්මෙ

තෙන තයා මයා (වා) සො (ඔදනො) අපච්චත්ථ, පච්චත්ථ
,, තෙ අපච්චත්ථුං පච්චත්ථුං
,, ත්වං අපච්චසෙ, පච්චසෙ
,, තුම්හෙ අපච්චව්හං, පච්චව්හං
,, අහං අපච්චිං, පච්චිං
,, මයං අපච්චාම්හසෙ, පච්චාම්හසෙ

### පරස්සපදවසෙ

තෙන තයා මයා (වා) සො (ඔදනො) අපච්චා, පච්චා,
,, තෙ අපච්චූ, පච්චූ
,, ත්වං අපච්චො, පච්චො
,, තුම්හෙ අපච්චත්ථ, පච්චත්ථ
,, අහං අපච්ච, පච්ච
,, මයං අපච්චම්හා, පච්චම්හා

භාවෙ – තෙන තයා මයා (වා) අභූයත්ථ, භූයත්ථ, අභූයා, භූයා,
අභූයථ, භූයථ.

## හියත්තනී විභත්ති

---

## සම්පෙ'ජ්ජතනි

**අජ්ජතනි–ඊ, උං, ඔ, ත්ථ, ඉං, ම්හා– ආ, ඌ, සෙ, ව්හං, අ, ම්හෙ**

| කත්තරි පරස්සපදෙ | | | අත්තනොපදෙ | | |
|---|---|---|---|---|---|
| සො | ඔදනං | අපචි, පචි, අපචී, පචී | සො | ඔදනං | අපචා, පචා |
| තෙ | ,, | අපචිංසු, පචිංසු / අපචංසු, පචංසු / අපචුං, පචුං | තෙ | ,, | අපචූ, පචූ |
| ත්වං | ,, | අපචො, පචො | ත්වං | ,, | අපචිසෙ, පචිසෙ |
| තුම්හෙ | ,, | අපචත්ථ, පචත්ථ | තුම්හෙ | ,, | අපචිව්හං, පචිව්හං |
| අහං | ,, | අපචිං, පචිං | අහං | ,, | අපච, පච |
| මයං | ,, | අපචම්හා, පචම්හා | මයං | ,, | අපචිම්හෙ, පචිම්හෙ |

### කම්මෙ

තෙන තයා මයා (වා) සො (ඔදනො) අපච්චා, පච්චා
,, තෙ අපච්චූ, පච්චූ
,, ත්වං අපච්චිසෙ, පච්චිසෙ
,, තුම්හෙ අපච්චිව්හං, පච්චිව්හං
,, අහං අපච්ච, පච්ච
,, මයං අපච්චිම්හෙ, පච්චිම්හෙ

පරස්සපදදෙසෙ

තෙන තයා මයා(වා) සො ඔදනො අපච්චි, පච්චි, අපච්චී, පච්චී

| | | |
|---|---|---|
| ” | තෙ | අපච්චිංසු, පච්චිංසු, අපචචංසු, පචචංසු, අපචචුං, පචචුං |
| ” | ත්වං | අපචෙච්චා, පචෙච්චා |
| ” | තුම්හෙ | අපචචත්ථ, පචචත්ථ, |
| ” | අහං | අපච්චිං, පච්චිං |
| ” | මයං | අපචචම්හා, පචචම්හා |

භාවෙ – තෙන තයා මයා (වා) අභූයි, භූයි, අභූයා, භූයා ....

අජ්ජතනී විභත්ති

---

අනාගතෙ භවිස්සන්ති

**භවිස්සන්ති-ස්සති, ස්සන්ති, ස්සසි, ස්සථ, ස්සාමි, ස්සාම – ස්සතෙ ස්සන්තෙ, ස්සසෙ, ස්සව්හෙ, ස්සං, ස්සාමෙහ**

| කත්තරි පරස්සපදෙ | | | අත්තනොපදෙ | | |
|---|---|---|---|---|---|
| සො | ඔදනං | පචිස්සති | සො | ඔදනං | පචිස්සතෙ |
| තෙ | ” | පචිස්සන්ති | තෙ | ” | පචිස්සන්තෙ |
| ත්වං | ” | පචිස්සසි | ත්වං | ” | පචිස්සසෙ |
| තුම්හෙ | ” | පචිස්සථ | තුම්හෙ | ” | පචිස්සව්හෙ |
| අහං | ” | පචිස්සාමි | අහං | ” | පචිස්සං |
| මයං | ” | පචිස්සාම | මයං | ” | පචිස්සාමෙහ |

කම්මෙ

තෙන තයා මයා(වා) සො ඔදනො පචීයිස්සතෙ, පචිස්සතෙ, පච්චිස්සතෙ

| | | |
|---|---|---|
| ” | තෙ | පචීයිස්සරෙ, පචිස්සරෙ, පච්චිස්සරෙ, පචීයිස්සන්තෙ, පචිස්සන්තෙ, පච්චිස්සන්තෙ |
| ” | ත්වං | පචීයිස්සසෙ, පචිස්සසෙ, පච්චිස්සසෙ |
| ” | තුම්හෙ | පචීයිස්සව්හෙ, පචිස්සව්හෙ, පච්චිස්සව්හෙ |
| ” | අහං | පචීයිස්සං, පචිස්සං, පච්චිස්සං |
| ” | මයං | පචීයිස්සාමෙහ, පචිස්සාමෙහ, පච්චිස්සාමෙහ |

### පරස්සපදදෙසෙ

තෙන තයා මයා (වා) සො (ඔදනො) පවිසිස්සති, පවිස්සති, පවෙක්ඛති

| | | |
|---|---|---|
| " | තෙ | පවිසිස්සරෙ, පවිස්සරෙ, පවෙක්ඛරෙ, පවිසිස්සන්ති, පවිස්සන්ති, පවෙක්ඛන්ති |
| " | ත්වං | පවිසිස්සසි, පවිස්සසි, පවෙක්ඛසි |
| " | තුම්හෙ | පවිසිස්සථ, පවිස්සථ, පවෙක්ඛථ |
| " | අහං | පවිසිස්සාමි, පවිස්සාමි, පවෙක්ඛාමි |
| " | මයං | පවිසිස්සාම, පවිස්සාම, පවෙක්ඛාම |

භාවෙ – තෙන තයා මයා (වා) භූයිස්සති, භවිස්සති, භූයිස්සතෙ, භවිස්සතෙ –

### භවිස්සන්ති විභත්ති

---

### ක්‍රියාතිපන්නෙ'තීතෙ කාලාතිපත්ති

**කාලාතිපත්ති – ස්සා, ස්සංසු, ස්සෙ, ස්සථ, ස්සං, ස්සම්හා – ස්සථ, ස්සිංසු, ස්සසෙ, ස්සව්හෙ, ස්සං, ස්සාමහසෙ**

#### කත්තරි පරස්සපදෙ

| | | |
|---|---|---|
| සො | ඔදනං | අපවිස්ස, පවිස්ස, අපවිස්සා, පවිස්සා |
| තෙ | " | අපවිස්සංසු, පවිස්සංසු |
| ත්වං | " | අපවිස්ස, පවිස්ස, අපවිස්සෙ, පවිස්සෙ |
| තුම්හෙ | " | අපවිස්සථ, පවිස්සථ |
| අහං | " | අපවිස්සං, පවිස්සං |
| මයං | " | අපවිස්සම්හ, පවිස්සම්හ, අපවිස්සම්හා, පවිස්සාම්හා |

#### අත්තනොපදෙ

| | | |
|---|---|---|
| සො | ඔදනං | අපවිස්සථ, පවිස්සථ |
| තෙ | " | අපවිස්සිංසු, පවිස්සිංසු |
| ත්වං | " | අපවිස්සසෙ, පවිස්සසෙ |
| තුම්හෙ | " | අපවිස්සව්හෙ, පවිස්සසෙ |
| අහං | " | අපවිස්සං, පවිස්සං |
| මයං | " | අපවිස්සාමහසෙ, පවිස්සාමහසෙ |

## කම්මෙ

තෙන තයා මයා (වා) සො (ඔදනො) අපචීයිස්සථ, පචීයිස්සථ, අපච්චිස්සථ, පච්චිස්සථ

,, තෙ — අපචීයිස්සිංසු, පචීයිස්සිංසු, අපච්චිස්සිංසු, පච්චිස්සිංසු

,, ත්වං — අපචීයිස්සසෙ, පචීයිස්සසෙ, අපච්චිස්සසෙ, පච්චිස්සසෙ

,, තුම්හෙ — අපචීයිස්සව්හෙ, පචීයිස්සව්හෙ අපච්චිස්සව්හෙ, පච්චිස්සව්හෙ

,, අහං — අපචීයිස්සං, පචීයිස්සං, අපච්චිස්සං, පච්චිස්සං

,, මයං — අපචීයිස්සාම්හසෙ, පචීයිස්සාම්හසෙ, අපච්චිස්සාම්හසෙ, පච්චිස්සාම්හසෙ

## පරස්සපදුදෙසෙ

තෙන තයා මයා (වා) සො (ඔදනො — අපචීයිස්ස, පචීයිස්ස, අපචීයිස්සා, පචීයිස්සා, අපච්චිස්ස, පච්චිස්ස, අපච්චිස්සා, පච්චිස්සා

,, තෙ — අපචීයිස්සංසු, පචීයිස්සංසු, අපච්චිස්සංසු, පච්චිස්සංසු

,, ත්වං — අපචීයිස්ස, පචීයිස්ස, අපච්චිස්ස, පච්චිස්ස, අපචීයිස්සසෙ, පචීයිස්සසෙ, අපච්චිස්සසෙ, පච්චිස්සසෙ

,, තුම්හෙ — අපචීයිස්සථ, පචීයිස්සථ, අපච්චිස්සථ, පච්චිස්සථ

,, අහං — අපචීයිස්සං, පචීයිස්සං, අපච්චිස්සං, පච්චිස්සං

,, මයං — අපචීයිස්සම්හ, පචීයිස්සම්හ, අපචීයිස්සම්හා, පචීයිස්සම්හා, අපච්චිස්සම්හ, පච්චිස්සම්හ, අපච්චිස්සම්හා, පච්චිස්සම්හා

භාවෙ - තෙන තයා මයා(වා) අභූයිස්ස, භූයිස්ස, අභූයිස්සා, භූයිස්සා, අභවිස්සථ, භවිස්සථ, අභූයිස්සථ, භූයිස්සථ

කාලාතිපත්තිවිභත්ති

**ධාතූහි ණෙ, ණය, ණාපෙ, ණාපය කාරිතානි හොන්ති.**

වත්තමානා ගෙණ්හන්ති.

ණෙප්පච්චයෙ:

| කත්තරි පරස්සපදෙ | | | | අත්තනොපදෙ | | | |
|---|---|---|---|---|---|---|---|
| සො | සූදෙන | ඔදනං | පාචෙති | සො | සූදෙන | ඔදනං | පාචෙතෙ |
| තෙ | " | " | පාචෙන්ති | තෙ | " | " | පාචෙන්තෙ |
| ත්වං | " | " | පාචෙසි | ත්වං | " | " | පාචෙසෙ |
| තුම්හෙ | " | " | පාචෙථ | තුම්හෙ | " | " | පාචෙව්හෙ |
| අහං | " | " | පාචෙමි | අහං | " | " | පාචෙ |
| මයං | " | " | පාචෙම | මයං | " | " | පාචෙම්හෙ |

කම්මෙ:

| | | | |
|---|---|---|---|
| තෙන තයා මයා (වා) | සූදෙන | සො (ඔදනො) | පාචීයතෙ |
| " | " | තෙ | පාචීයන්තෙ |
| " | " | ත්වං | පාචීයසෙ |
| " | " | තුම්හෙ | පාචීයව්හෙ |
| " | " | අහං | පාචීයෙ |
| " | " | මයං | පාචීයාම්හෙ |

පරස්සපදුද්දෙසෙ:

| | | | |
|---|---|---|---|
| තෙන තයා මයා (වා) | සූදෙන | සො (ඔදනො) | පාචීයති |
| " | " | තෙ | පාචීයන්ති |
| " | " | ත්වං | පාචීයසි |
| " | " | තුම්හෙ | පාචීයථ |
| " | " | අහං | පාචීයාමි |
| " | " | මයං | පාචීයාම |

ණයප්පච්චයෙ – සො පාචයති, තෙ පාචයන්තීත්‍යාදි.

ණාපෙප්පච්චයෙ – සො පාචාපෙති, තෙ පාචාපෙන්තීත්‍යාදි.

ණාපයප්පච්චයෙ – සො පාචාපයති, තෙ පාචාපයන්තීත්‍යාදි.

අට්ඨවිභත්තීසු නයානුසාරෙන ඤෙය්‍යං ——

| | | | |
|---|---|---|---|
| පච | පාකෙ | – | පචති, පචන්තීත්‍යාදි ෴ භූවාදි |
| රුධි | ආවරණෙ | – | රුන්ධති, රුන්ධන්තීත්‍යාදි ෴ රුධාදි |
| දිවු | කීළාදිම්හි | – | දිබ්බති, දිබ්බන්තීත්‍යාදි ෴ දිවාදි |
| සු | සවනෙ | – | සුණොති, සුණන්තීත්‍යාදි ෴ සවාදි |
| කී | දබ්බවිනිමයෙ | – | කිණාති, කිණන්තීත්‍යාදි ෴ කියාදි |
| ගහ | උපාදනෙ | – | ගණ්හාති, ගණ්හන්තීත්‍යාදි ෴ ගහාදි |
| කර | කරණෙ | – | කරොති, කරොන්තීත්‍යාදි ෴ තනාදි |
| චුර | ථෙය්‍යෙ | – | චොරෙති, චොරෙන්තීත්‍යාදි ෴ චුරාදි |

## විකරණභෙදො.

---

භොත්තුමිච්ඡතීත්‍යත්ථෙ – බුභුක්ඛතීත්‍යාදි ෴
ඝසිතුමිච්ඡතීත්‍යත්ථෙ – ජිඝච්ඡතීත්‍යාදි ෴
හරිතුමිච්ඡතීත්‍යත්ථෙ – ජිගිංසතීත්‍යාදි ෴
සොතුමිච්ඡතීත්‍යත්ථෙ – සුස්සූසතීත්‍යාදි ෴
පාතුමිච්ඡතීත්‍යත්ථෙ – පිවාසතීත්‍යාදි ෴
පබ්බතමිව අත්තානමාචරතීත්‍යත්ථෙ – පබ්බතායතීත්‍යාදි ෴
පුත්තමිවාචරතීත්‍යත්ථෙ – පුත්තීයතීත්‍යාදි ෴
අත්තනො පත්තමිච්ඡතීත්‍යත්ථෙ – පත්තීයතීත්‍යාදි ෴
ධාතුරූපෙ – විසුද්ධයති, දල්හයති, අතිහත්ථයතීත්‍යාදි ෴

## ධාතුප්පච්චයන්ත නයො

---

යං තිකාලං තිපුරිසං ක්‍රියාවාචි තිකාරකං
අත්තිලිඞ්ගං ද්විවචනං තදාඛ්‍යාතන්ති වුච්චති ෴

## ඉති ආඛ්‍යාතරූපමාලා සමත්තා.

# ආඛ්‍යාතරූපමාලා විවරණය

**නමො තස්ස භගවතො අරහතො**
**සම්මාසම්බුද්ධස්ස**

**"කාලකාරකපුරිසපරිදීපකං ක්‍රියාලක්ඛණමාඛ්‍යාතිකං"** යනු බැවින් කාල කාරක පුරුෂයන් ප්‍රකාශ කරන්නා වූ, ක්‍රියාව සලකුණු කොට ඇත්තා වූ පදය ආඛ්‍යාත නම් වන්නේ ය. වර්තමානාදි අෂ්ටවිභක්තීන්ගේ වශයෙන් සයානූවැදෑරුම් වූ ආඛ්‍යාතප්‍රත්‍යය විෂයෙහි වරනැගියයුතු වූ ක්‍රියාපදයන්ගේ රූප පඞ්ක්තිය ආඛ්‍යාතරූපමාලා නම් වන්නී ය. එහි **කාලය** අතීත අනාගත වර්තමාන විසින් තුන්වැදෑරුම්. **ආණත්ති**, පරිකප්ප, කාලාතිපත්ති යන තුන්අර්ථය හා සමග සවැදෑරුම් ද වේ. **කාරක** නම් කර්තෘ, කර්ම, භාව යන මොහු යි. **පුරුෂ** නම් (එකවචන බහුවචනද්වයෙන් යුක්ත වූ) ප්‍රථම්, මධ්‍යම, උත්තම යන තුන් පුරුෂයෝ යි. **ක්‍රියා** නම් ගමන පචනාදි වූ ධාත්වර්ථ යයි. මෙසේ යම් පදයෙක් අතීතාදි තුන්කාලයක් ඇත්තේ ද, තුන්පුරුෂයකු ඇත්තේ ද, ගමනපචනාදි සාධ්‍යක්‍රියාවක්* ප්‍රකාශ කරනසුලු ද, කාරකතුනක් ඇත්තේ ද, ලිඞ්ගත්‍රය රහිත ද, එකවචන බහුවචන සංඛ්‍යාත වචනද්වයක් ඇත්තේ ද ඒ පදය තෙම මාගධ නිරුක්ති යෙහි ආඛ්‍යාත නමැයි කියනු ලැබේ.

නාමෙත සහ, (තුම්හඅම්හශබ්දවර්ජිත කර්තෘස්වරූප වූ හෝ කර්මස්වරූප වූ හෝ තුල්‍යාධිකරණ) නාමයක් සමග; සංයුජ්ජතො යෙදුණේ†; පඨමො පුරිසො, ප්‍රථමපුරුෂ (නමැයි); මතො, දන්නාලද්දේ ය. තුම්හසද්දෙන, (කර්තෘකර්මස්වරූප තුල්‍යාධිකරණ) තුම්හශබ්දය හා (සමග යෙදුණේ); මජ්ඣිමො, මධ්‍යම පුරුෂ (නමැයි දන්නාලද්දේ ය) අම්හසද්දෙන, (කර්තෘකර්මස්වරූප තුල්‍යාධි කරණ) අම්හශබ්දය හා (සමග යෙදුණේ; උත්තමො, උත්තම පුරුෂ (නමැයි දන්නාලද්දේ ය).

---

* සාධ්‍ය ය සිද්ධ යයි ද්විවිධ වූ ක්‍රියාවන් අතුරෙන් ආඛ්‍යාත විෂයෙහි සාධ්‍ය ක්‍රියාව කියනුලැබේ. සාධ්‍යක්‍රියා නම් සපයනු ලබන ක්‍රියා යි. සිද්ධක්‍රියා නම් "බුද්ධො" යනාදියෙහි බුජ්ඣනක්‍රියාදි පෙර ම සිද්ධ වූ ක්‍රියා යි.

† "නාමම්හි පයුජ්ජමානෙපි" යි සූත්‍රිත හෙයින් නො යෙදුණු කල්හි ද ප්‍රථමාදි පුරුෂයෝ වෙතැයි දතයුතු.

සො ගච්ඡති, හෙතෙම යෙයි; තෙ ගච්ඡන්ති, ඔහුතුමූ යෙත්; ත්වං ගච්ඡසි, තෝ යෙහි; වො (තුම්හෙ) ගච්ඡථ, තෙපි යෙව්; අහං ගච්ඡාමි, මම යෙමි; මයං ගච්ඡාම, අපි යෙමු; ඉත්‍යාදිනයෙ, යනාදි ක්‍රමයෙහි; නයෙ, පැමිණුවන්නේ ය හෙවත් දන්නේ ය. මෙහි ගමු ධාතුහු සකර්මක හෙයින් “සො ගාමං ගච්ඡති” යනාදීන් අනුක්තකර්මයෙහි ද්විතීයාන්තයක්හුගේ ද ප්‍රයොගය කටයුතු.

ආරද්ධ, පටන්ගන්නාලදින්; අනිට්ඨිතං, නො නිමියා වූ; කිච්චං, කෘත්‍යය (ක්‍රියාව) වත්තමානං ඉති, වර්තමාන යයි; වුච්චති, කියනුලැබේ; වත්තමානසමීපඤ්ච, වර්තමානක්‍රියාවට ආසන්න වූ (අතීත අනාගත ක්‍රියා) ද; වත්තමානමහි, (වර්තමානව්‍යවහාරොපචාරය සම්භව වන හෙයින්) වර්තමානකාලයෙහි ලා; වුච්චති, කියනුලැබේ.

“වත්තමානා පච්චුප්පන්නෙ” යනු වර්තමානාවිභක්ති විධිසූත්‍ර යි. පච්චුප්පන්නෙ, පවත්නා කාලයෙහි හෙවත් පවත්නා ක්‍රියාවක් කිවමනා කල්හි; වත්තමානා, වර්තමානා විභක්ති(වේ). “වත්තමානා ති-පෙ-මෙහ” යනු වර්තමානා සංඥාසූත්‍ර යි. ත්‍යාදිප්‍රත්‍යය දොළොස වර්තමානා නම් වෙත් යන අර්ථ යි. කත්තරි, කර්තෘකාරකයෙහි; පරස්සපදෙ, පරස්මෛපදයෙහි:

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| සො, | හෙතෙම්; | ඔදනං, | බත; | පචති, | (දැන්) | පිසේ. |
| තෙ, | ඔහුතුමූ; | ” | ” | පචන්ති | ” | පිසෙත්. |
| ත්වං, | තෝ; | ” | ” | පචසි, | ” | පිසෙහි. |
| තුම්හෙ, | තෙපි; | ” | ” | පචථ, | ” | පිසහු. |
| අහං, | මම; | ” | ” | පචාමි, | ” | පිසමි. |
| මයං, | අපි; | ” | ” | පචාම, | ” | පිසමු. |

අත්තනොපදෙ, (කර්තෘකාරක) ආත්මනෙපදයෙහි; සො, හෙතෙම, ඔදනං, බත; පචතෙ, (දැන්) පිසේ; (යනාදීන් පරස්මෛපදයෙහි මෙන් ම අර්ථ කියයුතුයි). ‘දැන්’ යන නිපාතය වර්තමාන කාලයාගේ අභිව්‍යක්තිය පිණිස පෙරටු ව යොදනු ලැබෙයි. ආමන්ත්‍රණාභිව්‍යක්තිය පිණිස හෙ ශබ්දයාගේ ප්‍රාක්ප්‍රයොගය මෙනි. ඒ නැත ද විභක්තිය විසින් ම කාලාර්ථය ප්‍රකාශිත වේ. කර්තෘකාරකයෙහි ක්‍රියාව විසින් කර්තෘ උක්ත හෙයින් කර්තෘ තෙමේ ලිඞ්ගාර්ථයෙහි ප්‍රථමාවිභක්තිය සෙවූයේ ය. කර්මය තෙම ක්‍රියාව විසින් අනුක්ත හෙයින් අනුක්තකර්මාර්ථයෙහි ද්විතීයාවිභක්තිය සෙවුනේ යි,

කම්මෙ, කර්මකාරකයෙහි; තෙන, ඔහු විසින් හෝ; තයා, තා විසින් හෝ; මයා (වා), මා විසින් හෝ; සො(ඔදනො), ඒ බත තෙමේ; පචීයතෙ, පච්චතෙ, (දූත්) පිසනු ලැබේ. මෙහි "තෙන, තයා, මයා" යන නාමශබ්ද තුම්හශබ්ද අම්හශබ්දයන් සම්බන්ධී තෘතීයෛකවචන ත්‍රයයෙන් කර්තෲහු දක්වීම යි. මෙසේ ම තෙහි, තුම්හෙහි, අම්හෙහි යී තෘතීයා බහුවචනයෝ ද මෙහි යෙදෙත්. කර්මකාරක යෙහි ක්‍රියාව විසින් කර්මය උක්ත හෙයින් උක්තකර්මය තෙම ලිඞ්ගාර්ථ යෙහි ප්‍රථමාවිභක්තිය සෙවුනේ ය. එහෙයින් "සො" යනු උක්ත කර්ම යි. "ඔදනො" යනු පචධාතුහට අනුකූල වූ කර්මත්වය, හඟවන කර්මවිශෙෂණ පදයෙකි. එහෙයින් හෙ ද කර්මසංඛ්‍යාවට ම ගත යුතුයි. 'සො ඔදනො' යන්නෙහි විශෙෂණවිශෙෂ්‍යභාවය කාම චාරයෙන් ගත හැකි වේ. ඒ ආහාර යයි අර්ථය, ගැන්මෙහි "සො" යනු විශෙෂණ ය. "ඔදනො" යනු විශෙෂ්‍ය යි. "ඔදනො සො" (ආහාර වූ හෙතෙම) යයි ගත් කලැ 'ඔදනො' යනු විශෙෂණ ය. 'සො' යනු විශෙෂ්‍ය යි. කම්මකාරකයෙහි කර්මය උක්ත හෙයින් කර්තෘ අනුක්ත වේ. අනුක්ත කර්තෘතෙම කර්තෘඅර්ථයෙහි වූ තෘතීයා විභක්ති සෙවුනේ ය. අනුක්ත කර්තෘහට විභක්තිය නියත. තමුත් නාම, තුම්හ, අම්හ, යන ශබ්දයන්ගේ හෝ ඒකවචන බහුවචන යන්ගේ හෝ නියත බවක් නැත්තෙන් තෙන, තෙහි, තයා, තුම්හෙහි, මයා, අම්හෙහි යන කර්තෘවිභක්ත්‍යන්තපදයන් අතුරෙන් යම් කවරපදයක් තමුත් කර්මකාරකක්‍රියාවන්ට අනුක්තකර්තෘවශ යෙන් අවිශෙෂයෙන් යෙදුවමනා යි. එහෙයින් "තෙන තයා මයා වා" යි වාශබ්දප්‍රයොගය කරනලද යි දතයුතු. තෙන, ඔහු විසින්; තෙ ඔදනා, ආහාර වූ ඔහුතුමූ; (ඒ ආහාරයෝ තුමූ යන අර්ථයි: පචීයරෙ, පචීයන්තෙ, පච්චරෙ, පච්චන්තෙ, (දූත්) පිසනු ලැබෙත්.

තෙන, ඔහු විසින්; ත්වං, තෝ*; පචීයසෙ, පච්චසෙ, (දූත්) පිසනු ලැබෙහි.

,, ,, තුම්හෙ, තෙපි; පචීයව්හෙ, පච්චව්හෙ, (දූත්) පිසනු ලබහු.

,, ,, අහං, මම; පචීයෙ; පච්චෙ, (දූත්) පිසනු ලබමි.

,, ,, මයං, අපි; පචීයාමහෙ, පච්චාමහෙ, (දූත්) පිසනු ලබමු.

පරස්සපදදෙසෙ, (ආත්මනෙපදයන්ට) පරස්මෛපදදෙශ කළ කල්හි; "අත්තනොපදානි භාවෙ ච කම්මණි" යන සුතුරෙන් සූත්‍රකාරයන් විසින් සංස්කෘතවෛයාකරණමතානුයායී ව භාව

---

* ත්වම් කර්මපදයන්ගෙන් ද ඔදනාදී වූ පිසිය යුත්තක් ම ද්‍රව්‍ය යි.

කර්ම කාරකාර්ථයෙහි ද කර්තෘහු කෙරෙහි ද ආත්මනෙපදයෝ ම දක්වනලදහ. මාගධ නිරුක්තියෙහි කර්මකාරකයෙහි ද පරස්මෛ පදරූපයෝ දක්නාලැබෙති. එහෙයින් ඔවුන්ගේ ද ආත්මනෙ පදත්වය ප්‍රතිපාදනය කරනු කැමැති ආචාර්ය කාත්‍යායන ස්වාමිපාදයෝ "අත්තනොපදානි පරස්සපදත්තං" (ආත්මනෙපදයෝ කිසිතැනෙක පරස්මෛපදබවට පැමිණෙති හෙවත් ආත්මනෙ පදයන්ට පරස්මෛපදයෝ ආදේශරූපත්වයෙන් ලැබෙති) යි සූත්‍රයක් රචනා කළහ. එහෙයින් කර්මකාරක භාවකාරක දෙක්හි පැනෙන පරස්මෛපදරූපයෝත් ප්‍රකෘතියෙන් ආත්මනෙපදයෝ ම ය. "ඡදෘදෙශසනමද්භවති" යනු මෙබඳු තැනැ ආප්තොපදෙශ යි. මෙසේ හෙයින් කර්තෘකාරකයෙහි මෙන් කර්මකාරකයෙහි "පරස්සපදෙ" යි නො යොදා "පරස්සපදෙසෙ" කියා හෝ "පරස්සපදත්තෙන" කියා හෝ සවිශෙෂ නිර්දේශය මාගධ වෛයාකරණ සම්ප්‍රදාය යයි සලකනු. "පචියති පච්චති" යනාදීන්ට ද පෙර "පචියතෙ පච්චතෙ" යනාදීන්ට කී සෙයින් ම අරුත් බිණියයුතු.

භාවෙ, භාවකාරකයෙහි; තෙන, ඔහු විසින් හෝ; තයා, තා විසින් හෝ; මයා වා, මා විසින් හෝ; භූයති, භූයතෙ, (වර්තමානයෙහි) වීම යි; ඔහුගේ හෝ තාගේ හෝ මාගේ හෝ වර්තමානයෙහි වීම ය යන අර්ථ යි. "තෙහි තුම්හෙහි අම්හෙහි වා භූයති භූයතෙ" යි ද යොදනු. අද්‍රව්‍ය වූ පැවතුම් ඇති භාවයා තමා එකක් හෙයින් එකවචන ම වෙයි*. ඒ එකවචනය ද ප්‍රථමපුරුෂයෙහි ම ය. ආඛ්‍යාතයෙහි භාවය නම් කාරකයෙන් අමිශ්‍ර වූ ශුද්ධ වූ ධාත්වර්ථය යි දතයුතු.

ආරබ්ධ වූ අපරිසමාප්ත වූ ක්‍රියාව හෙවත් පටන්ගෙන නො නිමි ක්‍රියාව වර්තමානා විභක්තියෙන් කියයුතු වේ. මෙහි ව්‍යභිචාරයෙකුදු කියනලදී.

"පච්චුප්පන්නසමීපෙ'පි තබ්බොහාරූපචාරතො
වත්තමානා අතීතෙ'පි තං කාලවචනිවජ්ජයං" —

පච්චුප්පන්නසමීපෙ අපි, වර්තමානක්‍රියාවට ආසන්න වූ අතීත අනාගතක්‍රියායෙහි දු; තබ්බොහාරූපචාරතො, ඒ වර්තමාන ව්‍යවහාරයාගේ උපචාරය සම්භව වන හෙයින් හෙවත් වර්තමාන

* ඇතම්කෙනෙක් "භාවෙ භූයන්ති භූයන්තෙ ඉච්චාදි" යි ප්‍රථම පුරුෂබහුවචන මධ්‍යමපුරුෂාදියෙහිත් භාවප්‍රයොග ඇති සේ ආදිශබ්දප්‍රයොගය සලකත්. ඒ අශාස්ත්‍රීය කල්පනා හෙයින් දුරලියයුතු.

ව්‍යවහාරයාගේ කීම අතීතාදි ක්‍රියායෙහි ද ලැබෙන හෙයින්; වත්ත මානා, වර්තමානවිභක්තීහු වෙති; අතීතෙ අපි, අතීතක්‍රියායෙහි ද; තං කාලවචනිච්ඡයං, ඒ අතීතකාලයෙහි වූ වර්තමානක්‍රියාව කියනු කැමැති කල්හි: (වත්තමානා, වර්තමානා විභක්තීහු වෙත්.)

වර්තමාන සමීප අතීතයෙහි වර්තමානක්‍රියාවට "කුතො භවං ආගච්ඡති? පාටලිපුත්තතො ආගච්ඡාමි" යනු උදාහරණ යි. "භවං, පින්වත් තෙම; කුතො, කොයින්; ආගච්ඡති, එහි ද" යනු අවුත් හිඳගත් පුරුෂයක්හුගෙන් කිසිවක්හුගේ විචාරීම ය. ඊට ඒ පුළුවුත්නාලද පුරුෂ තෙම හුනස්නෙහි ම හිඳ "පාටලිපුත්තතො, පැළලුප්නුවරින්; ආගච්ඡාමි, එමි" යි පිළිවදන් කියයි. මෙහි "ආගච්ඡති" යනු ද "ආගච්ඡාමි" යනු ද නිමියා වූ ගමනක්‍රියාව සඳහා කියනලදුවත් සමීපයෙහි ම නිමියා වූ අතීතක්‍රියාවගේ වර්තමානව්‍යවහාරාරොපණයට සුදුසු බව ඇති හෙයින් තද්ව්‍යවහාරොපචාරයෙන් වර්තමාන වේ.

වර්තමානසමීප අනාගතයෙහි වර්තමානක්‍රියාවට "යාවාහං ආගච්ඡාමි, පුරෙ අධම්මවාදිනො දිප්පන්ති" යනාදිය උදාහරණ යි.

"අහං, මම; යාව, යම්තාක්; ආගච්ඡාමි, එම් ද" යනු ගමනක්‍රියාව නො ඇරඹූ තැනැත්තෙකු විසින් කියනුලබන හෙයින් අනාගත වෙයි. "එන්නෙම් ද" යනු එහි අර්ථ යි. "පුරෙ, මතුකාලයෙහි; අධම්මාවාදිනො, අධර්මවාදීහු; දිප්පන්ති, දීප්තිමත් වෙත්" යනු දීපනක්‍රියාව නො ඇරඹූ කල්හි ම කියනලද හෙයින් අනාගත වෙයි. "දීප්තිමත් වන්නාහු ය" යනු එහි අර්ථ යි.

අතීතයෙහි තත්කාලවර්තමානක්‍රියාවට "භගවා සාවත්ථියං විහරති" යනාදිය උදාහරණ යි. "භගවා, භාග්‍යවත් තෙම; සාවත්ථියං, සැවත සමීපයෙහි; විහරති, වෙසේ" යයි සඞ්ගීතිකාලොක්ත වචනය අතීත වූ දෙශනාසමයෙහි භාග්‍යවත්හුගේ වර්තමාන විහරණය කියවී හෙයින් අතීතයෙහි තත්කාල වර්තමාන වචන යි.

පරවෛයාකරණයෝ වනාහි වර්තමානය චතුර්විධ කොට දක්වත්. ඒ මෙසේ ය:

"ප්‍රවෘත්තොපරතශ්චෛව වෘත්තාවිරත එව ච
නිත්‍යප්‍රවෘත්තඃ සාමීප්‍යො වර්තමානශ්චතුර්විධඃ" යි.

ප්‍රවෘත්තොපරත ය, වෘත්තාවිරත ය, නිත්‍යප්‍රවෘත්ත ය, සාමීප්‍ය යයි වර්තමානය සිවුවැදෑරුම්. "මාංසං න ඛාදති" (මස් නො කයි)

කී කල්හි පළමු පැවැති (මාංසභොජන) ක්‍රියාව වළක්වයි යන අර්ථය වේ. එහෙයින් මේ **ප්‍රවෘත්තොපරම** නම්. "ඉහ **කුමාරාඃ** ක්‍රීඩන්ති" (මෙහි කුමරුවෝ කෙළිත්) යයි කෙළිමඩලක් දැක කී කල්හි ඒ කියන විට ක්‍රීඩනය නැත ද පළමු පැවැති (ක්‍රීඩන)ක්‍රියාව නො වැළැක ම වක්තෘහුගේ බුද්ධියෙහි පවත්නා හෙයින් මේ **වෘත්තාවිරත** නම්. "පර්වතාස්තිෂ්ඨන්ති" (පර්වතයෝ සිටිත්) යයි කී කල්හි (පර්වතයන්ගේ) නිරතුරු පැවැත්ම හෙතුකොටගෙන මේ **නිත්‍යප්‍රවෘත්ත** නම්. පර්වතයන්ගේ ස්ථිතිය පිළිබඳ වර්තමානත්වය ඇත ද භූතභවිෂ්‍යත්කාලද්වය හා සම්බන්ධය කියවි කල්හි "පර්වතාස්තස්ථුඃ" (පර්වතයෝ සිටියහ) "පර්වතාඃ ස්ථාස්‍යන්ති" (පර්වතයෝ සිටිනාහ) යි කියා ද අතීතානාගතක්‍රියා ප්‍රයොගය වේ. **සාමීප්‍යවර්තමානය** තෙම භූතසාමීප්‍ය ය, භවිෂ්‍යත්සාමීප්‍ය ය යි දෙවැදෑරුම්. භූතසාමීප්‍යය නම් "කදා ආගතො'සි?" (කවර දා ආයෙහිදැ) යි විචාළ කල්හි මාර්ගඛෙදදිය ඒ නාක් ම පවත්නා හෙයින් ආ තැනැත්තේ ද "එසො'හමාගච්ඡාමි" (මේ මම එමි) යි කියයි. අතික්‍රාන්ත වූ ආගමනක්‍රියාව සමීපත්වයෙන් වර්තමාන කොට සලකා (එමියි) කී හෙයින් මේ "භූතසාමීප්‍ය" නම් වර්තමානය යි. භවිෂ්‍යත්සාමීප්‍ය නම්: "කදා ගමිෂ්‍යසි?" (කවර දා යන්නෙහිදැ) යි විචාළ කල්හි ගමනාරම්භය නොකොට ම ගමනොත්සාහය පමණක් ඇති තැනැත්තේ "එසො'හං ගච්ඡාමි" (මේ මම යෙමි)යි කියයි. අනාරබ්ධ වූ ගමනක්‍රියාව සමීපත්වයෙන් වර්තමාන කොට සලකා (යෙමි) කී හෙයින් මේ "භවිෂ්‍යත් සාමීප්‍ය" නම් ලද වර්තමාන ය යි. මේ විශෙෂද යට කී වර්තමාන භෙදයෙහි ලා සංසක්ත කොට දතයුතු.

පුරුෂත්‍රය විභාගයෙහි ති-අන්ති ප්‍රත්‍යයාන්ත වූ "පචති පචන්ති" යන දෙක ප්‍රථමපුරුෂ ක්‍රියා යි. ඔවුන් හා සො, තෙ, යනාදි වූ කිසියම් සමානාධිකරණ නාමපද දෙසක් යොදන කල්හි ද නො යොදන කල්හි ද ඔවුන්ගේ ප්‍රථමපුරුෂත්වය සිද්ධ ය. සි-ථ ප්‍රත්‍යයාන්ත වූ "පචසි, පචථ" යන දෙක මධ්‍යමපුරුෂ ක්‍රියා යි. ඔවුන් හා ත්වං, තුම්හෙ යන සමානාධිකරණ පදද්වය යොදන කල්හි ද නොයොදන කල්හි ද ඔවුන්ගේ මධ්‍යමපුරුෂත්වය සිද්ධ ය. මි-ම ප්‍රත්‍යයාන්ත වූ "පචාමි, පචාම" යන දෙක උත්තම පුරුෂ ක්‍රියා යි. ඔවුන් හා අහං, මයං යන සමානාධිකරණ පදද්වය යොදන කල්හි ද නො යොදන කල්හි ද ඔවුන්ගේ උත්තමපුරුෂත්වය සිද්ධ ය. එහෙයින් "පචති, පචන්ති, පචසි, පචථ, පචාමි, පචාම" යනාදීන් ඒ ඒ පුරුෂයෙහි තුල්‍යාධිකරණ වූ සො, තෙ, යනාදි උක්තකර්තෘපද නො යොදා කිව ද "පචති, හෙතෙම පිසෙයි"

යනාදීන් අර්ථප්‍රතීතිය වේ. කර්මකාරකයෙහි සමානාධිකරණ වූ උක්තකර්මපද නොයෙදූකල ද මෙසේ මැ යි.

පුරුෂදෙකක්හුගේ හෝ තුන්පුරුෂයක්හුගේ ම හෝ සමාන වූ ක්‍රියා එකවිට පවත්නා කල්හි "**සබ්බසමෙකාභිධානෙ පරො පුරිසො**" යි පරිභාෂිත හෙයින් එක ක්‍රියාපදයක්හුගේ ප්‍රයොගය ද වේ. ඒ මෙසේ යි:– ප්‍රථමමධ්‍යමපුරුෂයන්ගේ හෝ මධ්‍යම උත්තමපුරුෂයන්ගේ හෝ තුන්පුරුෂයන්ගේ ම හෝ එකක් කොට කියයුතුබවක් ඇති කල්හි ප්‍රථමමධ්‍යමාදීන් අතුරෙන් යම් පුරුෂයෙක් පර ව (ඉෂ්ට ව) සිටියේ ද ඒ පර ව සිටි පුරුෂයහට සුදුසු ක්‍රියාපදය යෙදියයුත්තේ ය. "සො ච පචති, ත්වඤ්ච පචසි" "හෙ ද පිසෙයි, තො ද පිසෙහි" යයි කීමක් ඇති කල්හි පර ව සිටි පුරුෂයාගේ බහුවචනයෙන් "තුම්හෙ පචථ" "තෙපි පිසහු" යයි පර වූ පුරුෂයාගේ ප්‍රයොගය වේ. මෙසේ "සො ච පචති, අහං ච පචාමි" යන තැන "මයං පචාම" යනු වේ. "ත්වඤ්ච පචසි, අහඤ්ච පචාමි" යන තැන ද "මයං පචාම" යනු වේ. "සො ච පචති, ත්වඤ්ච පචසි, අහඤ්ච පචාමි" යන තැන ද "මයං පචාම" යනු වේ. ක්‍රියාවන්ගේ සමානකාලත්වය නොවී නම් මේ කියනලද විධිය නො වේ: "සො පචති, ත්වං පචිස්සසි, අහං පචිං" යනු ඊට ප්‍රත්‍යුදාහරණ යි. මෙහි පචති, පචිස්සසි, පචිං, යන වර්තමාන අනාගත අතීතක්‍රියාවන්ගේ නානාකාලත්වය හෙයින් "මයං පචිම්හ" යි පර වූ උත්තමපුරුෂයාගේ ප්‍රයොගය නොවෙයි දතයුතු.

පාණිනීයධාතුපාඨාදියෙහි ධාතූහු පරස්මෛපදීහ, ආත්මනෙපදීහ, උභයපදීහ යි ත්‍රිවිධ කොට දක්වනලදහ. එහි පරස්මෛපදිධාතුන් කෙරෙන් පරස්මෛපදප්‍රත්‍යයෝ ද, ආත්මනෙපදිධාතුන් කෙරෙන් ආත්මනෙපදප්‍රත්‍යයෝ ද, උභයපදිධාතුන් කෙරෙන් පරස්මෛපදආත්මනෙපදප්‍රත්‍යය දෙකොටස ද යොදනුලැබෙත්. මෙවැනි වෙසෙසෙක් මාගධව්‍යාකරණයෙහි නොකියනලදුවත් බොහෝ සෙයින් මීට අනුයායිත්වය පැනේ.

ආඛ්‍යාතක්‍රියාවන්ට කර්මය ස්වකීය යයි ද, කර්තෘ තෙම අස්වකීය හෙයින් අන්‍ය යයි ද සලකනු ලැබේ. එහෙයින් කර්තෘවාචක වූ පදයන්ට "පරස්මෛපද" සංඥාව ද කර්මවාචක වූ පදයන්ට "ආත්මනෙපද" සංඥාව ද භූයොවෘත්තියෙන් කරනලද ය යනු ඇතම් ආචාර්යවරයන්ගේ මත යි. "**කත්තරි පරස්සපදං**" යි කර්තෘකාරකයෙහි පරස්මෛපදය ද, "**අත්තනොපදානි භාවෙ ච කම්මනි**" යි භාව කර්ම දෙක්හි ආත්මනෙපදය ද ප්‍රමුඛ කොට දක්වීමෙන් මේ අර්ථපක්ෂය සලකනලදි. කියනලද මැයි :–

"පහාය අත්තනො කම්මං පරං කත්තරමාදිසෙ
පරස්සපදම්වෙච්චමාදිසුත්තෙන සඤ්ඤිතා —

කත්තාරං පජහිත්වාන අත්තනො කම්මමාදිසෙ
අත්තනොපදම්වෙච්චං සඤ්ඤිතාථ පරාදිනා" යි —

"පරත්ථානි පදානි පරස්සපදානි" යනු බැවින් මෙරමා නිසා වූ පදයෝ පරස්මෛපද නම් වෙති, තමා නිසා වූ පදයෝ ආත්මනෙපද නම් වෙත්. "කර්තෘගාමිනි ඵල ආත්මනෙපදං, පරගාමිනි ඵලෙ පරස්මෛපදම්"යි පරවෛයාකරණයන් විසිනුදු මේ අර්ථය දර්ශිත ය. "කර්තෘහු (තමා) කරා පැමිණෙන ක්‍රියාඵලය ඇති කල්හි ආත්මනෙපදය වෙයි, (කර්තෘහු කෙරෙන්) අනිකකු කරා පැමිණෙන ක්‍රියාඵලය ඇති කල්හි පරස්මෛපදය වෙයි" යනු එහි අර්ථ යැ. මෙසින් පරස්මෛපද ආත්මනෙපදයන්ගේ අන්වර්ථසංඥත්වය දක්වූ නමුදු සමහර ආචාර්ය කෙනෙක් එ ද විකල්පවශයෙන් සලකති. "කුලාලො ඝටං කරොති"යි පරස්මෛපදයෙන් කිව ද "කුලාලො ඝටං කුරුතෙ"යි ආත්මනෙපදයෙන් කිව ද දෙපරිද්දෙන් ම ඝටනිර්මාණක්‍රියාඵලය කුලාලයාහට මුත් ඔහු කෙරෙන් අනිකක් හට නොලැබෙන හෙයින් ද "කමලවනොද්ඝාටනං කුරුතෙ යෙ" යනාදි තන්හි පරගාමික්‍රියාඵලය ඇතත් ආත්මනෙපදප්‍රයොගය පැනෙන හෙයින් ද ක්‍රියාඵලවිශෙෂයක් නොතකා පරස්මෛපද ආත්මනෙපදයන්ගේ යෙදීම ද වෛයාකරණයන්ට අභිමත යි.

. පදවිභාගයෙහි – 'පචති' යනු සකර්මකධාතු වර්තමානාවිභක්ති කර්තෘකාරකපරස්මෛපද ප්‍රථමපුරුෂෛකවචන කර්මස්ථ ආඛ්‍යාත අපරක්‍රියාපද ය. 'පචන්ති' යනු සකර්මකධාතු වර්තමානාවිභක්ති කර්තෘකාරක පරස්මෛපද ප්‍රථමපුරුෂ බහුවචන කර්මස්ථ ආඛ්‍යාත අපරක්‍රියාපද ය. යනාදීන් ධාතු, විභක්ති, කාරක, ෂට්ක, පුරුෂ, වචනාදි භෙද සලකා ඒ ඒ තැනට සුදුසු පරිද්දෙන් පදවිභාග දතයුතු.

"පචති" යන්නෙහි පච ධාතුහු ඔදනාදි කර්මයක් අපෙක්ෂා කරන හෙයින් සකර්මකධාතු ය; ති යන වර්තමානප්‍රත්‍යයක් අන්ත කොට ඇති හෙයින් වර්තමානාවිභක්ති ය; තිප්‍රත්‍යය කර්තෘහු අපෙක්ෂා කොට යොදනලද හෙයින් කර්තෘකාරක ය; පරස්මෛපද නම් ලද ත්‍යාදි පූර්වෂට්කයට ඇතුළත් හෙයින් පරස්මෛපද ය; තුම්හ අම්හ ශබ්දදෙකින් පිටත් කර්තෘපදයක් අපෙක්ෂා කොට සිටි හෙයින් ප්‍රථමපුරුෂ ය; ඒ කර්තෘහුගේ එකත්වයක් දක්වන හෙයින් එකවචන ය; ධාත්වර්ථ වූ පිසීම කර්මය කෙරෙහි පිහිටි හෙයින්

කර්මස්ථ ය; කාලකාරකපුරුෂයන් ප්‍රකාශ කරන හෙයින් ආඛ්‍යාත ය; මතු ක්‍රියාපදයක් අපේක්‍ෂා නොකොට වාක්‍යපරිසමාප්තිය කරන හෙයින් අපරක්‍රියා ය; විභක්ත්‍යන්ත හෙයින් පද ය; යන මේ නියායෙන් මෙහි තාත්පර්‍ය්‍යාර්ථය සලකනු.

'භවති' යනාදි අකර්මකධාතුක්‍රියායෙහි කර්මාපේක්‍ෂාවක් නැති හෙයින් "අකර්මකධාතු" යයි යොදනු. භවනක්‍රියාර්ථය කර්තෘහු කෙරෙහි පිහිටි හෙයින් "කර්තෘස්ථ" යි යොදනු. "නයති" යනාදි ද්විකර්මකධාතුපදවිභාගයෙහි ද මේ ක්‍රමයෙන් "ද්විකර්මකධාතු" යයි යොදනු. "කර්මස්ථ" "කර්තෘස්ථ" යනුත් ධාත්වර්ථය සලකා යෙදියයුතු.

වත්තමානාවිභත්ති යි.

---

2

"ආණත්‍යාසිට්ඨෙ 'නුත්තකාලෙ පඤ්චමී" යනු පඤ්චමීවිභක්තිවිධිසූත්‍ර යි. ආණත්‍යාසිට්ඨෙ, නියොගයක් ද ආසිංසනයක් ද හැඟෙනකල්හි; අනුත්තකාලෙ, වර්තමානකාලයෙහි හෝ කාලවිශෙෂයක් නියම නො කොට සමහව වූ කාලයෙක හෝ; පඤ්චමී, පඤ්චමීවිභක්ති වේ. මේ සූත්‍රයට "කාලෙ" යන අධිකාරය ඇතිවත් නැවත කාලග්‍රහණය කළ හෙයින් විධි, නිමන්ත්‍රණ, අධ්‍යෙෂණ, අනුමති, ප්‍රාර්ථනා, ප්‍රාප්තකාලාදි අර්ථයෙහි ද පඤ්චමී විභක්ති වේ. ආණත්ති නම් නියොගය හෙවත් ආඥා කිරීම ය; ආසිංසන නම් කැමැති වූ අසම්ප්‍රාප්ත වූ අනාගතාර්ථයක්හුගේ පැතීම ය; විධි නම් දාසාදීනිකෘෂ්ටයන් කෙරෙහි විධාන කිරීම ය. නිමන්ත්‍රණ නම් දනවස්තුප්‍රතිග්‍රහණාදිය පිණිස පැවරීම ය; අධ්‍යෙෂණ නම් ධර්මදෙශනාදිය පිණිස ආදරපූර්වක ආරාධනා ය; අනුමති නම් අනුන් කරන කාර්‍ය්‍යයට තමා කැමැති ව ගිවිසීම ය; ප්‍රාර්ථනා නම් යම්කිසිදෑයක් ඉල්වීම ය; ප්‍රාප්තකාල නම් ක්‍රියාවට සුදුසු කාලය පැමිණි බව යි.

"පඤ්චමී තු — පෙ — ආමසෙ" යනු පඤ්චමීසංඥසූත්‍ර යි. තුවාදිප්‍රත්‍යය දෙළොස පඤ්චමී නම් වෙයි යන අර්ථ යි. කර්තෘකාරක පරස්මෛපදයෙහි : පචතු, පිසේවා; පචන්තු, පිසෙත්වා; පච, පචාහි, පිසෙහිවා; පචථ, පිසහුවා; පචාමි, පිසෙම්වා; පචාම, පිසමුවා. කර්තෘකාරකආත්මනෙපදයෙහිදු මෙසේ මැ යි. කර්මකාරකයෙහි : පචියතං, පච්චතං, පිසනුලැබේවා යනාදිනයින් ලබද යොද අර්ථ කියයුතු.

සිංහලව්‍යාකරණයෙහි වාපස ආසිකිරියෙහි යොදනුලැබේ. එහෙයින් "පිසේවා" යනාදීන් වාප්‍රත්‍යය යුක්ත අපෞච්චාරණය ආශිංසනයෙහි අභිමත යි. විධ්‍යර්ථයෙහි වාප්‍රත්‍යය කොට 'පිසේවා' යනාදීන් කිව ද වාප්‍රත්‍යය නොකොට 'පිසන්නේ' යයි කිව ද යෙදේ. අධිවාසෙතු භොජනං, භොජනය ඉවසනසේක්වා; යනු නිමන්ත්‍රණයෙහි පඤ්චමියට උදාහරණ යි. දෙසෙතු ධම්මං, දහම් දෙසනසේක්වා; යනු අධ්‍යෙෂණයෙහි උදාහරණ යි. පුච්ඡ වාසව මං පඤ්හං, ශක්‍රය මා පැන විචාර; යනු අනුමතියෙහි ය. දදාහි මෙ ගාමවරානි පඤ්ච, මට ගම්වරපසක් දෙව; යනු ප්‍රාර්ථනා යෙහි ය. කටං කරොතු, (කටකරණයට කල් පැමිණි හෙයින්) කටය කෙරේවා; යනු ප්‍රාප්තකාලයෙහි උදාහරණ යි.

රූපසිද්ධියෙහි කාලග්‍රහණයෙන් විධිනිමන්ත්‍රණාදිය ද සංග්‍රහ කොට "ඉධ පබ්බතො හොතු" යනාදීන් උදාහරණ දක්වනලදි. පුනකාලග්‍රහණයෙන් නිමන්ත්‍රණාදියෙහි පඤ්චමී වන බැව් ම කාත්‍යායනවණ්ණනාකාරාදීන් විසින් පිළිගන්නාලදි. (තමහට හෝ මෙරමාහට හෝ) නොලත් සැපතෙක් ලැබේව යි පැතීම ආසිං සනය යි. මෙරමාහට කැමති දෑ ලැබේව යි පැතීම හෝ ආසිංසන නමි. එයින් කිහ : "අප්‍රාප්තප්‍රාර්ථනමාශීඃ, පරස්‍යෙෂ්ටාර්ථශංසනං වා" යි. එහි ආණත්ති තොමෝ දෘෂ්ටාර්ථවිෂය අදෘෂ්ටාර්ථවිෂයභෙද යෙන් ද, සාදර අනාදරභෙදයෙන් ද දෙවැදෑරුම් වන්නී ය. "යදි සකුණිමංසම්වජ්ජසි යස්සු පුබ්බෙන පුපඵ්වතියා, ඉදින් ළිහිණි මස් කැමැත්තෙහි නම් පුෂ්පවතියෙන් (පැළලුප්නුවරින්) පෙර දිගට යෙහි" යනු දෘෂ්ටාර්ථවිෂයෙහි ය. "දානං දදන්තු සද්ධාය; සැදැහැයෙන් දන් දෙත්වා" යනු අදෘෂ්ටාර්ථවිෂයෙහි ය. "සුණාතු මෙ භන්තෙ සංඝො, වහන්ස සංඝ තෙමේ මා (කියන්නක්) අසාවා" යනු සාදරයෙහි ය. "ඉදං සුණාථ සොදරියා, සොහො යුරෙනි මෙය අසව්" යනු අනාදරයෙහි ය. ආසිංසනයෙහි "චිරං තිට්ඨතු සො රාජා, ඒ රජ තෙම සැරදේවා" යනාදිය උදාහරණ කටයුතු.

පඤ්චමීවිභත්ති යි.

---

3.

"අනුමතිපරිකප්පත්ථෙසු* සත්තමී" යනු සප්තමීවිභක්තිවිධි සූත්‍ර යි. අනුමතිපරිකප්පත්ථෙසු, අනුමත්‍යර්ථයක් හැඟෙන කල්හි ද

---

* අනුමතිපරිකප්පත්ථෙ' යි ද පාඨ යි,

පරිකල්පාර්ථයක් හැඟෙනකල්හි ද; (අනුත්තකාලෙ, වර්තමානකාල යෙහි හෝ කාලවිශෙෂයක් නියම නො කොට සම්භව වූ කාලයක හෝ); සත්තමී, සප්ත මීවිභක්ති වේ. අර්ථග්‍රහණයෙන් විධි, නිමන් ත්‍රණ, ප්‍රශ්න, ප්‍රාර්ථනා, ප්‍රාප්තකාලාදියෙහි ද සප්තමිවිභක්ති වේ. "සත්තමි එය්‍ය-පෙ-එය්‍යාමෙහ" යනු සප්තමීසංඥාසූත්‍ර යි. එය්‍යාදි ප්‍රත්‍යය දෙළොස සප්තමී නම් වෙයි යන අර්ථ යි.

කර්තෘකාරක පරස්මෛපදයෙහි අනුමත්‍යර්ථයෙහි "සො, හෙ තෙම; ඔදනං; බත; පචෙ – පචෙය්‍ය, පිසේවා" යනාදීන් ද, පරි කල්පාර්ථයෙහි "පචෙ, පිසේ නම්, (පිසී නම්, පිසන්නේ නම්)" යී ද අර්ථ කියයුතු. අනුමති නම් යම්කිසිවක් කරනු කැමැත්තා වූ අනිකක්හට අනුදැනීම ය හෙවත් ශිවිසීම ය. **පරිකල්ප** නම් කර්තව්‍යයාගේ නිශ්චයක් නැතිබව ය. ඉදින් වේ නම් යී සැලකීම (සිතින් විචාරණය) පරිකල්ප නමැ යි ස්සේයි. "සොදනි කිං නු බො භවෙ" යනු උදාහරණ යි. සො, හෙතෙම; ඉදනි, දූන්; කිං නු බො භවෙ, කුමක් වේ හෝ යන අර්ථ යි. "හෙතුකිරියාය සම්භවෙ ඵලකිරියාය සම්භවපරිකප්පො ච" යනු දක්වූ හෙයින් ඵලක්‍රියාවට නිමිත්ත වූ හෙතුක්‍රියාවගේ සම්භවයක් ඇතිකල්හි ඵල ක්‍රියාසංඛ්‍යාත විපාකක්‍රියාවගේ සම්භවය වෙයි. යන කල්පනාව ද හෙවත් හෙතුක්‍රියාව වුවහොත් ඵලක්‍රියාව වෙයි සිතීම ද පරිකල්ප නමි. "යදි සො පඨමවයෙ පබ්බජෙය්‍ය අරහා භවෙය්‍ය" ඉදින් හෙතෙම ප්‍රථමවයසෙහි පැවිදි වී නම් රහත් වන්නේ යි. "සචෙ සංඛාරා නිච්චා භවෙය්‍යුං න නිරුජ්ඣෙය්‍යුං" ඉදින් සංස්කාරයෝ නිත්‍ය වූ නම් නිරුද්ධ නොවන්නෝ ය; යනු ඊට උදාහරණ යි. තවද මේ අර්ථය මෙයිනුදු සුබොධ වේ :

"පාතො පචෙය්‍ය චෙ භුඤ්ජෙ ඉච්චත්‍ර පචනක්‍රියා
හෙතුභූතානි විඥෙය්‍යා ඵලනානුභවක්‍රියා" —

චෙ, ඉදින්; පාතො පචෙය්‍ය, උදැසන පිසුයේ වී නම්; භුඤ්ජෙ ඉති, කැයෙම් යන; එත්‍ර, මෙහි; පචනක්‍රියා, පාකක්‍රියා තොමෝ; හෙතුභූතානි, හෙතු වූ යයි; විඥෙය්‍යා, දතයුත්තී ය; අනුභව ක්‍රියා තු, භුඤ්ජනක්‍රියාව වනාහි; ඵලං, ඵල වූව යි (දතයුත්තී යි)— මෙහි "පචෙය්‍ය චෙ භුඤ්ජෙ" යන්නෙන් හෙතුඵලක්‍රියාද්වය ම දක්වනලදි. "පිසුයේ වී නම් කැයෙම්" යන මෙහි පළමුක්‍රියාව හෙතුකොට දෙවැනික්‍රියාව ඵලවශයෙන් තිපදී. මේ දෙක ම අනිශ්චිත හෙයින් පරිකල්පාර්ථයෙහි වේ. නිමන්ත්‍රණාර්ථය යට කියනලදි. ප්‍රශ්නාද්‍යර්ථ මෙසෙයින් දතයුතු:

"පඤ්හා සම්පුච්ඡනං ඉට්ඨාසිංසනං යාචනං ද්වෙ
පත්ථනා භත්තියා වාථ න වා බ්‍යාපාරණා විධි"

පඤ්හා, ප්‍රශ්න නම්; සම්පුච්ඡනං; විචාරීම ය; පත්ථනා, ප්‍රාර්ථනා නම්; ඉට්ඨාසිංසනං, කැමැතිදෑයක් පැතීම ය; යාචනං, ඉල්වීම ය යන; ද්වෙ, දෙදෙන ය; විධි, විධි නම්; භත්තියා වා, ආදරයෙන් හෝ; අථ, නැවත; න වා, අනාදරයෙන් හෝ; බ්‍යාපාරණා, මෙහෙයීම යි. විධියෙහි : "භවං පත්තං පචෙය්‍ය" භවං, පින්වත් තෙම; පත්තං, පාත්‍රය; පචෙය්‍ය, පිසන්නේ ය. නිමන්ත්‍රණයෙහි : "ඉධ භවං භුඤ්ජෙය්‍ය" භවං, පින්වත් තෙම; ඉධ, මෙහි; භුඤ්ජෙය්‍ය, වළඳුවා. ප්‍රශ්නයෙහි :- "කිං සො භත්තං පචෙය්‍ය උදාහු බ්‍යඤ්ජනං වා?" කිං, කිම; සො, හෙතෙම; භත්තං පචෙය්‍ය, බත් පිසේ ද; උදාහු, නොහොත්; බ්‍යඤ්ජනං වා, බ්‍යඤ්ජන (පිසේ) ද? ප්‍රාර්ථනායෙහි :- "අහො වත සො පචෙය්‍ය මෙ" සො, හෙතෙම; මෙ, මට; පචෙය්‍ය, පිසන්නේ වී නම්; අහො වත, යෙහෙකි. ප්‍රාප්තකාලයෙහි : "යදි සඞ්ඝස්ස පත්තකල්ලං සංඝො උපොසථං කරෙය්‍ය" සඞ්ඝස්ස, සඞ්ඝයාගේ (පෞෂථකර්මය); යදි, ඉදින්; පත්තකල්ලං, ප්‍රාප්තකාලය ඇත්තේ වී නම්; සංඝො, සංඝ තෙම; උපොසථං කරෙය්‍ය, පොහෝ කරන්නේ ය. විධ්‍යර්ථයෙහි පරිද්දෙන් අනුමත්‍යර්ථයෙහි ද : පචෙ - පචෙය්‍ය, පිසන්නේ ය; යනාදිනයින් අර්ථ කීම ද අභිමත යි. කර්මකාරකයෙහි ලබධ යෙදූ කල "පිසනු ලබන්නේ ය" යනාදීන් අර්ථෝච්චාරණය කටයුතු. භාවෙ, භාවයෙහි; භූයෙ - භූයෙය්‍ය - භූයෙථ, වීම වේවා; හෙවත් අනුමත්‍යාද්‍යර්ථයෙහි වීම යි. "පඤ්චමී-සප්තමී"යනු කාතන්ත්‍රකාර සර්වවර්මාදි පූර්වාචාර්යයන් කළ සංඥා යි.

සත්තමීවිභත්ති යි.

---

4

"අපච්චක්ඛෙ පරොක්ඛා'තීතෙ" යනු පරොක්ඛාවිභත්තිවිධි සූත්‍ර යි. අපච්චක්ඛෙ, (වක්තෘහුගේ) ඉඳුරන්ට විෂය නො වූ; අතීතෙ, ඉකුත්කලක් හැඟෙනකල්හි; පරොක්ඛා, පරොක්ෂා විභක්ති (වේ). "පරොක්ඛා අ-පෙ-ම්හෙ" යනු පරොක්ෂාසංඥා සූත්‍ර යි. අප්‍රත්‍යයාදි ප්‍රත්‍යය දොළොස පරොක්ෂා නම් වෙයි යන අර්ථ යි.

සො, හෙතෙම; ඔදනං, බත; පපච, පිසී ලු; තෙ - පෙ - පපචු, පිසූ ලු; පපචෙ, පිසූයෙහි ලු; පපචිත්ථ, පිසූවහු ලු; පපචි, පිසූ

යෙමි ලූ; පපච්මහ, පිසුයෙමු ලූ. ආත්මනෙපදයෙහි|ද මෙසේ මැ යි. කම්කාරකයෙහි පපච්චිත්‍ථ - පපච්චත්‍ථ, පිසනුලැබී ලූ; යනාදීන් අර්‍ථ කියයුතු. භාවෙ, භාවයෙහි; භූය - භූයිත්‍ථ - බභූය - බභූයිත්‍ථ, වීම ලූ; හෙවත් අප්‍රත්‍යක්‍ෂ අතීතයෙහි වීම යි.

**පරොක්‍ඛාවිභත්ති යි.**

---

**5**

"**හියොපභුති පච්චක්ඛෙ හීයත්තනී**" යනු හීයත්තනීවිභක්ති විධිසූත්‍ර යි. "අපච්චක්ඛෙ" යනු ද "අතීතෙ" යනු ද මෙහි අනුවෘත්ත වේ. පච්චක්ඛෙ, ඉන්ද්‍රියවිෂය වූ (හෝ); අපච්චක්ඛෙ, ඉන්ද්‍රිය විෂය නො වූ (හෝ); හීයොප්පභුති, ඊයේ පටන් කොට; අතීතෙ, ඉකුත්කාලයක් ගම්‍යමානකල්හි; හීයත්තනී, හීයත්තනීවිභක්ති (වේ). අද හැර අතීතකාලය මෙයින් වාච්‍ය හෙයින් භූතානද්‍යතනකාලයෙහි හීයත්තනීවිභක්ති වේ. "**හීයත්තනී ආ —පෙ— මහසෙ**" යනු හීයත්තනීසංඥාසූත්‍ර යි. **ආ** ආදී ප්‍රත්‍යය දොළොස හීයත්තනී නම් වෙයි යන අර්‍ථ යි.

කර්‍තෘකාරක පරස්මෛපදයෙහි : අපච, (ඊයේ පටන් අතීතයෙහි) පිසී; අපචු, පිසූ; අපචො, පිසුයෙහි; අපචත්‍ථ, පිසුවහු; අපචා, පිසුයෙමි; අපචම්හ, පිසුයෙමු. මෙහි "ඊයේ පටන් අතීතයෙහි" යනු අද්‍යතනඅතීතයෙන් වෙන් වූ හීයත්තනීවිභක්ත්‍යර්‍ථයාගේ අභිව්‍යක්තිය පිණිස යොදනුලැබේ.

කර්මකාරකයෙහි : අපච්චත්‍ථ, (ඊයේ පටන් අතීතයෙහි) පිසනුලැබී: අපච්චත්‍ථුං, පිසනුලැබූ; යනාදීන් අර්‍ථ යොදනු. භාවෙ, භාවයෙහි; අභූයත්‍ථ - පෙ - භූයථ, ඊයේ පටන් අතීතයෙහි වීම යි.

**හීයත්තනීවිභක්ති යි.**

---

**6**

"**සමීපෙ'ජ්ජතනී**" යනු අජ්ජතනීවිභක්තිවිධිසූත්‍ර යි. "අතීතෙ පච්චක්ඛෙ අපච්චක්ඛෙ" යනු මෙහි අනුවෘත්ත වේ. සමීපෙ, (අද ආදිකොට) සමීප වූ හෙවත් සමීපයෙහි පටන්; පච්චක්ඛෙ, ඉන්ද්‍රිය විෂය වූ (හෝ); අපච්චක්ඛෙ, ඉන්ද්‍රියවිෂය නො වූ (හෝ); අතීතෙ, ඉකුත්කලක් හැඟෙනකල්හි; අජ්ජතනී, අජ්ජතනීවිභක්ති (වේ). අජ්ජතනීවිභක්ති තොමෝ භූතසාමාන්‍යකාලය හෙවත් අද ආදි

කොට ඇති අතීතකාලය ප්‍රකාශ කරන්නී ය. මෙහි අජ්ජශබ්දයෙන් වාච්‍ය වූ "අද" යන කාලය කොපමණෙක් ද යත්? ලොකයෙහි වනාහි අරුණෝදයකාලය පටන් අතික් අරුණෝදය කාලය දක්වා ද සූර්‍යෝදයකාලය පටන් අතික් සූර්‍යෝදය කාලය දක්වා ද අද ය යි ව්‍යවහාර කරනුලැබේ. වෛයාකරණ මතයෙහි ඉකුත්රාත්‍රිය සම්බන්ධි වූ පශ්චිමයාමය හෝ ඒ යාමයාගේ පශ්චිමාර්ධය හෝ ඇතුළත් කොට ගෙන සැටපැයක් ප්‍රමාණ කාලය අද ය යි කියනුලැබේ. හෙවත් ඊයේ රෑයින් දසපැයක් හෝ පස්පැයක් හෝ අදට ඇතුළතැ යි කියනුලැබේ. තවද මේ සඳහා වෛයාකරණයන්ගේ මතාන්තර ද දක්වනලද්දේ ය :

"අහස්සුභයතො අඩ්ඪරත්තං වා තදුපඩ්ඪකං
අන්තොකත්වාන විසෙසද්දයො අහො අජ්ජතනො ඉති"

අහස්ස, දිනයාගේ; උභයතො, දෙකෙළවරින්; අඩ්ඪරත්තං වා, අර්ධරාත්‍රයක් හෙවත් පසළොස්පැයක් හෝ; තදුපඩ්ඪකං, එයින් අර්ධයක් හෙවත් සත්පැසමාරක් හෝ; අන්තොකත්වාන, ඇතුළත් කොට; අහො, දිවසභාගය තෙම; අජ්ජතනො ඉති, අද්‍යතනකාල යයි (අද දවසැ යි) කියා; විසෙසද්දයො, දතයුත්තේ ය. මෙහි ගත වූ රෑයින් පසළොස්පැයක් හෝ සත්පැසමාරක් හෝ අදට ඇතුළතැ යි කියනලද්දේ ය. සංස්කෘතවෛයාකරණයන් විසිනුදු "අතීතායා රාත්‍රෙර්‍යාමද්වයාදර්ගාගාමින්‍යාඃ ප්‍රථමං යාමද්වයං දිවසඃ කාලඃ සො'ද්‍යතනඃ" යී චතුර්‍යාමාත්මක අතීතරාත්‍රියගේ පශ්චිමයාමද්වය පටන් අනාගතරාත්‍රියගේ ප්‍රථමයාමද්වය දක්වා දවසෙක, හේ අද්‍යතනකාල නමැ යි කියනලදි. සමහර ආචාර්‍යකෙනෙක් අතීතරාත්‍රියගේ පශ්චිමයාමසංඛ්‍යාත සත්පැසමාරෙක, අනාගතරාත්‍රියගේ ප්‍රථමයාමසංඛ්‍යාත සත්පැසමාරෙක, දහවල් සතරයාමයෝ ද යි යාමසයක් හෝ පූර්වාපරරාත්‍රි දෙක්හි පසුපෙරයම් දෙකින් තුන්පැමුක්කාලක් බැගින් ගෙන දිනය හා සමග යාම පසක් හෝ අද්‍යතනකාලය යි සලකත්. හෙ ද කියන ලද මැ යි :—

"ගතාය පච්ඡිමො යාමො පච්ඡිමද්ධම්මස්ස වා
පහාරො'නාගතායාදි තද්ධමපි වා තථා
වුත්තකාලාවධිමජ්ඣකාලො සො'ජ්ජතනො මතො" යි —

මෙසේ සියලු මතාන්තරවශයෙන් ඊයේ රෑයින් පසළොස්පැයක් හෝ දසපැයක් හෝ සත්පැසමාරක් හෝ පස්පැයක් හෝ තුන්පැපන්සාලිස්විනාඩිකාවක් හෝ අද්‍යතනකාලයට ඇතුළත් වේ. මේ අද්‍යතනකාලය ද අතීත වර්තමාන අනාගත වශයෙන්

තුන්වැදෑරුම් එයින් අතීතාද්‍යතනයෙහි අජ්ජතනිවිභක්තිය ද වර්තමානාද්‍යතනයෙහි වර්තමානාවිභක්තිය ද අනාගතාද්‍යතනයෙහි භවිස්සන්තිවිභක්තිය ද යෙදියයුතු.

"අජ්ජතනි ඊ-පෙ-ම්හෙ" යනු අජ්ජතනිසංඥාසූත්‍ර යි. ඊ ආදී ප්‍රත්‍යය දොළොස අජ්ජතනි නම් වෙයි යන අර්ථ යි. කර්තෘකාරක පරස්මෛපදයෙහි : සො, හෙතෙම; ඔදනං, බත; අපචි, (අතීතයෙහි) පිසී; අපචිංසු, පිසූ; අපචො, පිසූයෙහි; අපචිත්ථ, පිසූවහු; අපචිං, පිසූයෙමි; අපචිම්හා, පිසූයෙමු. ආත්මනෙපදයෙහි දු මෙසේ මැ යි. කර්මකාරකයෙහි: අපච්චා, (අතීතයෙහි) පිසනුලැබී; යනාදීන් සුදුසු සේ අරුත් බිණියයුතු. භාවයෙහි :- අභුයි, භූයි – අභූයා, භූයා, (භූතසාමාන්‍යයෙහි) වීම යි. මේ විභක්තිය සමීපයෙහි පටන් ප්‍රත්‍යක්ෂ අප්‍රත්‍යක්ෂ සියලු අතීතයෙහි ම යෙදියයුතු යි.

යම් කාලෙක්හි 'මා' යන නිපාතය හා ධාතූන්ගේ යොගය වේ ද එකල්හි "මායොගෙ සබ්බකාලෙ ච" යන සූත්‍රයෙන් හීයත්තනි අජ්ජතනි විභක්තීහු වර්තමානාදි සියලුකල්හි දු වෙති. චග්‍රහණයෙන් එසේ ම පඤ්චමීවිභක්ති ද වේ. මා පචති – මා පචා – මා පචිස්සති, දැන් නොපිසේ; පෙර නොපිසී; මතු නොපිසන්නේ ය; යන කාලත්‍රයාර්ථයෙහි ම "මා පචා"යි හීයත්තනි ක්‍රියාව ද "මා පචි"යි අජ්ජතනික්‍රියාව ද "මා පචතු" යි පඤ්චමීක්‍රියාව ද යෙදේ.

අජ්ජතනිවිභක්ති යි.

---

7

"අනාගතෙ භවිස්සන්ති" යනු භවිස්සන්තිවිභක්තිවිධිසූත්‍ර යි. අනාගතෙ, අනාගතකාලයක් හැඟෙනකල්හි; භවිස්සන්ති, භවිස්සන්තිවිභක්ති (වේ.) නොපැමිණියේ හෙවත් පටන්නොගන්නා ලද්දේ අනාගත නම්. ප්‍රත්‍යයන්ගේ සමවායක් ඇතිකල්හි උපදනට සුදුසු වූයේ යන අර්ථ යි. "භවිස්සන්ති ස්සති -පෙ- ස්සාම්හෙ" යනු භවිස්සන්තිසංඥාසූත්‍ර යි. ස්සත්‍යාදි ප්‍රත්‍යය දොළොස භවිස්සන්ති නම් වෙයි යන අර්ථ යි. කර්තෘකාරකපරස්මෛපදයෙහි :- සො, හෙතෙම; ඔදනං, බත; පචිස්සති, (මතු) පිසන්නේ ය; පචිස්සන්ති, පිසන්නාහු ය; පචිස්සසි, පිසන්නෙහි ය; පචිස්සථ, පිසන්නාහු ය; පචිස්සාමි, පිසන්නෙමි; පචිස්සාම, පිසන්නෙමු. මෙහි "මතු" යනු විධික්‍රියායෙන් වෙසෙසා අනාගතසාමාන්‍යක්‍රියාවක් ප්‍රකාශ කරනු පිණිස කියනුලැබේ. ඒ තැන ද අන්නේප්‍රත්‍යයාදී යෙන් ම සිංහලභාෂායෙහි අනාගතකාලය ප්‍රකාශ ම ය. වර්තමානා

විභක්තියෙහි මෙන් මෙහි ද "පිසේ, පිසෙත්" යනාදීන් පුරාතනයෝ අර්ථ කියති. එසේ කියන කල "මතු" කියා හෝ "අනාගතයෙහි" කියා හෝ නිත්‍යයෙන් පෙරටුව යොදා කියයුතු යි. සො, හෙතෙම; ඔදනං, බත; පචිස්සති, මතු පිසේ; (අනාගතයෙහි පිසේ;) යනාදි ක්‍රමයෙනි. ආත්මනෙපදයෙහි ද මෙසේ මැ යි. කර්මකාරකයෙහි- පචියිස්සතෙ, පචිස්සතෙ, පච්චිස්සතෙ, (මතු) පිසනුලබන්නේ ය; (මතු පිසනුලැබේ; කියා හෝ) මේ ආදිනයින් අර්ථොච්චාරණය කටයුතු. භාවයෙහි :- භූයිස්සති -පෙ- භවිස්සතෙ, අනාගතයෙහි වීම යි.

අතීතකාලය ද අනාගතකාලය කොට කියනු කැමැති කල්හි "අනෙකජාතිසංසාරං සන්ධාවිස්සං" යනාදියෙහි මෙන් අතීතයෙහි ද භවිස්සන්ති විභක්ති වේ. 'සන්ධාවිස්සං' යනු 'සන්ධාවිං' යන අජ්ජතනිපරස්සෙපද ප්‍රථමපුරුෂෛකවචනයාගේ අර්ථ ඇත්තේ යි. මුගලන්ව්‍යාකරණයෙහි "නාමෙ ගරහාවිම්හයෙසු" යන සූත්‍රයෙන් නිපාත වූ නාමශබ්දය විද්‍යමානකල්හි නින්දාවක් ද ආශ්චර්‍ය්‍යයක් ද හැඟෙනකල භවිෂ්‍යද්විභක්ති වෙයි කියනලදී. ගර්හායෙහි :- "සාපි නාම පචිස්සති" (ඕ තොමෝත් පිසන්නී ද?) යනු උදාහරණ යි. ආශ්චර්‍ය්‍යයෙහි : "අච්ඡරියං වත භො අබ්භූතං වත භො අන්ධො නාම පචිස්සති" (භවත්නි ඒකාන්තයෙන් ආශ්චර්‍ය්‍යයෙකි; භවත්නි ඒකාන්තයෙන් අද්භූතයෙකි; අන්ධයෙක් නම් පිසන්නේ ද?) යනු උදාහරණ යි.

**භවිස්සන්තිවිභක්තිය යි.**

---

## 8

"ක්‍රියාතිපන්නෙ'තීතෙ කාලාතිපත්ති" යනු කාලාතිපත්ති විභක්තිවිධිසූත්‍ර යි. ක්‍රියාතිපන්නෙ, ක්‍රියාවගේ අතික්‍රමණමාත්‍ර වූ; අතීතෙ, ඉකුත් කාලයක් හැඟෙනකල්හි; කාලාතිපත්ති, කාලාතිපත්තිවිභක්ති වේ. මෙහි අතීතකාලත්වය ක්‍රියාවගේ නිමාවෙකින් (සිදුවීමෙකින්) නොවන හෙයින් අතික්‍රමණමාත්‍රයෙන් වේ. ක්‍රියාව සිද්ධ වියයුතු කාලය ඉක්ම ගිය බව මෙහි අතීතත්වය යි. වෘෂ්ට්‍යාදි අන්තරායකරුණක් පැමිණීමෙන් හෝ කාෂ්ඨාදි උපකරණයක්හුගේ අඩුබවෙකින් හෝ පචනක්‍රියාව සිද්ධ නො ව ඉක්මගිය හැකි වේ. (මෙසේ) විරුද්ධප්‍රත්‍යයන්ගේ සම්ප්‍රාප්තියෙකින් හෝ උපකරණයන්ගේ අසම්පූර්ණත්වයෙකින් හෝ ක්‍රියාව ඉක්ම යාම කලාතිපත්ති නම් වේ. ඒ වනාහි (විරුද්ධප්‍රත්‍යයන්ගේ පැමිණීම නිසා හෝ උපකරණ නොලැබීම නිසා හෝ) කර්තෘහුගේ ශක්තිය

නැති වීමෙන් ඒකාන්තයෙන් ම ක්‍රියාව සිද්ධ නොවන බව ය. "හෙතුක්‍රියාය අසම්භවෙන ඵලක්‍රියාය අච්චන්තං අසම්භවො" යි බුද්ධප්‍රියාචාර්‍ය්‍යපාදයන් විසින් මෙහි තාත්පර්‍ය්‍යාර්ථය දක්වනලදි. හෙතුක්‍රියාය, (අවකීර්ණය භාණ්ඩප්‍රතිලාභය යනාදි) හෙතුක්‍රියාවගේ; අසම්භවෙන, නො ලැබීමෙන්; ඵලක්‍රියාය, (පචනාදිස්වරූප) ඵල ක්‍රියාවගේ; අච්චන්තං, අතිශයෙන්; අසම්භවො, නො ලැබීම (කාලාතිපත්ති නම් වෙයි) යන අර්ථ යි. මහර්ෂි පාණිනිහු විසින් "භවිෂ්‍යති" යනු වැටෙන්නෙහි "ලිඞ්නිමිත්තෙ ලෘඞ් ක්‍රියාතිපත්තෞ" (3. 3. 139) යන සූත්‍රයෙක් ද; මේ සියලු සූත්‍රය වැටෙන්නෙහි "භූතෙ ච" (3. 3. 140) යන සූත්‍රයෙක් ද ක්‍රියාතිපත්තිය සඳහා හදුහරනලදහ. මේ සූත්‍රද්වයෙන් භවිෂ්‍යත්කාලාතිපත්තියක් ද භූතකාලාතිපත්තියක් ද යි අනාගත අතීත කාලාතිපත්ති දෙකක් දක්වූහ. එයින් අනාගතකාලාතිපත්තිය කාත්‍යායනාචාර්‍ය්‍යපක්ෂයෙහි මාගධවෛයාකරණයන්ට අනභිමත හෙයින් අතීතකාලාතිපත්තිය පමණෙක් ම "ක්‍රියාතිපන්නෙ'තීතෙ කාලාතිපත්ති" යන්නෙන් ප්‍රකාශිත ය. එසේ ද වුවත් පාණිනියමතානුයායී මෞද්ගල්‍යායනාචාර්‍ය්‍යයෝ "එය්‍යාදො වාතිපත්තියං" යනාදි සූත්‍රයෙන් අතිත අනාගතකාලදෙක්හි ම කාලාතිපත්තිය හදුළහ. පාණිනිමෞද්ගල්‍යායනාදි ආචාර්‍ය්‍යයන්ට අභිමත වූ කාලාතිපත්තිය නම් විරුද්ධප්‍රත්‍යයසමවායෙන් හෝ කාරණවෛකල්‍යයෙන් හෝ අතීතානාගතක්‍රියාවන්ගේ නොනිපදීම ය. "කුතශ්චිද්වෛගුණ්‍යාදනභිනිර්වෘත්තිඃ ක්‍රියායාඃ ක්‍රියාතිපත්තිඃ" යනු කාශිකා යි. කුතශ්චිත් + වෛගුණ්‍යාත්, කිසියම් විරුද්ධප්‍රත්‍යයෙකින්; ක්‍රියායාඃ, ක්‍රියාවගේ අනභිනිර්වෘත්තිඃ, නොනිපදීම; ක්‍රියාතිපත්තිඃ, ක්‍රියාතිපත්ති නම්. "ක්‍රියායා අතික්‍රමඃ අතිපත්තිඃ, අසිද්ධිරිත්‍යර්ථඃ" ක්‍රියාවගේ ඉක්මීම ය නොනිපදීම ය සිදු නොවීම ය යන අර්ථ යයි සදූනඥිටීකායෙහි විස්තර කරනලදි. වර්තමාන කාලයෙහි ඒකක්ෂණයෙහි ම ගම්‍යගමක වූ අතිපත්තිනිමිත්ත ක්‍රියාද්වය නොවන හෙයින් වර්තමානයෙහි ක්‍රියාතිපත්තියක් නො ලැබේ. එහෙයින් මෞද්ගල්‍යායනපඤ්චිකාප්‍රදීපයෙහි ෂඩ්භාෂා පරමේශ්වර ත්‍රිපිටකවාගීශ්වරාචාර්‍ය්‍ය ශ්‍රී රාහුල මහාස්වාමිපාදයන් විසින් මේ ගෙනහැර දක්වනලදි :

"අභාවාසම්භවාද්භාවෙ වර්තමානෙ'වතිෂ්ඨතෙ
ක්‍රියාතිපත්තිස්සාමර්ථ්‍යාද් භවිෂ්‍යද්භූතගොචරා" යි

වර්තමානෙ භාවෙ, වර්තමාන වූ ක්‍රියායෙහි; අභාවාසම්භවාත්, අභාවසම්භව නොවන හෙයින්; සාමර්ථ්‍යාත්, අර්ථබලයෙන්;

ක්‍රියාතිපත්තිඃ, ක්‍රියාතිපත්ති තොමෝ; භවිෂ්‍යද්භූතගොචරා, භවිෂ්‍යත්කාලය ද භූතකාලය ද විෂයකොට ඇත්තී; අව තිෂ්ඨතෙ, සිටිනී ය"।

"ක්‍රියාතිපත්ති ස්සා -පෙ- ස්සාමහසෙ" යනු කාලාතිපත්තිසංඥ සූත්‍ර යි. ස්සාදි ප්‍රත්‍යය දොළොස කාලාතිපත්ති නම් වෙයි යන අර්ථ යි. මෙහි පරිකල්පාර්ථසප්තමීක්‍රියායොගයෙහි මෙන් "චෙ, සචෙ, යදි" යන අනියමාර්ථනිපාතයක් හා හෙතුක්‍රියාවක් ද පූර්ව කොට යොදනුලැබේ. හෙතුක්‍රියාව සප්තමීවිභක්තියෙනු දු කාලාතිපත්ති යෙනු දු අවිශෙෂයෙන් යෙදේ. "සචෙ තබ්බිරුද්ධං න භවෙය්‍ය තදුපකරණං වා ලභෙථ අපචිස්සා" සචෙ, ඉදින්; තබ්බි රුද්ධං, එයට විරුද්ධකාරණයෙක්; න භවෙය්‍ය, නොවී නම්; තදුප කරණං, එයට උපකරණයක්; ලභෙථ වා, ලද්දේ වී නම් හෝ; අපචිස්සා, (බත) පිසූයේ යි. මෙහි "භවෙය්‍ය, ලභෙථ" යන හෙතු ක්‍රියා දෙක ම සප්තමියෙන් ප්‍රයුක්ත යි. "සො චෙ තං යානං අලභිස්සා, අගච්ඡිස්සා" සො, හෙතෙම; චෙ ඉදින්; තං යානං, ඒ යානය; අලභිස්සා, ලද්දේ වී නම්; අගච්ඡිස්සා, ගියේ යි. මෙහි 'අලභිස්සා' යන හෙතුක්‍රියාව ද 'අගච්ඡිස්සා' යන ඵලක්‍රියාව ද කාලාතිපත්තියෙන් ප්‍රයුක්ත යි. "නො චෙ තං භික්ඛවෙ බාලො දුච්චින්තිතචින්තී ච අභවිස්ස -පෙ- කෙන තං පණ්ඩිතා ජානෙය්‍යුං" "නො චෙ තං භික්ඛවෙ සක්කා අභවිස්ස අකුසලං පජහිතුං නාහං එවං වදෙය්‍යං" යනාදිතැන්හි 'අභවිස්ස' යන හෙතුක්‍රියාව කාලාති පත්තියෙන් ද "ජානෙය්‍යුං, වදෙය්‍යං" යන ඵලක්‍රියා සප්තමි යෙන් ද පැනෙන හෙයින් පෙරපසුක්‍රියා දෙක්හි ම සප්තමීකාලා තිපත්තීන්ගේ ප්‍රයොගය මිශ්‍රවශයෙන් ද සලකනු. මුගලන්විය රණෙහි "දක්ඛිණෙන චෙ අගමිස්සා න සකටං පරියාභවිස්සා" යනු භවිෂ්‍යත්ක්‍රියාතිපත්තියට උදාහරණ යි: චෙ, ඉදින්, දක්ඛි ණෙන, දකුණෙන්; අගමිස්සා, යන්නේ වීනම්; සකටං, ගැල; න පරියාභවිස්සා, නොපෙරළෙන්නේ යි. මේ වූ කලි ආචාර්‍ය්‍ය ජයාදිත්‍යයන් විසින් කාශිකාවෘත්තියෙහි දැක්වූ "දක්ෂිණෙන චෙද්‍යාස්‍යන්න ශකටං පර්‍ය්‍යාභවිෂ්‍යත්" යන උදාහරණය මැ යි. ආචාර්‍ය්‍ය වොපදෙවාදීන්ට වනාහි ධාත්වර්ථයාගේ අතිපත්ති සංඛ්‍යාත වූ මේ ක්‍රියාතිපත්තිය කාලත්‍රයෙහි ම ඉෂ්ට යි.

කර්තෘකාරකපරසෛමපදයෙහි :- (සචෙ) සො (ඉන්ධනං අල භිස්ස) ඔදනං අපචිස්ස, (ඉදින්) හෙතෙම (දර ලද්දේ නම්) බත පිසූයේ ය; (සචෙ) තෙ (ඉන්ධනං අලභිස්සංසු) ඔදනං අපචිස්සංසු, (ඉදින්) ඔහුතුමූ (දර ලද්දාහු නම්) බත පිසූවාහු ය; යනාදීන්

හෙතුඵලක්‍රියා යොදා අර්ථ කියයුතු. ආත්මනෙපදයෙහි ද මෙසේ මැයි. කර්මකාරකයෙහි :- (සමෙ) නෙත (භුඤ්ජිතං අලභිස්සථ) සො ඔදනො අපචියිස්සථ, (ඉදින්) ඔහු විසින් (දර ලබනලද්දේ වී නම්) ඒ ඔදනය තෙම පිසනුලැබූයේ ය; යනාදීන් යොදා කිය යුතු. භාවයෙහි :- අභූයිස්ස —පෙ— භූයිස්සථ, (කාරණවෛකල්‍ය යෙක් නොවී නම්) වීම වූයේ යි.

**කාලාතිපත්තිවිභත්තිය යි.**

---

9

**“ධාතූහි ණෙ-ණය-ණාපෙ-ණාපයා කාරිතානි හෙත්වත්ථෙ”** යනු විධ්‍යඞ්ගසංඥසූත්‍ර යි; හෙවත් ණෙප්‍රත්‍යයාදිවිධාන හා කාරිත සංඥසූත්‍ර යි. හෙත්වත්ථෙ, හෙත්වර්ථයක් හැඟෙන කල්හි; ධාතූහි, ධාතූන් කෙරෙන්; ණෙණයණාපෙණාපයා, ණෙ ණය ණාපෙ ණාපය යන මොහු (වෙති); කාරිතානි, කාරිත නම්ද (වෙත්). **“යො කරොති ස කත්තා”** යනු සූත්‍ර හෙයින් තමා ප්‍රධාන ව ක්‍රියාව කරන තැනැත්තේ (ශුද්ධ) කර්තෘ නමි. **“යො කාරෙති ස හෙතු”** යනු සූත්‍ර හෙයින් ඔහු ලවා ක්‍රියාව කරවන (මෙහෙයන) තැනැත්තේ හෙතුකර්තෘ නමි. මෙබඳු හෙතුකර්තෘකාරකයකුගේ ක්‍රියාවක් හැඟවුවමනා කල්හි ධාතූහු කෙරෙන් ණෙ ආදි එක්තරා ප්‍රත්‍යයක් කොට වර්තමානාදි අෂ්ටවිභක්තියෙහි ම රූපසාධනය කරනුලැබේ. මෙහි විශෙෂාවබොධනය පිණිස බුද්ධප්‍රියාචාර්යපාද යන් විසින් මේ ගාථාචතුෂ්ටය දක්වනලදි :

“ණෙණයාව උවණ්ණන්තා ආතො ද්වෙ පච්ඡිමා සියුං
සෙසතො චතුරො ද්වෙ වා වාසද්දස්සානුවත්තිතො ෴

අකම්මා ධාතුයො හොන්ති කාරිතෙ තු සකම්මකා
සකම්මකා ද්විකම්මාස්සු ද්විකම්මා තු තිකම්මකා ෴

තස්මා කත්තරි කම්මෙ ච කාරිතාඛ්‍යාතසම්භවො
න භාවෙ සුද්ධකත්තා ච කාරිතෙ කම්මසඤ්ඤිතො ෴

නියාදීනං පධානං ච අප්පධානං දුහාදිනං
කාරිතෙ සුද්ධකත්තා ච කම්මමාඛ්‍යාතගොචරං” ෴

“(මණ්ඩූකප්ලුතින්‍යායයෙන් මේ සූත්‍රයට) වැටුණා වූ වාශබ්දය හෙතු කොට ගෙන උවර්ණාන්තධාතූන් කෙරෙන් පර ව ණෙ ප්‍රත්‍යය, ණයප්‍රත්‍යය යන මොහු දෙදෙන ම වන්නාහ; ආකාරාන්තධාතූන් කෙරෙන් පර ව **ණාපෙ, ණාපය,** යන මොහු

දෙන ම වන්නාහ; සෙසු (ව්‍යඤ්ජනාන්ත ඉවර්ණාන්ත අකාරාන්ත) ධාතූන් කෙරෙන් පර ව විකල්පයෙන් (ණෙ ණයාදි) සතරදෙන හෝ (පශ්චිම) දෙදෙන හෝ වන්නාහ. (සතරදෙන ව්‍යඤ්ජනාන්තධාතූන් කෙරෙන් පරව ද පශ්චිම දෙදෙන ඉවර්ණාන්තඅකාරාන්තධාතූන් කෙරෙන් පරව ද වෙති යි සේයි.) කාරිතප්‍රත්‍යය හා යෝගයක් ඇති කල්හි අකර්මකධාතූහු සකර්මක වෙති. සකර්මකධාතූහු ද්විකර්මක වන්නාහු ය. ද්විකර්මකධාතූහු ද ත්‍රිකර්මක වන්නාහ — එහෙයින් කාරිතප්‍රත්‍යය හා යෝගයක් ඇතිකල්හි කර්තෘකාරක කර්මකාරක දෙක්හි ම ආඛ්‍යාතවිභක්තීන්ගේ සම්භවය වන්නේ ය. (කාරිතප්‍රත්‍යයයෝගයෙහි) භාවයෙහි ආඛ්‍යාතවිභක්තීන්ගේ සම්භවය නො වේ; කාරිතප්‍රත්‍යය කළ කල්හි (පෙර සිටි) ශුද්ධකර්තෘ ද කර්මසංඥ වන්නේ යි. කාරිතප්‍රත්‍යය කළ කල්හි "නී පාපුණෙත" යනාදි ද්විකර්මක ධාතූන්ගේ අප්‍රධානකර්මය ද, ශුද්ධකර්තෘ වූ කාරිතකර්මය ද ආඛ්‍යාතවිභක්තීන්ට ගොචර වේ. මෙ කී කර්මයෝ තුන්දෙන ආඛ්‍යාතයා විසින් උක්තකර්ම වෙති යි සේයි" —

මෙහි දක්වූ පරිද්දෙන් කාරිතප්‍රත්‍යය කළ කල්හි අවිශෙෂයෙන් සියලු ධාතූන්ගේ ම පෙරසිටි ශුද්ධකර්තෘ තෙම කර්මසංඥ වන්නේ යයි බුද්ධප්‍රියාදි ඇතම් ආචාර්යකෙනෙකුන්ට අභිමත හෙයින් ඒ ආචාර්යයන්ට "සූදජෙට්ඨො සූදං ඔදනං පාචෙති' යි කාරිතාන්ත පචධාතුයොගයෙහි ද ශුද්ධකර්තෘ වූ සූදයාගේ කර්මත්වය ඉෂ්ට වේ. ආචාර්ය පාණිනි ආදීන්ට වූ කලි මෙබඳු තැන සූදයාගේ කර්මත්වය අනභිමත ය. "සූදෙන" යි අනුක්තකර්තෘත්වයෙන් තෘතීයාන්ත ව සිටීම මැ අභිමත යි. එහෙයින් පාණිනීය මතානුයායී ආචාර්ය මෞද්ගල්‍යායනාදි මාගධශබ්දශාස්ත්‍රාචාර්යවරයෝත් 'සූදජෙට්ඨො සූදෙන ඔදනං පාචෙති' යි තෘතීයාන්ත කොට උදාහරණ කළහ. බාලාවතාරකර්තෘ වූ ආචාර්ය ධර්මකීර්ති පාදයෝත් එසේ ම තෘතීයාන්ත උදාහරණය දක්වීමෙන් පාණිනීයමතාවලම්බනය කළෝ.

"ගති බුද්ධි භුජ පඨ හර කර සයාදීනං කාරිතෙ වා" යන සූත්‍රයෙන් ගමනාර්ථ, බොධාර්ථ, ආහාරාර්ථ, ශබ්දාර්ථධාතූහු ද හර- හරණෙ, කර- කරණෙ, සී- සයෙ, 'ආදි ධාතූහු ද යි යන මොවුන් අතුරෙහි අකර්මකධාතූන් කාරිතප්‍රත්‍යය කළ කල්හි විකල්පයෙන් සකර්මක ද එසේ ම සකර්මකධාතූන් ද්විකර්මක ද ද්විකර්මකධාතූන් ත්‍රිකර්මක ද වනබැව් දක්වීම සූත්‍රකාරයන්ට අභිමත වී යයි හැඟෙන හෙයින් "පාචෙති" යන ක්‍රියායෝගයෙහි ගමනාද්‍යර්ථයන්

කෙරෙත් පිටත් (පාකාර්) පචධාතුහුගේ ශුද්ධකර්තෘ තෙම "සූදං" යි ද්විතීයාන්ත නො වෙයි, "සූදෙන" යි තෘතීයාන්ත ම වෙයි යනු පාණිනීයමතානුසාරයෙන් සැලකියයුතු.

වර්තමානහෙත්වර්ථයෙහි ණෙප්‍රත්‍යය කළ කල්හි : සො, හෙ තෙම; සූදෙන, අරක්කැමියා ලවා; ඔදනං, බත; පාචෙති, (දූන්) පිසවයි; තෙ -පෙ- පාචෙන්ති, පිසවත්; පාචෙසි, පිසවහි; පාචෙථ, පිසවහු; පාචෙමි, පිසවමි; පාචෙම, පිසවමු. ආත්මනෙපදයෙහි : ණයප්‍රත්‍යය ණාපෙප්‍රත්‍යය ණාපයප්‍රත්‍යය කළ කලහි දු අර් මෙසේ මැ යි. කර්මකාරකයෙහි : තෙන, ඔහු විසින්; සූදෙන අරක්කැමියා ලවා; සො ඔදනො, ඒ බත තෙම; පාචියතෙ, (දූන්) පිසවනුලැබේ. යනාදීන් අර් යොදනු. අට්ඨවිහත්තීසු, (වර්තමානාදි) අෂ්ටවිභක්තියෙහි; නයානුසාරෙන, ප්‍රකාත්‍යනුසාරයෙන්; ඤෙයයං, දතයුතු.

### කාරිතප්‍රත්‍යය යි

---

### 10

පච- පාකෙ, පච යන ධාතුහු පිසීමෙහි වැටේ : පචති : පිසේ; පචන්ති, පිසෙත්; ඉත්‍යාදි, යනාදි රූප වේ. භූවාදි, භූවාදි ධාතු ගණය යි. රුධි- ආවරණෙ, රුධි යන ධාතු වැළැක්මෙහි වැටේ : රුන්ධති, වළකයි; රුන්ධන්ති, වළකත්. දිවු- කීළාදිමහි, දිවු යන ධාතු ක්‍රීඩාදිඅර්ථයෙහි වැටේ : දිබ්බති, කෙළියි; දිබ්බන්ති, කෙළිත්. සු- සවනෙ, සු යන ධාතු ඇසීමෙහි වැටේ : සුණොති, අසයි; සුණන්ති, අසත් : කී- දබ්බවිනිමයෙ, කී යන ධාතු ද්‍රව්‍යගනුදෙනු යෙහි වැටේ : කිණාති, මිල දී ගනී; කිණන්ති, මිල දී ගනිත්. ගහ- උපාදානෙ, ගහ යන ධාතු ගැන්මෙහි වැටේ : ගණ්හාති, ගනී; ගණ්හන්ති, ගනිත්. කර- කරණෙ, කර යන ධාතු කිරීමෙහි වැටේ : කරොති, කෙරෙයි; කරොන්ති, කෙරෙත්. චුර- ථෙය්‍යෙ, චුර යන ධාතු සොරකම්හි වැටේ : චොරෙති, සොරකම් කෙරෙයි; චොරෙන්ති, සොරකම් කෙරෙත්; ඉත්‍යාදි, යනාදිය වේ. චුරාදි, චුරාදි ධාතුගණය යි.

### විකරණප්‍රත්‍යයප්‍රභෙද යි.

---

### 11

භොත්තුං ඉච්ඡති ඉති, කනු කැමැත්තේ ය යන අර්ථයෙහි; බුභුක්ඛති ඉත්‍යාදි, බුභුක්ඛති යනාදිය වේ; භුජධාතුහු කෙරෙන් ඛප්‍රත්‍යය යි. ඝසිතුං ඉච්ඡති ඉති, කනුකැමැත්තේ ය යන අර්

යෙහි; ජිඝච්ඡති ඉත්‍යාදි, ජිඝච්ඡති යනාදිය වේ; ඝසධාතුහු කෙරෙන් ඡප්‍රත්‍යය යි. හරිතුං ඉච්ඡති ඉති, හැරගනු කැමත්තේ ය යන අර්ථයෙහි; ජිගිංසති ඉත්‍යාදි, ජිගිංසති යනාදිය වේ. හර ධාතුහු කෙරෙන් සප්‍රත්‍යය යි. සොතුං ඉච්ඡති ඉති, අසනු කැමැත්තේ ය යන අර්ථයෙහි; සුස්සූසති ඉත්‍යාදි, සුස්සූසති යනාදිය වේ; සුධාතුහු කෙරෙන් සප්‍රත්‍යය යි. පාතුං ඉච්ඡති ඉති, බොනු කැමැත්තේ ය යන අර්ථයෙහි; පිවාසති ඉත්‍යාදි, පිවාසති යනාදිය වේ; **පා** (පානෙ) යන ධාතුහු කෙරෙන් සප්‍රත්‍යය යි. පබ්බතං ඉව, පර්වතයක් මෙන්; අත්තානං, තමා; ආචරති ඉත්‍යර්ථෙ කෙරෙයි යන අර්ථයෙහි; පබ්බතායති ඉත්‍යාදි, පබ්බතායති යනාදිය වේ; ද්විතීයාන්ත පබ්බතශබ්දයා කෙරෙන් ආයප්‍රත්‍යය යි. පුත්ත ඉව, පුතකු මෙන්; ආචරති ඉති අර්ථෙ, කෙරෙයි යන අර්ථයෙහි; පුත්තීයති ඉත්‍යාදි, පුත්තීයති යනාදිය වේ; ද්විතීයාන්ත පුත්ත ශබ්දයා කෙරෙන් ඊයප්‍රත්‍යය යි. අත්තනො, තමනට; පත්තං, පාත්‍රයක්; ඉච්ඡති ඉති අර්ථෙ, කැමැත්තේ ය යන අර්ථයෙහි; පත්තීයති ඉත්‍යාදි, පත්තීයති යනාදිය වේ; ද්විතීයාන්ත පත්ත ශබ්දයා කෙරෙන් ඊයප්‍රත්‍යය යි. ධාතුරූපෙ, ධාතුරූපයක් නිපදවියයුතුකල්හි; විසුද්ධයති දල්හයති අභිහත්ථයති ඉත්‍යාදි, විසුද්ධයති දල්හයති අභිහත්ථයති යනාදිය වේ; විසුද්ධයති, පිරිසුදු වෙ යි; දල්හයති, දැඩි කෙරෙයි; අභිහත්ථයති, ඇතු කෙරෙන් ඉක්මෙයි; නොහොත් ඇතු කාරණකොට ඉක්මෙයි; යන අර්ථ යි. "විසුද්ධයති" යනාදි තුන්තන්හි ණයප්‍රත්‍යය යි.

**ධාත්වර්ථප්‍රත්‍යයන් අනන්‍යකොට ඇත්තවුන්ගේ ක්‍රම යි.**

---


යං, යම් පදයෙක් තෙම; තිකාලං, (අතීත අනාගත වර්තමාන යන) කාලත්‍රයක් ඇත්තේ ද; තිපුරිසං, (ප්‍රථම මධ්‍යමෝත්තම යන) පුරුෂත්‍රයක් ඇත්තේ ද: ක්‍රියාවාචි, ක්‍රියාවක් ප්‍රකාශ කරන සුලු ද; තිකාරකං (කර්තෘ කර්ම භාව යන) කාරකත්‍රයක් ඇත්තේ ද; අත්තිලිඞ්ගං, තුන්ලිඟු නැත්තේ ද; ද්විවචනං,(එකවචන බහුවචන සංඛ්‍යාත) වචනද්වයක් ඇත්තේ ද; තං, ඒ පදය තෙම; ආඛ්‍යාතං ඉති, ආඛ්‍යාත නමැ යි; වුච්චති, කියනුලැබේ—

---

**විඤ්ඤලඞ්කාභිවිඤ්ඤ - සංඝෙ ා ව්‍යාතනොදිමාං විචෘතිම්**
**ලඞ්කායාං පශ්චිමදිශි - ශ්‍රීධර්මාරාමනායකස්ථවිරඃ —**

**- නිමි -**

# සබ්බ දානං ධම්ම දානං ජිනාති



නිබ්බාන පච්චයෝ හෝතු